


# ඉර පායා
# අඳුර දුරලා
# ආලෝකය විහිදුවාලූ
# අරිය උත්තමයාණෝ
# සොබා දහමේ පරම සත්‍යයට
# මඟ හෙළි පෑ අයුරු

වෛද්‍ය උපුලි අබේසූරිය

ඉර පායා

අඳුර දුරලා

ආලෝකය විහිදුවාලූ

අරිය උත්තමයාණෝ

සොබා දහමේ පරම සත්‍යයට

මඟ හෙළි පෑ අයුරු

වෛද්‍ය උපුලි අබේසූරිය

කර්තෘ ප්‍රකාශනයකි

වෛද්‍ය උපුලි අබේසූරිය

2018 ඔක්තෝබර්

මුද්‍රණය
සුරේන්ද්‍ර ග්‍රැෆික්ස් - මාතර
041 2227220

## පටුන

| | පිටු අංක |
|---|---|
| 1. පුණ්‍යානුමෝදනාව | 01 |
| 2. පෙරවදන | 02 - 05 |
| 3.වෙනස යුතුකම හා වගකීම | 06 - 17 |
| 4. පුනරාවලෝකනය | 18 - 62 |
| 5.මනුෂ්‍යත්වය හා බුද්ධත්වය | 62 - 85 |
| 6. බුද්ධ දේශය | 86 - 92 |
| 7. මග අමග | 93 - 125 |

## පුණ්‍යානුමෝදනාව

සියලුම දෙනාගේ සිත් තුලින්
අතිපූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර හිමිපාණන් වහන්සේට
සෙතක් ශාන්තියක්ම විහිදේවා !
උන්වහන්සේට නිරෝගී සුවයම අත්වේවා !

කිසිම කෙනෙකුගෙන් කිසිම ආකාරයක තම තමාට
නිවන ආවරණය වන ආර්යෝපවාදයක් නොමවේවා !

පින්වත් විලියම් හපුතන්ත්‍රී මහත්මා සහ ඇලිස් හපුතන්ත්‍රී මහත්මිය නම්
වූ, උන්වහන්සේගේ ගෞරවනීය දෙමාපියන් දෙපලට
මේ පොත උපහාරයක්ම වේවා !

එම පින්බර ප්‍රභූ දෙපලට වහ වහා නිවන් අවබෝධ වීමට
සියළුම පුණ්‍ය ශක්තිය හේතු වාසනා වේවා !

මාගේ මියගිය ස්වාමිපුරුෂයා, පියාණන්, මව ඇතුළු
සියළුම මියගිය ඥාතීන්ට
නිවන් අවබෝධ කර ගැනීමට
සියළුම පුණ්‍ය ශක්තිය හේතු වාසනා වේවා !

මනුෂ්‍යත්වයේ අගය වැටහී සෑම දිනකම,
සෑම මොහොතකම සියලුම දෙනාට
තම තමාගේ අවංක පිරිසිදු සිතින්ම
ඉටුකල යුතු යුතුකම් හා වගකීම වැටහේවා !



## පෙරවදන

මා නොදැන සිටි මනුෂ්‍යත්වයේ වටිනාකම මා දැනගත් පසු එහි සත්‍ය විස්තරය ආදර්ශයෙන් හා සාක්ෂි සමඟින් ඔබ සැමට දැන ගැනීමට අවස්ථාවක් සැලසීමේ පරමාර්ථයෙන්ම පරම දුර්ලභ මනුෂ්‍යත්ව පටිලාභයෙන් ඉහලම ලාභය ලැබූ අතිපූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර හිමිපාණන්ගේ චරිතාපදානයසහ යුග මෙහෙවර ලියා දැක්වූයෙමි.

උන්වහන්සේ පෙන්වා දෙන සත්‍ය උතුම් බුද්ධ ධර්මය පලමු වරට අසන සමහරුන්ට අළුත් බුද්ධාගමක්, අළුත් විස්තරයක් නැතහොත් තමා ඉගෙන ගෙන පුරුදු කරගත් බුද්ධාගමට වඩා වෙනස් ස්වරූපයක් ආදී වශයෙන් නොයෙක් සිතිවිලි ඇතිවිය හැක. මේ පොතින් මා ලියා දක්වා ඇති බුද්ධ ධර්මය ගැනවූ විස්තර සම්බන්ධයෙන් ද නුපුරුදු, නුහුරු ස්වරූපයෙන් බොහෝ ගැටළු සිතිවිලි ඇතිවිය හැක. ඒ අනුව තවදුරටත් විස්තර ඇසීම, කියවීම ප්‍රතික්ෂේප කරමින් කටයුතු කිරීමට ද සිතිවිලි ඇතිවිය හැක.

ගැටළු සහිත සිතිවිලි හමුවේ, ඉවසීමෙන් විමසීමෙන් විස්තර පැහැදිලිව අසා දැන හෝ කියවා තේරුම් ගැනීමට උත්සාහ කිරීමෙන් හෝ අසා දැනගත් ධර්ම කාරණා සත්‍යදැයි තමා තුලින් අත්දැකීමට ලක්කොට සොයා බැලීමෙන්, ආදී විමසීම් ස්වරූපයෙන්, කටයුතු කරන්නේ නම් ඔබට වටිනා යමක් සොයාගත හැකිවනු ඇත. එසේම තමාට හුරුපුරුදු පරිදිම, තමා දැන උගත් ස්වල්ප පරාසය තුලම රැඳී කිසිම විමසීමකින් තොරව නොසිතා කටයුතු කරන්නේ නම් ද්වේශ සිත් වලින් මෝහ සිත් වලින් රාග සිත් වලින් ඔබේ සිත කිලිටිවී මුවහ වී මේ මනුෂ්‍ය ජාතියේ වටිනාකම ආවරණය වනු ඇත. තවද මේ පොත ලියා දක්වන මමත් උන්මාද රෝගියෙක් ලෙස සිතිය හැක. උතුම් බුද්ධ ධර්මය කෙරෙහි, උතුම් ස්වාමීන් වහන්සේ කෙරෙහි අවිශ්වාස ඇතිවිය හැක.

විස්තර අසා සොයා බැලිය යුතු වටිනා කාරණයක් හෝ සුදුසු කාරණයක් හෝ මෙම පොතින් ලියා එලි දක්වා ඇති ලෙස ඔබට හැඟේ නම් එයද මාගේ උත්සාහය සාර්ථක වීමකි.

පිරිසිදු තේ රස කිසිදා නොදත් කෙනෙක් සමහර විට පිරිසිදු තේ රස පානය කර බැලූ දවසට එය ව්‍යාජ තේ ලෙස තීරණය කරමින් පිරිසිදු තේ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කල හැක. එසේම අසත්‍ය සත්‍ය ලෙස ඉගෙන ගෙන හැදින ගත් අය, රැවටීම සත්‍ය ලෙස පිළිගත් අය සත්‍ය එලි දැක්වූ දවසට සමහර පිරිසක් එම සත්‍ය බැහැර කොට පිලිනොගෙන සිටිය හැක. මනුෂ්‍යයන් ඔවුන් සතු ශක්තීන් හැකියාවන් මෙන්ම තම තමා සතු පෙර පුණ්‍ය ශක්තියද අනුව විවිධ වේ. මෙවැනි විවිධ මනුෂ්‍යයන් අතරින් නිවන් ලැබීමට පින් ඇති මනුෂ්‍යයන්ට මේ උතුම් බුද්ධ ධර්මය හමුවීම ධර්මතාවයෙන්ම සිදුවන්නකි. ඒ අනුව මා හටද මේ උතුම් බුද්ධ ධර්මය හමුවූ හැටි සැකෙවින් ලියා දක්වමි.

මා කුඩා කල පටන්ම බුදු දහමට නැඹුරුතාවක් තිබූ සැටි මගේ මතකයේ රැඳී ඇත. පාසැල් යාමට පෙර අවධියේ පවා “ලෝකෙන් උතුම් රට ලංකාවයි සිරි ලංකාවයි” යන ගීතය වාදනය වීමත් සමඟ මාගේ සිත මහත් සතුටින් පිනා ගිය හැටි මගේ මතකයේ රැඳී ඇත. එකල මා සිතා සිටියේ එසේ ගීතයෙන් වාදනය වනුයේ සත්‍ය ලෙසින් ලෝකෙන් උතුම් රට ලංකාව නිසාම බැවින් බවයි. පිටරට අය කොතෙක් පොහොසත් උවත් බුදුන්වහන්සේ අපේය. බුදුන්වහන්සේගේ අතීත කථා අපේ නිසා දුප්පත් මම පොහොසත් සිතින්ම, අභිමානවත්ව සිතින්ම සිතූ හැටි මට හොද හැටි මතකයේ ඇත.

බුදුන්වහන්සේ අයිති ඉන්දියාව යන රටට ලෙස දහම් පාසලෙන් මා උගත් පලමු දවසේ ම අනන්ත ව පුදුමයට පත්වූ සැටිත් එසේ සිදුවිය හැක්කේ කෙසේද ලෙස මා පැය ගනන් තනිවම කල්පනා කරපු හැටිත් අවසානයේ අවිනිශ්චිත සිතිවිල්ලකින් මා සිත සනසා ගත්තේ බුදුන්වහන්සේගේ විස්තරය සත්‍ය ලෙස දන්නා මනුෂ්‍යයන් දැන් ජීවත්ව නැති බවත් සිතමිනි. අවිනිශ්චිත සිතිවිල්ල, කාලයාගේ ඇවෑමෙන් පිලිතුරු ලැබිය හැකි ලෙසත් මාගේ අභ්‍යන්තර සිතේ තැන්පත් ව තිබූ සිතිවිල්ලයි.

මා වෘත්තියෙන් බටහිර වෛද්‍යවරියක් ලෙස මේ වනවිට අවු. 20 ක් පමණ සේවයේ යෙදෙමින් මනුෂ්‍ය ජීවිතයේ දුක යනු කිමැයි මා තුලිනුත් රෝගීන් තුලිනුත් අත්දකිමි.



පහුගිය අවුරුදු 20 පමණ වූ කාලයෙන් බොහෝ වේලාවක් ම සිතට පැමිණි සිතිවිල්ල වූයේ නිතර නිතරම මා සිතට එන දුකෙන් මිදීමට ඇති එකම ක්‍රමය නිවන් අවබෝධකර ගැනීම බවයි. ඒ අනුව බොහෝ බණ පොත් කියෙව් වෙමි. රේරුකානේ චන්ද්‍රවිමල හිමි ලියා දක්වා ඇති බණ පොත් සියල්ල කියෙව්වෙමි. අභිධර්ම පොත් කොතෙක් කියෙව්වත් කිසිම විටෙක හිතට වැටහෙන යමක් අවබෝධ කර නොගත්තෙමි. හුස්ම ගැනීම හා පිට කිරීම යන සම්මත ආනාපාන භාවනාව පුහුණු කිරීමට උත්සාහ ගත්තෙමි. එහෙත් විනාඩි 10 කට නොවැඩි කාලයක්වත් එම භාවනාව මට කල නොහැකි වූයේ හුස්ම රැල්ල පිළිබඳ සියළු දැනීම් ක්ෂණික නොදැනී මා අසංඥ තත්වයට පත්වන බැවිනි. තවද මා සතු කෙලෙස් කෙසේ බැහැර වන්නේ දැයි අභ්‍යන්තර හිතෙන් ප්‍රශ්න මතුවීමත් සිදුවූයේය. පිම්බීම හැකිලීම භාවනාව සුළු වේලාවක්වත් කල නොහැකි වූයේ ක්ෂණික මා අසංඥ වන බැවිනි. සක්මන් භාවනාව කරන්නට පටන් ගෙන ස්වල්ප වේලාවකින් කල්පනාවට එනුයේ මෙසේ සක්මන් කොට මට ලැබිය හැකි අවසාන ඵලය කුමක්විය හැකිද ලෙසයි. නිවන් අවබෝධ වන්නේ කෙසේද ලෙසයි.

නොයෙක් ගිහි පැවිදි පිරිස ලියා දක්වා ඇති පොත් පත් කියමින් කාලය වැය කරමින් නිවන් අත්පත් කර ගැනීමට ප්‍රමාණවත් සෑහීමටකට පත්විය හැකි දැනුමක් කිසිදා නොලද්දෙමි. අවසානයේ ධර්මධර හෝ භාවනානුයෝගීන් කොතෙක් හමු වූවත් ඔවුන් සියළු දෙනා තුලින්ම මා දුටුවේ ඔවුන් පරිහරණය කරන කෙලෙස් වල ස්වභාවයයි.

මේ අනුව මා තීරණය කලේ සත්‍යමවූ නිවන් මගක් අප රටෙන් මට සොයා ගැනීමට ඉතාම අපහසු තත්වයක් බවයි. සත්‍යම වූ ගුරුවරයෙක් සොයා ගැනීම තවත් අපහසු තත්වයක් බවයි. එහෙත් සත්‍යම වූ ගුරුවරයෙක් අවශ්‍යවූ මා කලේ අනුරාධපුර ජයසිරි මහ බෝ සමිදුන් අභියස සරල කිරිපිඩු පූජාවක් පවත්වා අධිෂ්ඨානයක් කිරීමයි. එනම් අප රටේ කොතැනක හෝ සත්‍ය නිවන් මඟක්, සත්‍ය ගුරුවරයෙක් ඇත්නම් මට හමුවේවා ලෙසයි. මාගේ ඒ පිරිසිදු අධිෂ්ඨානය ඒ ආකාරයෙන්ම බල ගැන්වී මා සෙවූ සත්‍යම ගුරුවරයාවූ මීවලපලානේ සිරි ධම්මාලංකාර ස්වාමීන්

වහන්සේත්, උන්වහන්සේ පෙන්වා දෙන සත්‍යම නිවන් මගත් මට හමුවීටම අවස්ථාව සැලසුනි. උන්වහන්සේ හමුවූ පලමු දවසේම මා අසා දැනගත්තේ තමන් මේ පිරිසිදු උතුම් බුද්ධ ධර්මය නිවැරදිව අසා දැනගෙන නිවැරදිව අනුගමනය කරන්නේ නම් තමා සතු ශක්තිය බලය අන් සියළු දෙනා අභිබවාජය ගන්නා බවයි. තමන්ගේ වැරදි නවත්වා මේ උතුම් ධර්මයට නැඹුරු වී තමන් නිසා හතර වරිගයම ගොඩ යන බවය.

තවද උන්වහන්සේගෙන් මා අසා දැනගත්තේ උතුම් බුද්ධ ධර්මයෙන් පෙන්වා දෙන්නේ කිසිම අමුතු දෙයක් නොවන බවය. අස්වාභාවික කටයුතු කරමින් ජීවත්වන මනුෂ්‍යයන්ට ස්වාභාවිකව කටයතු කරමින් ජීවත්වන අයුරු පෙන්වා දීමක් සිදුකරන බවයි.

වෛද්‍ය උපුලි අබේසූරිය



## වෙනස, යුතුකම හා වගකීම

අයිතිවාසිකම් හා ලාභ අපේක්ෂාවෙන් තොරව මනුෂ්‍යයන්ට තම තමා සතු යුතුකම හා වගකීම ඉටු කිරීමට සිතිය හැකි වීම හා ඒ අනුව කටයුතු කළ හැකි වීම  මනුෂ්‍යයා තුල සිදුවන වෙනස ලෙස පෙන්වා දිය හැකිය.

උන්වහන්සේ සිදුකල යුග මෙහෙවර පෙන්වා දීම යනු උතුම් බුද්ධ ධර්මය ඉස්මතු  කොට නිවන් මග පහදා දීමයි. එනම් දුකෙන් දුකට පත් වෙමින් සිටි මනුෂ්‍යයන් සුවෙන් සුවයට පත්වන අයුරු පෙන්වා දීමයි.

පෙර නොඇසූ විරූ පරම පවිත්‍ර සිරි සද්ධර්මය අසා දැන ගැනීමෙන් සෝතාවදානයේ පඤ්ඤා සුතමයේ ඥාණය අත්විඳ ගනී. එනම් අධ්‍යාත්මික වශයෙන් උසස් ඥානයකින් සත්‍ය අවබෝධයේ පිහිටිය හැකි වේ.

තමා සත්‍ය අවබෝධයෙන් ලත් උසස් ඥාණය ජීවතයේ සෑම මොහොතකම තමා තුලින් ක්‍රියාත්මක වෙමින් තම චිත්ත පාරි ශුද්ධියට මොහොතක් පාසා වෙනස්වන අයුරු අත් විඳ ගනී.

තමා තුළ වූ ජීවිත පුරුදු සහ මුලින්ම වෙනස් වෙමින් අලුත්ම පුරුදු තමා තුළ පුරුදු වන්නේ තමාටත් අනුන්ටත් සෙත සැලසෙන පරිදිම බව අත්විඳී.

තම තමා සතු පිරිසිදු උපේක්ඛා සිත පාදා ගැනීමට හැකි වීම යනු පරම පවිත්‍ර සිරි සද්ධර්මය අසා දැන නිවන් මග වැඩපිළිවෙල අනුගමනය කිරීමෙන් ජයග්‍රාහී ඵලයක් තමාට  උරුම වීමක් ලෙස අත්විඳ ගැනීමකි.

මේ අනුව සම්මත සම්ප්‍රදායක ගිහි පැවිදි දේශක පිරිස හෝ ගුරුවර, පාලක, නායක පිරිස හෝ දෙමාපිය වැඩිහිටි පිරිස හෝ අන් පිරිසට පිරිසිදු සිතින්, කාරුණික චේතනා තුලින් කටයුතු කළ යුතු යැයි

අවවාද අනුශාසනා කල හැක්කේ හුදු වචන ටිකකට පමණක් සීමා වීමෙනි. දේශක පිරිසට හෝ අසා සිටින පිරිසට හෝ කීකරු කමකින් හෝ අවවාදයකට ගරු කිරීමකින් හෝ පිරිසිදු සිතින්, පිරිසිදු චේතනා තුලින් කටයුතු කිරීමක් කල නොහැක්කේමය. ඒ සඳහා උතුම් බුද්ධ ධර්මය අසා දැන සත්‍ය අවබෝධයෙන් අළුත් පුරුද්දක් තමා තුළ ඇති කරගත යුතුය.

අසා දැන අත් දැක ගන්නා උතුම් බුද්ධ ධර්මය නිසා තමාගේ හෘද සාක්ෂියට එකඟවූ තමාටත් අනුන්ටත් සෙත සැලසිය හැක්කේ කෙසේද ලෙස සොයා බලා කටයුතු කිරීමට හැකියාවක් කෙනෙකුට අත් පත් වෙයි.

මේ අනුව කිසිවකුගේ මෙහෙය වීමක්, අණ කිරීමකින්, යටත් වීමකින් තොරව තමාගේ සත්‍ය අවබෝධය විසින්ම පෙන්වා දෙන තම තමා විසින් මැනවින් ඉටු කල යුතු යුතුකම හා වගකීම ඉටුකිරීමට තමන් කැමැත්තෙන්ම පෙළඹීම මෙහිදී සිදුවන වැදගත්ම වෙනසයි.

මුළු උතුම් බුද්ධ ධර්මයම පෙන්වා දෙනුයේ සත්‍ය අවබෝධයකින් තමාම නිවැරදි වීමක් පමණි.

ඒ අනුව තම තමා අන් අයට ආදර්ශයක් වන ලෙස කටයුතු කොට නිවැරදි මඟ පෙන්වීමක් තුලින් අන් අය නිවැරැද්දේ පිහිටුවීමට හැකියාවක් ලබන බව අත් විදගනී.

මේ අනුව දරුවන් නිවැරැද්දේ පිහිටවිය යුත්තේ දෙමාපියන් වැඩිහිටියන් වග කිව යුත්තන් පාලක පිරිස යන සියලු දෙනා ආදර්ශයේ පිහිටා කටයුතු කිරීමෙනි. ඒ අනුව එම සියලුම පිරිසට ආදර්ශයෙන් කටයුතු කරන්නේ කෙසේදැයි දැන ගැනීමට උතුම් බුද්ධ ධර්මය අසා දැන දැක ගතයුතු වේ.

මේ අනුව නිවන් මඟ අනුගමනය කොට නිවන අත්පත් කර ගත හැක්කේද තමාට පමණක් බවත් අන් අයට නිවන් අත්පත් කර දීමට තවත් කිසිම කෙනෙකුට හෝ බුදුවරයෙකුට පවා නොහැකි බවත් තේරුම් ගනී. කාරුණිකත්වයෙන්ම නිවන් මඟ පෙන්වාදීම පමණක් කළ හැකි එකම දෙය බවත් තේරුම් යයි.



මේ අනුව තම තමාගේ වැරදි නිවැරදි කර ගැනමටත් අන් අය නිවැරැද්දේ පිහිටුවීමටත් ඒ අනුව සුචරිත සමාජයක් බිහිකිරීමටත් ඇත්තේ එකම වැඩපිළිවෙලකි. එනම් උතුම් බුද්ධ ධර්මයේ හරය ගැබ්වූ සත්‍ය අවබෝධය මත පදනම් වන වැඩපිළිවෙලකට අපි පිලිවෙතින් පෙල ගැසීමෙන් බව අවබෝධ වේ.

සිතකට එක මොහොතක අරමුනු ගත හැක්කේ පිරිසිදු හෝ අපිරිසිදු සිතිවිල්ලෙන් එකක් පමණි. අපිරිසිදු සිතිවිල්ලකට කාරුණිකත්වයේ චේතනා  ගත නොහැකි සේම පිරිසිදු සිතකට අරමුනු වන්නේ කාරුණික චේතනාමය.

නිවන් මග අනුගමනය කරන පිරිස තම තමාගේ පිරිසිදු සිත පාදාගත් තරමට කාරුණික චේතනාවෙන් උපදින වගකීම දරාගෙන ජීවත් වීමට පුරුද්දක් ලැබ ගනියි.

තම තමාගේ සිත පිරිසිදු වන තරමට තමාගේ සිතිවිල්ල, වචනය, ක්‍රියාවට කාරුණිකත්වය, මෛත්‍රිය, මුදිතාව, උපේක්ඛාව ආදී මනුෂ්‍ය ගුණ ධර්මයන් වඩ වඩා තමා තුළ පිහිටනු අයුරු අත් විඳගනී.

ඉවසීම විමසීම නිවන් මගෙහි ආරම්භක පියවරයි. ඒ අනුව මෙතෙක් ගිනි ගනිමින්, අනේක අරමුණ වල විසිරෙමින් නා නා විධ තත්වයන්ට හිත පත් වෙමින්, හැඟීමට වහල් වෙමින්, ආශා පොදි බඳිමින් සැප සොයා යමින්, අනේක දුකෙන් මිදීමට අලුත් ක්‍රම සහ විධි සොයමින් සිටි තමන්ට බොහෝ විඩාවට, ක්ෂණිකව ලත් මහත් සුවයක් සේ තමා තුළ බිහිවන ප්‍රශ්න වලට විසඳුම් පැහැදිලි බව දැනෙන්නේය.

සතර අනුස්සති පුහුණු වී ධම්ම විනයට අනුව ඉවසීම විමසීම පුරුදු වීම නිසා සත්‍ය අවබෝධ කරගත හැකි සිතක් සකසා ගත හැකි බව අත්දකී. ඒ අනුව හැඟීමට වහල් වී කටයුතු කල වැඩ පිළිවෙලින් මිදීගොස් නුවනින් විමසා කටයුතු කළ හැකි බව තහවුරු වේ.

තමා සිතන, කරන, කියන දේ තෝරා බේරා ගැනීමට හැකියාවක්

අත්පත් වන බව අත්දකී.

දස අකුසලයේ ආදීනව දැකගනිමින් දස අකුසලයට තමා තුළ වූ කැමැත්තෙන් තමා මිදී නිදහස් වන බව අත්දකී.

සංසාර දුක උරුම වන ක්‍රියා , වදන් , සිතිවිලි වලින් ඉවත් වනුයේ ඒ මොහොතේ ම එහි ආදීනව දැක ගැනීමට හැකි වීමෙන්ම බව අත්දකී.

ඉවසීම, විමසීම සෑම මොහොතකම වර්ධනය වෙමින් තමාට සහනය උරුමවීම පුරුද්දකින්ම අත්පත් වන අයුරු අත් දකී.

මේ අනුව තමා තුළ ඉන්ද්‍රිය සංවරය, සංවර සීලය පිහිටවනු අයුරු අත් දැක ගනී.

සිතක දුක සැකසෙන හේතුව ලෙස මෙතෙක් කල් තමා තුළ වු වැරදි සිතිවිලි වල ස්වභාවය අත් දැක ගනී. තමාගේ සිතේ දුකට හේතුව කාගේවත් වරදක් හෝ කොතැනක හෝ පවතින දෙයක් නිසා නොවන බවත් තමාගේ පූරුවේ කරුමයක් සදා උරුමයක් ලෙස ලැබෙන දෙයක් නොවන බවත් තේරුම් ගනී. එනම් ස්වභාව ධර්මය නියාම ධර්ම වලට  අනුකූලව ක්‍රියාත්මක වන හැටි තේරුම්  ගනිමින් අත් දැක ගනී. එනම් අනිච්ච, දුක්ඛ, අනත්ත යන සත්‍ය අවබෝධයේ පිහිටා තේරුම් ගනී.

තමාගේ වරද තමාගේ සිත යලි යලි කිලිටි වීමට ඉඩ හැරීම බවත් එසේ කිලිටි වන්නේ හේතු ඵල පරම්පරාවට තමා කැමැත්තෙන්ම තමාගේ මිම්මෙන් සකස් කරගත් ප්‍රිය අප්‍රියතාවයෙන් බැදීම බවත් තේරුම් ගනී. එහි ඇත්තේ  වැරදි පුරුද්දක් පමණක් බවත් තේරුම් ගනී.

පුහුණු කරගත් සමත, විපස්සනා භාවනාවෙන් වහාම සිත පිරිසිදු කරගෙන ඒ ඒ දුක ඉපදීමට සැරසෙන තැනම දුකෙන් නිදහස් වීමට පුරුද්දක් තමා තුළ අලුතින් පිහිටන හැටි අත් දැක ගනී.

ඒ අනුව දුක, අලාභ, අයස, නින්දා, අපකීර්ති ආදී නොයෙක් අවස්ථා හමුවේ තමාගේ හිත කම්පනයට, පීඩාවට, අපහසුවට, කලකිරීමට, අසහනයට, දුකට  පත්වීමට අවස්ථා සැලසෙද්දී තමා පුහුණු කල අළුත්



පුරුදු නිසා සිදු වනුයේ වෙනසක් බව අත්දකී. එනම් අකම්පිත කාරුණික මෛත්‍රී සහගත අනුකම්පා සහගත, සමාව දීමට හා සමාව ගැනීමට හැකි ගුණයන් තමා තුළ ක්‍රියාත්මක වී තමාගේ හිත නිවෙන, සැනසෙන හැටි අත්දකී.

සැප හඹා යාම, ලාභයම සොයන චේතනාවල වැරැද්ද සත්‍ය අවබෝධයෙන්ම වටහා ගනී.  මෙතෙක් කල් විඳී සියළු දුකට හේතුව තමාට සැප, ලාභ ලැබෙන බව දන්වා  එන මුලාවේ මිරිඟුවට රැවටී මිරිඟුව පසුපස සංකාර කරමින් ගත් වෙහෙසම  බව අත් දකී. ඒ අනුව මොහොතක් මොහොතක් පාසා තමාට තවදුරටත් නොරැවටීමට සත්‍ය අවබෝධය ලැබෙන අයුරු අත් විඳ ගනී. මේ අනුව දුක පසුපස සංකාර කරමින් සිදු කරන වැරදි පුරුද්දෙන් ඉවත් වන හැටි තමා අත් දකී.

එලෙසම සංකාර වැරදි නම් කාර හෙවත් පිරිසිදු ක්‍රියාම නිවැරැදි බව තේරුම් ගෙන පිරිසිදු ක්‍රියා තුලම  සිත පිහිටුවා ගෙන කටයුතු කිරීමේ අලුත් පුරුද්ද තමා තුළ ක්‍රියාත්මක වන අයුරු අත්දකී.

කීර්ති, ප්‍රශංසා, නම්බු නාම හඹා යමින් තරඟ ජයග්‍රාහී ඉලක්ක වල මත් වී හොඳ නරක නොසොයා, යුතුකම් වගකීම් බැහැර කරමින් ආත්මාර්ථ කාමීත්වයෙන්ම කටයුතු කළ අඥාණ වැඩ පිළිවෙලවල් කෙතරම් මුලාවකින් සිදු වූවාක් ද ලෙස වැටහී යයි. එවැනි  වැරදි වලට ඇති කැමැත්ත සත්‍ය අවබෝධයෙන්ම දුරු වී යනු සැටි අත්දකී.

තවද වැරැද්ද වැටහෙනවා සේම නිවැරැද්දත් ඒ මොහොතේම වැටහී යාමෙන් පරාර්ථකාමී සිතුවිලි තමා තුළ වඩ වඩා වර්ධනය වන අයුරු අත්දකී.

මුළු උතුම් බුද්ධ ධර්මයේ හරය වූ අනිච්ච දුක්ඛ අනත්ථ යන ස්වභාව ධර්මයේ පරම සත්‍ය තමාගේ සිතේ ගුරු කොට පිහිටන අයුරු අත්දකී. ඒ අනුව තන්හා උපාදානයෙන් තමා තුළ වූ අස්වාභාවික වැඩ පිළිවෙලින් තමා නිදහස් වීම අත්දකී.

මොහොතක් මොහොතක් පාසා තමා තුළ ඉපදෙමින් ක්‍රියාත්මක වෙමින් පැවති දුක් උපදන උප්පත්තීන්ගෙන් නිදහස් වීමත් තමා සදහටම සංසාර දුකෙන් මිදී නිදහස් වීමට ළඟාවන අයුරුත් අත් දකී.

තමාට කොතරම් අවුල් සහගත, පීඩාකාරී අනේක විධ කරදර තමා ඉදිරියේ තමා වටා තමාම කොටුකර ගැනීමට සැරසෙද්දී තමාට කල හැකි කිසිවක් නැති වුවත් අරිය උපේක්ඛා සිතට සමවැදී සහමුලින්ම දුකෙන් තොරව සැනසිල්ලේ තමාගේ හිත පවත්වාගෙන සුවෙන් සිටිය හැකි බවත් උතුම් බුද්ධ ධර්මය අනුගමන කිරීමෙන් ලබන ඉහළම ඵලය බවත් තමාට වැටහේ.

නිවන් දැකීමට, නිවන් මග අනුගමනය කිරීමට මනුෂ්‍යයන්ගෙන් බොහෝ පිරිසක් අකමැති බව සැබෑවකි. එහෙත් එම සියළුම මනුෂ්‍යයන්ට ලෞකිකත්වය තුළ සතුටින්, සාමයෙන්, සැනසීමෙන් ජීවත් වීමට යහපත් සමාජයක් පැවතිය යුතු බව සැම දෙනාටම අවබෝධ වන සත්‍යකි. ඔවුන් සැම දෙනාටම පින් දහම් කර ගැනීමට අවස්ථාවන් තිබිය යුතු බවත් ඒ සඳහා තමා අනුගමනය කළ යුතු වැඩපිළිවෙලත් අවබෝධ වේ.

බුද්ධාගම ඒ අනුව ලෞකික සමාජ අවශ්‍යතාවක් බවත් උතුම් බුද්ධ ධර්මය නිවන් ලැබීමේ අවශ්‍යතාවක් බවත් වෙනස පහදා තේරුම් ගනී. බුද්ධාගම කවදා හෝ මනුෂ්‍යයන්ට නිවන් ලැබීමට උපකාරී වන සේ ක්‍රියාත්මක විය යුතු ආකාරයද තේරුම් ගනී.

බුද්ධාගම, දේශපාලනය, සංගීතය, කලාව, සංස්කෘතිය, සාහිත්‍ය, මනුෂ්‍යයන්ගේ අනේකවිධ ජීවිත අවශ්‍යතා සමාජ චාරිත්‍ර වාරිත්‍ර, විද්‍යුත් මාධ්‍ය, පුවත් පත්, පොත් පත්, අධ්‍යාපනය, රැකියා, වෙළඳ සබඳතා මේ ආදී අනේක විධ වැඩපිළිවෙලවල සෑම දෙයකටම බුදු දහමේ මූලික හරය, හේතුඵල සම්බන්ධය, ආශ්වාදයේ ආදීනව, සත්‍ය අවබෝධය යම් තරමකට හෝ ගැබ්කොට යලි නිවැරදි ආකාරයට සැකසිය යුත්තේ කෙසේද ලෙස තම තමාගේ යුතුකම තුලින් වැටහී යයි.



ස්වභාව ධර්මයට හානි සිදු නොවී සියළුම සත්වයාගේ හිත සුව පිණිස ස්වභාවික පරිසරය සුරකිමින් ජීවත් වන අයුරු තම තමාගේ යුතුකම වගකීම ඉටුකළ යුතු ආකාරයෙන් පැහැදිලි වන්නේය.

ගිහි පැවිදි දෙපිරිසගේම ආහාර, වාසස්ථාන, ඇදුම් පැළදුම්, බේත් හේත් යන සිවුපසටම සැහැල්ලු සරල චාම් ජීවිතයකට උපකාරී වන අයුරින් සකසා ගෙන ජීවත් වන අයුරු තම තමාට වැටහී යයි.

සංකර චාරිත්‍ර වාරිත්‍රවලින් මිදී බෞද්ධයන්ට ගැලපෙන චාරිත්‍ර වාරිත්‍ර රටාවක් තමාගේ අභ්‍යන්තරයෙන්ම උපදින හැටි තම තමා අත්දකී.

සියළුම මනුෂ්‍යයන් අතර වෙනසක් නොමැති බවත් ජාති කුලමල භේදවලින් මිදී අන්‍යෝන්‍ය සුහදත්වයෙන් කාරුණිකත්වයෙන් ජීවත් වන අයුරු තම තමාට වැටහී යන්නේය.

තමාගේ දරුවාත් අන් අයගේ දරුවාත් එකම කාරුණික ගුණයකට ඇතුලත් කොට තමාගේ දරුවාට දක්වන කරුණා ගුණය අන් අයගේ දරුවන් වෙතත් විහිදුවීමට හැකි ශක්තියක් තමා තුළ උපදින හැටි අත්විදියි.

කුඩා දරුවාගේ පටන් සියළුම මනුෂ්‍යයෝ අනේක විධ රෝගාබාධ වලට ගොදුරු වූයේ රාග, ද්වේෂ, මෝහ වලින් තුන්දොස් කිපීම බව අවබෝධ වේ.

ඒ අනුව නිරෝගී දිවි පැවැත්මකට රාග, ද්වේෂ, මෝහ ඉවත් කරමින් පිලිකා ආදී දුක්ඛිත රෝග වලින් තමා සුවපත් වන අයුරු අත්විදී.

රාග, ද්වේෂ, මෝහ බිහිවෙන වැඩ පිළිවෙලවල් අවම කොට රටේ ජනතාව නිරෝගී ජනතාවක් බවට පත් කිරීමට තම තමා කටයුතු කළ යුතු ආකාරය තමාගේ වගකීම තුලින් පැහැදිලි වේ.

මේ අනුව කුඩා දරුවාගේ පටන් සෑම මනුෂ්‍යයෙකුට මේ ලොව ඉගෙන ගෙන දැකගත යුතු වැදගත් දෙය නම් උතුම් බුද්ධ ධර්මයම බව පෙන්වා දෙමි. එනම් හේතුඵල දහම ඉගෙන ගැනීමයි.

පසුගිය අවුරුදු දහස් ගණනකින් යටපත් වී තිබූ උතුම් බුද්ධ ධර්මය යලි ඉස්මතු වීමෙන් ලොව සියළුම දෙනාට නැවත උදා වී ඇත්තේ මහත් අනගි අවස්ථාවක් බව සියළු දෙනාට අවබෝධ වේ. ඉතාම සූක්ෂ්ම ලෙසින් තම තමාත් ඒ අනුව මුළු සමාජයත් කිසිවෙකුගේ මෙහෙය වීමකින් තොරව නීතිගරුකව, ගුණගරුකව ඉතාම මානුෂීය ලෙස ස්වභාවිකවම වෙනස් වන අයුරු පෙන්වා දීමට මම උත්සහ ගතිමි.

නිවන් ලැබීමට කැමති වන්නේත් සුදුසුකම් ලබන්නේත් මනුෂ්‍යයන්ගෙන් සුළු පිරිසක් වුවත් සියළුම සත්වයන්ට සෙත සැලසීමට සුළු මනුෂ්‍ය පිරිසකට වුවත් හැකි බව අත්දැක ගනී. එනම් ඔවුන්ගෙන් විශ්වයට විහිදෙන පිරිසිදු අධිබල සුදු කිරණ ශක්තියෙන් බ්‍රමණ වේගය පාලනය කරමින් සියළු සත්වයාට ජීවත් වීමට සුදුසු පරිසරයක් බිහිකිරීමට හැකි බව අවබෝධ වේ.

එහෙත් සමහරු අන් අය නිවන් දකිනවාට කොහෙත්ම කැමති නැත.

උතුම් බුද්ධ ධර්මය බිහිවන්නේත්, අවබෝධ වන්නේත් ඒ අනුව පැතිරෙන්නේත් කිසිවෙකුගේ අනුග්‍රහයකින් හෝ උදව්වකින් හෝ බලපෑමකින් හෝ පිහිටකින් හෝ කිසිවකින් නොවන්නකි. නියාම ධර්ම වල ධම්ම නියාමය අනුවම ක්‍රියාත්මක වීමකි. හේතු ඵල දහම ක්‍රියාත්මක වීමකි. එනම් ලෝකෝත්තර පුන්‍ය ශක්තිය පිරීම යන හේතුවට නිවන යන ඵලය උරුම වීමකි.

එලෙසම තවත් වැදගත් කාරණාවක් මේ තුලින් අවබෝධ වේ. එනම් උතුම් බුද්ධ ධර්මය ප්‍රතික්ෂේප කිරීම, යටපත් කිරීම, විකෘති කිරීම, හිංගි හිංසා කිරීම, නිදහසේ පැතිරෙන බුද්ධ ධර්මය නවතාලීමට නන් අයුරින් උත්සහ කිරීම, නොදන්නා සේ රඟපෑම, නානා අධිපතිකම් පැවැත්වීම, අන් අයට ධර්මය පැතිරීමට තිබූ අවස්ථාවන් සහමුලින්ම නවතා දැමීම, නිවන් මග අනුගමනය කරන පැවිදි පිරිසට පන්සල්වල ජීවත් වීමට අපහසුතා ඇති කිරීම, බණ කීමේ නිදහසට බාධා කිරීම, බණ දේශනා කරන පිරිසට ජීවිත බය ඇතිකිරීමට උත්සහ කිරීම, බණ අසන පිරිස බය



ගැන්වීම, සත්‍ය බුදු බණ අසත්‍ය බව කියමින් මනුෂ්‍යයන් රැවටීමට උගුල් ඇටවීම, උතුම් බුදු බණ අසත්‍ය ලෙස පෙන්වා දීමට සංවිධාන බිහිකර ගෙන තිබීම, තර්ක විතර්ක, අධිපතිකම් තුලින් පාලක පිරිසට බලපෑම් කිරීම, මනුෂ්‍යයන්ට ආරවුල් ගැටුම් ඇතිවනසේ මනුෂ්‍ය සිත් කුපිත කිරීම ආදී අද වර්තමානයේ අප රට තුළ ක්‍රියාත්මක වන අනේක විධ උත්සාහයන් හෙවත් පාප ක්‍රියා තුල ඇත්තේ කම්ම නියාමයම බවත් පෙන්වා දෙමි. ඒ අනුව ඔබ සැමට සිතීමට තම තමාට උරුම වන ඵලය තේරුම් ගැනීමට උතුම් බුද්ධ දේශනාව සරල කොට පෙන්වා දෙමි. සියලුම පාප ක්‍රියාවලට උරුම වනුයේ පාපයේ තරමට බලවත් වන අනන්ත දුක් විපාකම බව කම්ම නියාමයෙන් පෙන්වා දෙමි. නියාම ධර්ම බුදුන් වහන්සේටත් වෙනස් කල නොහැක්කක් බවත් නියාම ධර්ම වලට හේතු බිහි නොකර දුකින් මිදිය හැකි බවත් බුද්ධ දේශනාව බව පෙන්වා දෙමි.

මෙසේ පාපයේ ආදීනවය ඔබට තේරුම් ගැනීමට නොහැකි වී ඇත්තේ රාග, ද්වේෂ, මෝහ මලකඩ තට්ටුවලින් ඔබේ සිත මුවහ වී ඇති බැවිනි. පාපයට ඇති හිරි ඔතප් බිඳ ගැනීමට ඒ අනුව සියළු පාප වැඩ බුද්ධාගමේ නාමයෙන්, බුදුන් වහන්සේගේ නාමයෙන් වසන් කරමින් තම තමාගේ සිත තම තමාටම කරනුයේ වංචාවකට හසුකොට තමාගේ සිත සාධාරණී කර ගැනීමකි.

ඒ අනුව සියළු වැරදි වැඩ කිරීමට හැකියාවක් ශක්තියක් ඇති කර ගැනීමකි. සියළුම පාප වැඩ කාට සාධාරණීකරණය කර ගත හැකි වුවත් අකුසල් සිතින් (රාග, ද්වේශ, මොහ සිත්වලින්) කරන සියල්ල සංකාරම බව පෙන්වා දෙමි. මේ සියලු සංකාර අනිච්ච බව එනම් තමාගේ කිලිටි චේතනාව අනුව ක්‍රියාත්මක නොවන බව සබ්බේ සංකාරා අනිච්චාතී යන බුද්ධ දේශනාවෙන් පෙන්වා දෙමි.

සියළු සංකාර කොට සැප ලැබේ යැයි සිතා කටයුතු කලත් සියළු සංකාර වලට දුක උරුම වේ යන සබ්බේ සංකාර දුක්ඛාති යන බුද්ධ දේශනාව පෙන්වා දෙමි.

සියළු පාපී චේතනා වලින් බලාපොරොත්තු වන සැප මායාවක්

බවත් සබ්බේ ධම්මා අනත්ථාතී යන බුද්ධ දේශනාවෙන් පෙන්වා දෙමි.

තවද උතුම් ස්වාමීන්වහන්සේ කින්ති සූත්‍රය දේශණා කරමින් අප නොදන්නා ඉතාම වැදගත් කරුණු ඉතාම කරුණාවෙන් අපට පෙන්වා දෙන සේක. එනම් බුදු පියාණන් වහන්සේ නිවන් මඟ අනුගමනය කිරීමට කැමති, පුබ්බේතකත පුණ්‍යතා ශක්තියක් ඇති පිරිසටම බුදු බණ දේශනා කර ඇති බවයි. එම පිරිසට උභතෝභාග විමුක්තියම එනම් ලෞකික, ලෝකෝත්තර සෙත සැලසෙන පරිදි සියළුම ලාභ අපේක්ෂාවෙන් තොරව නිස්සරණ අධ්‍යාසයෙන්ම ධර්මය දේශනා කළ බවයි. ඒ අනුව එම ආදර්ශය බුදු බණ දේශනා කිරීමට අනුගමනය නොකලොත් තමාගේ නිවන ආවරණය වන හැටි තේරුම් ගැනීමට හැකිවී තිබේ.

නැතහොත් බුදු බණ දේශනා කිරීමෙන් පසු අනේක විද පිරිකර, ලාභ සත්කාර හෝ මුදල් එකතු කිරීම මගින් දේශක පිරිසට උරුම වනුයේ දුක උපදවන මහත් ආදීනවයක් බව තේරුම් ගෙන එවැනි කටයුතු වලින් මිදී ක්‍රියා කිරීමට තමා තුල අවබෝධය ඇති වේ.

තම තමාගේ ජීවිත කාලය තුළ හෝ වර්තමාන මොහොතේ හෝ තමා පුරුදු කරගෙන ඇති අකුසල් වැඩ පිළිවෙලවල් වල යම් වැරැද්දක් ඇති බව කිසි ලෙසකින් කෙනෙකුට වැටහෙන්නේ නැතිනම්, තෝරා බේරා දෙද්දී පිළිගැනීමට සූදානම් නැත්නම් ඒ ඔවුන් සතු ලෝකෝත්තර පුණ්‍ය ශක්තියක් නොමැති නිසාය. ඒ ඒ හැම දෙනාගේම සිත් කිලිටි කෙලෙස් වලින් වැඩී ගොස්ය. මෝහාන්ධකාරයේ ගිලී ගොස්ය. ඒ හැම දෙනාගේම දහම් ඇස පෑදී, ලෝක අඳුර දුරු වී අලෝක තත්වයට පත් වනුයේ කවදා හෝ මේ පිරිසිදු පරම පවිත්‍ර සිරි සද්ධර්මය අසා දැන තේරුම් ගත් පසුවය.

සියළුම බුදුන් වහන්සේලා කවදා කිනම් සක්වලක පහල වුවත් දේශනා කරන්නේ එකම මාගධී ශබ්ද සංඥාවලින් එකම උතුම් පරම පවිත්‍ර සිරි සද්ධර්මයයි. තවමත් ලත වෙවී කටයුතු කරන සියළුම මනුෂ්‍යයන් තුල ඇත්තේ අනන්ත දුක් විඳිමට තන්හා උපාදානයෙන් කටයුතු කිරීම පමණක්ම බවත් වෙන කිසිම සැපක් උරුමවන, සුවයක් ලබන, හරයක් නොමැති තමා අනාථ වීම පමණක් සිදුවන බවත් සියළුම දෙනාට අනන්ත කරුණාවෙන් පෙන්වා දෙමි.



සියළුම සත්වයාගේ සෙත සැලසීමට අපගේ පිනට මේ ලොව පහල වී ඇති උතුම් කල්‍යාණ මිත්‍රයන් වහන්සේ දේශනා කරන උතුම් බුදු බණ ප්‍රතික්ෂේප කරන ඔබේ සිතේ ඇති කිලිටි චේනනාව සහ එම කිලිටි චේතනාවලට මොහොතක් මොහොතක් පාසා අති භයංකාර සංසාරයේ ඔබට උරුම වන ආදීනව ඔබ සැමට වැටහේවා! ඔබ සැමගේ සිතේ ක්‍රියාත්මක වන ආශ්වාද උගුල ඔබ සැමට වැටහේවා.... මේ මනුෂ්‍ය ජාතියේ අගය ඔබ සැමට වැටහේවා!

උතුම් බුද්ධ ධර්මය අනුගමනය කිරීමෙන් තමාටත් මුළු ලෝකයටත් ලැබෙන සුවය, සැනසීම, වෙනස මට කවදාවත් ලියා නිම කොට දැක්විය නොහැකි අනන්තයකි.

පිරිසිදු කාරුණික සිතින්ම අවසාන වශයෙන් මා පෙන්වා දෙන්නේ දැන්වත් අපි අපේ වැරැද්ද තෝරා බේරා ගැනීමට, වැරැද්ද නිවැරදි කර ගැනීමට නිහතමානී විය යුතු බවයි. එනම් පළමුකොට තමන් කිනම් තරාතිරමක හිටියත් මෙතෙක් අනුගමනය කළ හෝ දැනගත් දැනුම් සම්භාරය තුල හෝ තමා අත් විඳගත් නිවනක් නොමැති බව තමාගේම හෘද සාක්ෂියට අනුව තේරුම් ගත යුතු වේ. එනම් තමාගේ නොදන්නා කම අවංකව තේරුම් ගත යුතු වේ.

අපි මනුෂ්‍යත්වයක ඉපදුනේ සංසාර ණය ගනුදෙනු සහමුලින්ම බේරුම් කොට නිමා කර නැවත කිසි ලෙසකින් ණය නොවීමටය. සංසාර ණයකට බැදෙන්නේ අපේ සිතේ ඇති රාගය, ද්වේශය, මෝහය නිසාය. මෙතෙක් අපි සංසාරයේ දුක් වින්දේ සංසාර ණය ගනු දෙනුවෙන් මිදී නිදහස් වීමට කටයුතු කලයුතු ආකාරය නොදන්නාකම්නි. අයිතිවාසිකම් හා ලාභ අපේක්ෂා අතහැර පිරිසිදු සිතින්ම තම තමාගේ යුතුකම හා වගකීම ඉටු කිරීමෙන් ගත් ණය ගෙවා දැමීමටත් තව දුරටත් පිරිසිදු සිතින් ජීවත් වීම තුළ අලුතෙන් ණය නොවී සිටිය හැකිවන අයුරුත් පෙන්වා දීම උතුම් බුද්ධ දේශනාවම වේ.

ඒ අනුව නොදන්නාකමින් මෙතෙක් සිදුවු හා තවදුරටත් සිදු වෙමින්

පවතින වැරදිවල විපාක වැරැද්දේ භයංකාරත්වය හඳුනාගනිමු.

තව දුරටත් දැන දැනම වැරදි කිරීම මහත් අපරාධයක් බව තේරුම් ගනිමු. ජීවත් වන කෙටි කාලය තුල අප අපගේ වගකීම සියලු සත්වයන්ට ඉටු කිරීමට පිරිසිදු සිතින්ම දායක වෙමු.

නොදන්නා දේ දැනගනිමින් වැරදි හදා ගැනීමටත්, නැවත වැරදි සිදු නොවන්නට කටයුතු සැලසීමටත් හැකි අනගි අවස්ථාවක් මේ වර්තමානයේ උදා වී ඇති බව මහත් අවධානයෙන්, වගකීමෙන් තේරුම් ගනිමු.

මේ සඳහා ඉවසා විමසා කටයුතු කල හැකි යම් තාක් පිරිසිදු මොල ඇති මනුෂ්‍ය පිරිස සතු ඉහළම වගකීම මෙයම බව ඉතා කාරුණික සිතින් පෙන්වා දෙමි. කිලිටි සමාජ රැල්ලේ දූෂණ කථා, රඟපෑම්, බලපුළුවන්කාරකම්, බුදු දහමේ අයිතිවාසිකම් වලට හසු නොවී පරීක්ෂණය, නිරීක්ෂණය, නිගමනය තුලින්ම කටයුතු කල යුතු බව පෙන්වා දෙමි.

උතුම් බුද්ධ ධර්මයට සියළු අනුග්‍රහ දක්වා තවදුරටත් ලෝකයේ සියළු දෙනාට සෙත සැලසීමට හැකි බව තේරුම් ගනිමු.

ඒ අනුව ලෝකෙන් උතුම් රට ලෙස බැබළවීමට, ගෞරවාදරයට පත් වීමට තවමත් අපිට හැකි බව තේරුම් ගනිමු.

මේ අනුව උතුම් බුද්ධ ධර්මය කුමක්ද? කොහිද ලෙස සොයා බැලීමට සියළු දෙනාටම සිත් පහළ වේවා!

උතුම් බුද්ධ දේශයේ පර්යාප්ති බුද්ධ ශාසනය හෙවත් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන මග ඵල වලට පත් වෙන ධම්මානු ධම්ම පටිපදාව යලි බුද්ධ දේශයේ ඉස්මතු කර විහිදුවාලීමට ඔබ සැමට සිත් පහල වේවා ! එසේ පහල වන සිත් වලින් ලෝකෝත්තර පුණ්‍ය ශක්තිය ඔබ සැමට අත්වේවා ! ඒ අනුව මේ වර්තමානයේ උතුම් නිවන් මග අනුගමනය කොට ඔබ සැමට සංසාර දුකින් මිදීමට හැකිවේවා ! හැකිවේවා ! හැකිවේවා ! සාදු ! සාදු ! සාදු !



## පුනරාවලෝකනය

මෙහි ලියා දක්වා ඇති කරුණු සියල්ලම අතිපූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර නාහිමිපාණන් වහන්සේගෙන් පසුගිය අවුරුදු 07ක් පුරාවට මා අසා දැනගෙන, උන්වහන්සේ ලියා දක්වා ඇති පොත් පත් කියවා තේරුම් ගෙන, එසේ අවබෝධ කරගත් කරුණු අත්දැකීමට ලක්කරමින් මා අත්විඳගත් දේ අනුව උන්වහන්සේ පෙන්වා දෙන නිවන් මග ගැන ලියා දක්වන විස්තරයකි, සත්‍යාව ලෝකනයකි.

මම මේ පොතින් ලියා දැක්වීමට උත්සාහ කරන විස්තරය සත්‍යම වූත් නොදන්නා කෙනෙකුට පුදුමය උපදවන්නා වූත් සොයා බලා කටයුතු කරන්නෙකුට මනුෂ්‍යත්වයක් ලබා සාක්ෂාත් කරගත හැකි සහ කර ගත යුතු, ඉහලම ජයග්‍රහණය ලබාගත හැකිවන්නා වූ නිවන් මග කියා දෙන දේශකයාණන් වහන්සේ කෙනෙක් ගැන හා නිවන් මගක් ඇති බව පෙන්වා දීමට කරන විස්තරයක් බව ඉතාම අවංකවමත්, ඉතාම සත්‍යවාදීවත් ඉතාම නිර්භයවත් ඔබ සැමට පවසා සිටිමි.

මෙම පොත කියවන සියළුම දෙනාගේ පිරිසිදු සිත් පෑදී, ලෝකෝත්තර පුණ්‍ය ශක්තිය උදාවී මෙහි ලියා දක්වා ඇති විස්තරය විමසීමකට ලක්කොට තම තමාගේ සෙත සලසා ගැනීමට මෙම ග්‍රන්ථය උපකාරයක් වේවා!

ගෞතම බුද්ධ ශාසනය තවත් බොහෝ කාලයක් පවතින ප්‍රඥා බුද්ධ ශාසනයක් බවත් ඒ අනුව එකම මග ඵල ලාභි ආර්යයන් වහන්සේ කෙනෙක් හෝ වැඩ වාසය කරන තුරු නිවන් දකින බුද්ධ ධර්මය සදහටම යටපත් වී යෑම කිසිදා සිදුවිය නොහැක්කක් බව උන් වහන්සේ දේශනා කරන සේක.

ගෞතම බුදුන් වහන්සේගේ ප්‍රඥා බුද්ධ ශාසනය සදහටම යටපත් නොවී යලි ඉස්මතු කරමින් දිගටම පවත්වාගෙන යනු ලබන්නේ සුදුසු කාලවල පහලවන මහා ප්‍රඥා අරහතුන් වහන්සේලා විසිනි.

මහා ප්‍රාඥ අරහතුන් වහන්සේලා අතීතයේ මේ හෙලබිමේ බිහිවී ඇත. උන්වහන්සේලා සත්‍ය උතුම් බුද්ධ ධර්මය දේශනා කොට නිවන් මඟ හෙලිකරදීම සිදුකර ඇත. එසේ උතුම් බුද්ධ ධර්මය යටපත් වීමට නොදී යලි ඉස්මතු කරන ලද්දේ පලවෙනි දෙවෙනි, තෙවෙනි ධර්ම සංඝායනා පැවැත්වීමෙනි.

ගෞතම බුද්ධ ශාසනය තවම අවසන් වී නොමැති බැවින්ද, අතීතයේ දීර්ඝ කාලයක පටන් නිවන් දකින සත්‍ය බුද්ධ ධර්මය යටපත්ව ගොස් වැසී ඇති බැවින්ද, යලිත් හතරවෙනි ධර්ම සංඝායනාවක් පැවැත්විය හැකි මහා ප්‍රාඥ අරිහතුන් වහන්සේ නමක් හෙලබිමේ බිහි විය යුතුය.

එවැනි මහා ප්‍රාඥ ස්ථවිරයන් වහන්සේ නමක් මේ හෙලබිමෙන් බිහි වී "පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු" නම් පෙර නොඇසූ විරූ පරම පවිත්‍ර සිරි සද්ධර්මය දේශනා කරන සේක. යටපත්ව තිබූ උතුම් බුද්ධ ධර්මය ඉස්මතු කරමින්, චතුඅරිය සත්‍යය යලි පණ පොවමින්, නිවන් මඟ හෙලි කරමින්, මේ හෙලබිමේ යලි බුද්ධ දේශය බිහිකරමින්, මහඟු සෙතක් සලසමින් අප හෙලබිමේ වර්තමානයේ වැඩ වාසය කරමින් සිටින සේක.

එසේ වැඩ වසමින් සිටින අති පූජ්‍ය, අති ගෞරවනීය, අති ශ්‍රේෂ්ඨ, අති උතුම් මීවනපලානේ සිරි ධම්මාලංකාර නාහිමිපාණන් වහන්සේ ගැනත් නිවන් මගක් ඇති බව ගැනත් ඔබ සැමට දන්වා සිටීමට උන්වහන්සේගේ චරිතාපදානය සහ යුග මෙහෙවර මට හැකි පමණින් මෙසේ ලියා දක්වමි.

සිරිලක බෞද්ධ රටකි. සියළුම බෞද්ධයන් සංසාරයේ කෙදිනක හෝ නිවන් දැකීමට කැමතිය. අප රට සියළුම වැසියන් දුක යනු කිමැ යි සෑම මොහොතකම මනාව අත්දැක මනාව අවබෝධ කරමින් සිටින දෙයකි. දුකෙන් සදහටම මිදීමට නිවන් අවබෝධ කර ගත යුතු බව දන්නා අප රට බොහෝ බෞද්ධයෝ බුදු බණ සොයති. බුදු බණ ලෙස සිතා රට පුරා සිටින ගිහි පැවිදි පිරිසගෙන් නොයෙක් මාදිලියේ බණ අසති. ඒ අනුව බෞද්ධයෝ බොහෝ දාන, සීල, භාවනා වැඩසටහන් වලට සම්බන්ධ වෙමින්, පින් රැස් කිරීමට කටයුතු කරමින් නිවන් ලබාගැනීමට කැප වී ඇත.



රටපුරා පැතිරී ඇති බොහෝ පන්සල්, භාවනා මධ්‍යස්ථාන, අති විශාල ලෙස ගණනින් ලියවී ඇති ධර්ම පුස්තක, බණ කියන බොහෝ ගිහි පැවිදි ගුරුවර පිරිස, බණ අසන බොහෝ පිරිස ආදී මේ සියළුම සුලභ තත්වයන් තිබියදී කිසිවෙකුත් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් ඵලවලට පත් නොවෙති.

අප රට ජීවත්වන සියළුම මනුෂ්‍යයන් අඥාණයන් විය නොහැක. දුසිල්වත් ද විය නොහැක.

බුදුන් වහන්සේ බුදු බණ දෙසද්දී සුනීත, සෝපාක වැනි අසරණයන් පවා සෝවාන් ඵලයට පත් වූහ.

බුදුන්වහන්සේ දේශනා කොට ඇත්තේ නිවන් දැකිය හැකි, අපට අනුගමනය කලහැකි සරල, සුගම ප්‍රතිපදාවක් බවට මේ අනුවත් අපට සාක්ෂි සමගින් වටහා ගත හැක.

එසේ නම් වර්තමාන බෞද්ධයන්ට නුවනින් විමසා අවබෝධ කර ගත යුතු වැදගත් කාරණයක් මෙහි ගැබ් වී ඇත.

එනම් නිවන් අවබෝධ කරගැනීම උදෙසා අප අනුගමනය කරන මේ බුද්ධාගමෙහි යම් වැරද්දක් ඇති බවත් උතුම් බුද්ධ ධර්මය යනු මේ බුද්ධාගම නොවන බවත්ය.

එසේ නම් සත්‍ය උතුම් බුද්ධ ධර්මය සොයා දැන ගැනීමට කටයුතු කිරීම යුගයේ අවශ්‍යතාවයක් වුවත්, බෞද්ධයෝ බොහෝ වැරදි වැඩ පිලිවෙල තුල ඉතා දැඩි ලෙස එල්බ ගෙන කටයුතු කරනුයේ කිසිම සත්‍ය අත්දැකීමකින් තොරවය.

වර්තමානයේ උතුම් බුද්ධ ධර්මය ලියා දක්වා ඇති සත්‍ය සටහන් දුර්ලභය. සත්‍ය උතුම් බුද්ධ ධර්මය ලියැවී ඇති මාගධී පදවැල්වල පරිවර්තන අර්ථයේ සත්‍ය, අසත්‍යතාව ගැන සොයා බැලීමකින් තොරව අප රට පුරා බොහෝ බෞද්ධ කටයුතු සිදු කෙරේ.

අප රට තුල ක්‍රියාත්මක වන බුද්ධාගමේ උරුම කරුවන්, ආධිපත්‍යය දරන්නන්, දේශපාලන බලවතුන් ආදී විවිධ පිරිසගේ විවිධ වූ අවශ්‍යතා වලට අනුව අප රට පුරා බුද්ධාගම ක්‍රියාත්මක වේ.

දුකෙන් මිදීමට නිවන සොයන බෞද්ධයෝ නිවන යන්නෙන් සත්‍ය වශයෙන්ම බුදුන් වහන්සේ දේශනා කලේ කුමක්ද ? කියා නොදනිති. නිවන උගන්වන දේශක පිරිසත් නිවන යනු කුමක් දැයි විග්‍රහ කිරීමට නොදනිති.

සියළුම සම්මා සම්බුදුවරයාණන් වහන්සේලා ස්වයං භූ ඥාණයෙන්ම අවබෝධ කරගන්නා උතුම් බුද්ධ ධර්මය දේශනා කරනුයේ මාගධී බසින් බවවත් බොහෝ බෞද්ධයෝ නොදනිති. මාගධී භාෂාවද කිසිවෙක් නොදනිති.

එසේම පාලි භාෂාව, සංස්කෘත භාෂාව ගැනද බොහෝ පිරිසක් නිවැරදිව නොදනිති. පාලි, සංස්කෘත භාෂා වලින් ලියා දක්වා ඇති බුදු බණ වල පරිවර්තන අර්ථයේ සත්‍ය අසත්‍යතාව කිසිවෙක් නොදනිති.

ගිහි පැවිදි පිරිස අදහන විශ්වාශකරන බුද්ධාගම තුලින් අත්වන නිවන කුමක්දැයි කිසිවෙකුත් නොදනිති.

පවතින සම්මත මහායානික බුද්ධාගම තුල ඇත්තේ නිවනට විරුද්ධ වැඩ පිළිවෙලට කොටු කිරීම පමණක් බැවින්, නිවන ගැන ඇති සියළුම විග්‍රහ මිරිඟුවක වැනි රැවටීමක් බව උන්වහන්සේගේ දේශනාවලින් පැහැදිලි වේ.

නිවන යනු මේ මනුෂ්‍ය ජාතියේ අත් කරගත නොහැකි, පින් දහම් කර, පාරමිතා පුරා ලැබෙන ඉතාම අපහසු ඉලක්කයක් ලෙස බොහෝ දෙනාගේ සිත් තුල මුල් බැස ගෙන ඇති නිසා නිවන් අත් කරගත් උත්තමයෙකු ඇත යන පුවත ඇසීමට පවා බොහෝ දෙනා මැලිවෙති. එය මායාවක්, හාස්‍යයක් සේ බොහෝ දෙනෙකුට හැඟෙන බැවින් සම්මා සම්බුදුවරයාණන් වහන්සේලා, මහා ප්‍රාඥ අරහතුන් වහන්සේලා අප රට



තුළ පහල වූවත් උන්වහන්සේලා බොහෝ පිරිසකට හඳුනාගැනීමට නොහැකිය. හඳුන්වා දීමටද ඉතා අපහසුය.
මෙය කෙතරම් අභාග්‍යක්ද ?

එහෙත් මේ ගෞතම බුද්ධ ශාසනයේ එවන් උත්තමයන් වහන්සේලා අප රට තුල පහලවනුයේ නිවන් අවබෝධ කරගැනීමට සමත් පින් ඇති බොහෝ මනුෂ්‍යයන් පිරිසක් අප රට තුල ඉපදී ඇති බැවිනි.

මෙසේ පහල වන බුද්ධ පුත්‍රයන් වහන්සේලා හෙවත් උත්තම කල්‍යාණ මිත්‍රයන් වහන්සේලා, අප රට පින් පිරූ සියළු මනුෂ්‍යයන්ට හඳුන්වා දීමට සියළු උත්සාහයන් ගැනීමට මා හට සිතෙනුයේ ඔවුන් කෙරේ පැතිරෙන අනන්ත වූ කරුණා ගුණයකිනි.

බුද්ධාගම උගන්වන ගිහි පැවිදි පිරිස තම තමන් උගන්වන, දේශනා කරන ධර්මය බණ ද, බහ ද ලෙස වෙන් කර හඳුනා ගැනීමට නොදනිති. බණ යනු බව නසන ධර්මයයි. (බ+ණ) බ" යනු බිහි කිරීමේ ශක්තිය (කෙලෙස් බව) යන්නයි. න" යනු නසන යන්නයි. එනම් සත්‍ය උතුම් බුද්ධ ධර්මයයි. බහ (බ+හ) යනු බිහි කිරීමේ ශක්තිය හදන හෙවත් බව(කෙලෙස් බව) හදන කර්මයයි. එනම් සංසාර දුක උරුම කරගනිමින් අනන්ත සංසාරයේ අතරමං වීමයි.

බිහි කිරීමේ ශක්තිය සහ මුලින්ම උදුරා දමා පලමුව තමන් නිවන් අත්විඳ අන් අයටත් නිවන් මඟ දේශනා කරන උතුමන් යැයි බහට රැවටී මනුෂ්‍යයෝ බහ අසමින් කල් මරති. ඒ අනුව තව තවත් සංසාරයේ අතරමං වෙවී නිවන් යැද යැද, වැදුම් පිදුම් යාගහෝම කර කර කල් මරමින්, දුක් විඳ විඳ ජීවිතගෙවා දමමින් වර්තමාන මනුෂ්‍යයෝ මහා විපතක පැටලී ඇත.

ශල්‍ය වෛද්‍යවරයෙකු බිහිවනුයේ විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙකු යටතේ පුහුණු වීමෙන් මිස මහාචාර්ය හෝ කථිකාචාර්යවරයෙකුගේ දේශනා අසා නොවන්නාක් මෙන් නිවන් අත් විඳගන්නට නම් පළමුව තමා නිවන් අත්පත් කර ගත් උතුම් කල්‍යාණ මිත්‍රයෙකුගෙන්, උතුම් බුද්ධ

පුත්‍රයෙකුන්ගෙන්ම උතුම් බුදු බණ අසා දැන ගෙන ඒ අනුව කටයුතු කල යුතුවේ.

රාගය, ද්වේශය, මෝහය සහ මුලින්ම සිතකින් ඉවත් කිරීමෙන් නිවන් අත්වන බව වර්තමාන අප රට වැසියන් දැන සිටියත් රාගය, ද්වේශය, මෝහය සිතකින් සහමුලින්ම ඉවත් කල හැක්කේ කෙසේද යන්න කිසිවෙක් නිවැරදිව දන්නේ නැත.

රාගය, ද්වේශය, මෝහය තම තමන්ගේ සිතින් ඉවත් කර ජීවත් වන්නේ කෙසේද යන්නත්, එසේ කරන්නේ කුමකටද යන්නත්, සිතීමට අපහසුවන ලෙසින් පෘතග්ජන මනුෂ්‍යයන්ගේ සිත් කෙලෙස් වලින් මත්වී මෝහයෙන් වැසී ඇත. ඒ නිසා මනුෂ්‍යයන්ගේ අධ්‍යාත්මික ශක්තිය පිරිහී ඇත.

වර්තමානයේ ලෝකය තුල ක්‍රියාත්මක වන විද්‍යාවේ විශාල සංවර්ධනය යනු මනුෂ්‍ය සිත් උපරිමයට රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් මත්වී කටයුතු කිරීමට අවස්ථාව සලසා තිබීමයි.

අඩුම වශයෙන් සෝවාන් ඵලයටවත් පත් නොවූ කිසිම පෘතග්ජන පුද්ගලයෙකුට මනුෂ්‍ය සිතකින් රාගය, ද්වේශය, මෝහය සහමුලින්ම උදුරා දමන ක්‍රම වේදයක් හෝ වැඩ පිළිවෙලක් පෙන්වා දිය නොහැකි බව උන්වහන්සේ පවසා ඇත.

ලොවුතුරා බුදුවරයන් වහන්සේලා මෙන්ම බුද්ධ ශ්‍රාවක මහා ප්‍රාඥයන් වහන්සේලා ලොව පහලවී උන්වහන්සේලාගේ මුළු ජීවිත කාලය පුරාම ඇප කැපවී උතුම් බුද්ධ ධර්මය දේශනා කරමින් පහදා දෙන එකම කාරණය සිතකින් රාගය. ද්වේශය. මෝහය සහමුලින්ම උදුරා දමා නිවන අත්පත් කර ගන්නා වැඩ පිලිවෙලයි. ක්‍රම වේදයයි. ධම්මානුධම්ම පටිපදාවයි.

මේ උතුම් පටිපදාව බුදු නුවනින් සොයා දැන මනුෂ්‍යයාට පහදා දෙනුයේ මනුෂ්‍යයා විසින් අනිවාර්යයෙන් පලමුව අසා දැන අනුගමනය කොට නිවන අත් විඳ ගත හැකි සරල පැහැදිලි ක්‍රම වේදයක් ලෙසයි. මෙසේ විග්‍රහ කර දෙන උතුම් බුද්ධ ධර්මය මනුෂ්‍යයා විසින් අසා දැන,



පැහැදිලි දැනුමක් ලබා ගෙන, අසා ගත් දැනුම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම තුලින් නිවන අත් විඳගත යුතු වේ.

එහෙත් වර්තමාන අප රට බෞද්ධයෝ පිරිසිදු බුද්ධ ධර්මය නොදන්නා කමින් බුද්ධාගම නැමැති ඇදහිල්ලක පැටලී සදා සැනසෙන නිවනක් සොයනුයේ මහා කාන්තාරයක අතරමං වූවෙකු පිපාසයට දිය බිඳක් සොයන්නා සේය. නැතහොත් අසරණ රෝගින් ව්‍යාජ වෙදදුරන් ගෙන් රෝගයට බෙහෙත් අසා දැන ගන්නා සේය.

උතුම් බුද්ධ ධර්මයෙන් සම්පූර්ණයෙන් බැහැර වී කිසිදා නිවන අත් නොවන බොහෝ වැඩ පිළිවෙලින් සෑදුනු බුද්ධාගම නැමති ඇදහිල්ල තුල සිරවී ඇති සියළුම පාලක නායක පිරිසත්, බලගතු වගකිවයුතු ගිහි පැවිදි පිරිසත්, උගත් නූගත් පිරිසත්, දුප්පත් පොහොසත් පිරිසත්, යන සියළුම දෙනා පැටලී ඇත්තේ එකම උගුලකය. එනම් සංසාර දුක නැමති ඇම ගිලින උගුලෙහිය.

මෙම සංසාර උගුලෙහි පැටලි ඇති සියළුම මනුෂ්‍යන්ට මනුෂ්‍ය කනක් ලැබීමෙන් ඇසිය හැකි ඉහලම පණිවිඩය නම් තම තමා පැටලි ඇති උගුලෙන් සදා නිදහස් වීමට හැකි ක්‍රම වේදයක් ඇති බව දැන ගැනීමයි. එනම් බුදුන් දෙසු පරිදිම වු පරම පවිත්‍ර සිරි සද්ධර්මයක් ඇති බව දැන ඉගැනීමයි.

පරම පවිත්‍ර සිරි සද්ධර්මය දේශනා කරන උතුම් මනුෂ්‍යය රත්නයක් මේ සිරිලක වැඩ වාසය කරයි නම් මෙතෙක් දීර්ඝ සංසාරයේ සිට අතරමං වෙමින් සිටින සිරිලක් වැසියන්ට අනන්තවු සැනසිමක් උරුම වනු ඇත.

ගෞතම බුදුපියාණන් වැඩ සිටි සමයේ හෝ මහා කච්චායන වැනි මහා ප්‍රාඥ අරහතුන් වහන්සේලා වැඩ සිටි සමයේ හෝ මිහිඳු මහ අරහතුන් වහන්සේ වැඩ සිටි සමයේ හෝ ඔබ ජීවත්ව සිටියා නම් ඔබ කටයුතු කරන්නට සිතන්නේ කෙසේද?

එවැනිම අවස්ථාවක් මේ වර්තමානයේ අපට නැවත උදා වී ඇත්නම් සිතීමට අවස්ථාවක් ඔබට ලැබී ඇත. එනම් අති පූජ්‍ය මීවනපලානේ සිරි

ධම්මාලංකාර ස්වාමීන්වහන්සේ විසින් එවැනි අවස්ථාවක් නැවත අපට උදා කර දී ඇත.

අතීතයේ වැඩ විසූ මහා අනුරුද්ධ, මහාකච්චායන, මහා කොට්ඨියාන, මහා සැරියුත් යන මහා ප්‍රාඥයන් වහන්සේලා සේම උන්වහන්සේද දේශනා ප්‍රාතිහාර්‍යය පාන සේක.

සිරි + ධම්ම + අලංකාර ලෙසින් වූ උන්වහන්සේගේ නමේම උන්වහන්සේ කවරෙක් දැයි විස්තර වී ඇත.

සිරි යනු බුද්ධ යන පදයට සමාන වචනයකි. බුද්ධ යනු බිහි කිරීමේ ශක්තිය (බව දුක) සහ මුලින්ම උදුරා දැමූ උත්තමයා වේ.

ධම්ම යනු සත්‍ය උතුම් බුද්ධ ධර්මය වේ.

අලංකාර වනුයේ බුද්ධ ධර්මය සිව්පිළිසිඹියා පත් නුවනින් හෙවත් අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන ස්වරූපයෙන් ඉතා පැහැදිලිව සරලව ඉතාම නිවැරදිව විග්‍රහ කර දෙමින් අනුශාසනා ප්‍රාතිහාර්ය පාන බැවිනි.

උන්වහන්සේ අතීතයේ මහා අරහතුන් වහන්සේලා පැවැත්වූ ධර්ම සංගායනාව කුමක් දැයි දේශනා කරමින් හතරවෙනි ධර්ම සංගායනාව පවත්වන සේක.

මෙමගින් දීර්ඝ කාලයක් පුරා යටපත්ව වැසී තිබූ උතුම් බුද්ධ ධර්මය නැවත වරක් ඉස්මතු කර උන්වහන්සේ අපට නිවන් මග ඉතා සරලව පැහැදිලිව විග්‍රහ කර දෙන සේක. මනුෂ්‍යයන්ට නිවන මේ මනුෂ්‍ය ජාතියේම අත් කර ගත හැකි පහසු තත්වයක් මිස මනුෂ්‍යයන්ට අවබෝධ කර ගත නොහැකි, පහසුවෙන් අත් විඳ ගත නොහැකි, නිවනක් බුදුන් වහන්සේ කිසිදා දේශනා කොට නොමැති බව උන්වහන්සේ දේශනා කරන සේක.

මෙතෙක් කාලයක් සංසාර උගුලේ පැටලී දුක් විඳි සියළුම මනුෂ්‍යයන්ගේ බලාපොරොත්තුව කවදා හෝ උතුම් බුද්ධ ධර්මයක් ඇසීමට අවස්ථාවක් ලැබීමයි. වර්තමානයේ සංසාර දුකෙන් හෙම්බත් වී උතුම් නිවන සොයන සිරිලක් වැසියන්ට මෙතරම් වටිනා පණිවුඩයක් තවත් නොමැතිය.



උන්වහන්සේ දේශනා කරන පරිදි මුළු බුද්ධ ධර්මයම සංඝායනාවකි. (සංදේශනාවකි)

සං පද හතරකින් විග්‍රහ වන සංදේශනාව යනු පටිච්ච සමුප්පාද ධර්මයයි.

සංදේශනාව යනු කුමක්දැයි නොදැන, සත්‍ය බුද්ධ දේශනාව තේරුම් ගත නොහැකි බව උන්වහන්සේ දේශනා කරන සේක.

මිහිඳු මහ අරහතුන් වහන්සේ චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කොට සංගායනාවක් හෙවත් සංදේශනාවක් සිදු කර ඇති බව උන්වහන්සේ පෙන්වා දෙන සේක.

ජන්බුද්වීපා ඉධාගතා ලංකාපුර” යන පාඨයෙන් දැක්වෙන්නේ ජන්බුද්වීපයේ රජ ගහ නුවරින් උතුම් බුද්ධ ධර්මය ඉගෙන පුහුණු වී මග ඵලවලට පත්වූ මිහිඳු හිමි ලංකාපුරය හෙවත් අනුරාධපුරයට වැඩම වූ බවයි. එවකට අනුරාධපුර රාජධානියේ බුද්ධ ධර්මය පිරිහෙමින් පැවති යුගයකි. මෙකල මිහිඳු හිමි දේශනා කල චුල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් විග්‍රහ වන්නේ ඇතෙකුගේ උපමා උපමේයකින් පෙන්වා දෙන සංදේශනාවයි.

ඇතෙකුගේ පාද හතරින් මුළු ශරීරයේම බර දරා සිටින්නා සේ සංපද හතරකින් මුළු උතුම් බුද්ධ ධර්මයම පෙන්වා දුන් බව උන්වහන්සේ විග්‍රහ කරන සේක.

සංදෙස්සේති, සංමාදපේති, සංඋත්තේජේති, සංපහන්සේති යනුවෙන් පෙන්වා දෙන්නේ එම සංපද හතර හෙවත් ඥාණ පද හතර වේ.

මේ අනුව උන්වහන්සේද සංපද හතර විග්‍රහ කරදී මුළු උතුම් බුද්ධ ධර්මයම පැහැදිලි කර දෙමින් සංඝායනාව හෙවත් සංදේශනාව තුලින් නිවන් මඟ පැහැදිලිව අපට පෙන්වා දෙන සේක.

සත්‍ය නිවන් මගක් නොමැති කමින් අනන්ත සංසාර දුකෙහි ගිලී සිටි මනුෂ්‍යයාට සදා සැනසීමට සදා දුකෙන් මිදීමට හැකි මගක් ඇති බව

පෙන්වා දෙන උන්වහන්සේ මනුෂ්‍යයන්ට ලබාදෙනුයේ මහා කළ්‍යාණ මිත්‍ර සම්පත්තියයි.

මීවනපලානේ සිරිධම්මාලංකාර හිමිපාණන් වහන්සේ යනු මුළුලොව සියළුම මනුෂ්‍යයන් වහ වහා දැනගත යුතු සියලුම දෙනා අනන්ත ගෞරවයෙන් බණ ඇසිය යුතු අනුබුදු නමින් පිදුම් දිය යුතු, උපහාර දිය යුතු, අනන්ත වටිනාකමකින් රැකිය යුතු වර්තමානයේ මේ හෙලබිමේ වැඩ සිටින මුළු ලොවෙන්ම උතුම්ම මනුෂ්‍ය රත්නය යැයි මට සිතෙයි.

රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් තොර උන්වහන්සේ අතිශය නිහතමානි බැවින්ද, අන්‍යයන් කෙරෙහි අතිශය කාරුණික බැවින්ද උන්වහන්සේ කවරෙක් දැයි ලොවට හඩ ගා කීමට උන් වහන්සේ කිසි ලෙසකින් කටයුතු නොකරන සේක.

කෙලෙස් වලින් අන්ධ බොහෝ මනුෂ්‍යයන්ට උන්වහන්සේගේ සත්‍ය විස්තරය අදහාගත නොහැකි තරම් පුදුම සහගතය. එවැනි සිදුවීමක් වර්තමානයේ ලොව සිදුවිය නොහැකි දෙයක් ලෙසින්ද අවිශ්වාස සිතුවිලි වල මනුෂ්‍යයන් දැඩි සේ එල්බගෙන ඇති බැවින්ද උන්වහන්සේ සතු මගඵල උන්වහන්සේ ප්‍රකාශ නොකරන සේක. බොහෝ මනුෂ්‍යයන්ගෙන් තම තමාගේ නිවන වැසී යන සේ සිදුවිය හැකි ආර්යෝපවාද වීම වැළැක්වීම උන්වහන්සේගේ කාරුණික සිතුවිල්ලයි.

නිවන් අවබෝධ කර ගැනිමට උපකාරි වන බුද්ධ ධර්මයේ ඇති නිවැරදි වැඩ පිළිවෙලත්, සංසාරයේ අතරමං වීමට හේතුවන අද පවතින බුද්ධාගමේ ඇති සාවද්‍ය වැඩ පිළිවෙලත් දෙකම ඉතා පැහැදිලිව තෝරා බේරා දී උන් වහන්සේ අපට පෙන්වා දෙන්නේ සදහටම දුකෙන් මිදී නිවන් සුවයෙන් සුවපත් වීමට මේ මනුෂ්‍ය ජාතියේම අපට හැකි බවයි.

තවද මහා සතර සතිපට්ඨාන සූත්‍රයේ අවසානයේ සඳහන් පරිදි, උන්වහන්සේ තව දුරටත් විග්‍රහ කර දෙන්නේ නිවැරදි බුද්ධ ධර්මය අසා, දැනගත යුතු දැනුම ලැබූ පසු කෙනෙකු අවංකව, අධිෂ්ඨානශීලිව කැප වීමෙන් එම දැනුම ප්‍රායෝගිකව අත්දැකීමකට ලක්කිරිමෙන් සෑම මොහොතකම කටයුතු කරන්නේ නම් දින 7ක අවම කාලයකින් හෝ අවුරුදු



හතක උපරිම කාලයකින් උතුම් නිවනේ අනාගාමී ඵලයට හෝ අරිහත් ඵලයට පත්වීමට කෙනෙකුට හැකිවන බවයි.

උන්වහන්සේ සතු සිවුපිළිසිඹියාපත් නුවණින් අනුශාසනා ප්‍රාතිහාර්ය පෑම යනු කෙනෙකුට සිතාගත නොහැකි තරම් පුදුම සහගත ආශ්චර්යමත් සිදුවීමකි.

උන්වහන්සේ නිවැරදිව හඳුනාගත් කෙනෙකුට සිතෙනුයේ මනුෂ්‍ය මනසක් කොතරම් ආශ්චර්ය ජනකද ? කොතරම් අද්විතියද ලෙසයි. වර්තමානයේ කොතරම් දියුණු පරිගණකයකට වත් උපරිමයට පිරිසිදු මනුෂ්‍ය මනසක හැකියාව කවදාවත් ලබාගත නොහැකි බව වැටහී යයි.

උන්වහන්සේගෙන් බුද්ධ ධර්මය අසා දැනගත් පසු අපට වැටහෙනුයේ අප සියළු දෙනා තුලත් එවැනි හැකියාවක් සැඟවී පවතින බවයි. මේ උතුම් බුද්ධ ධර්මය ලෝකෙන් ගිලිහී යාමෙන් මනුෂ්‍යයාට මනුෂ්‍යයාගේ අගය නොවැටහී යාමට හේතුවීම මොනතරම් අභාග්‍යක්ද? අපරාධයක්ද ලෙසයි.

උන් වහන්සේගේ ලොව පහලවීම තවමත් නොදන්නේ වැඩිම සෙතක් උදාකොට ගත හැකි වන්නා වූ මනුෂ්‍යයන් අතරින් තවත් විශාල මනුෂ්‍ය පිරිසක්ය. එහෙත් නිවන් මග අනුගමනය කරන සියලුම සම්‍යක්දෘෂ්ඨික දෙව් දේවතාවෝ මේ පුවත දනිති. උන් වහන්සේ පරම පවිත්‍ර උතුම් බුදධ ධර්ම දේශනාව ආරම්භයේදී සමන්තා චක්ඛ වාලේසු අත්‍රා ගච්ඡන්තු දේවතා යන පාඨය සම්පූර්ණයෙන්ම තෙවරක් දේශනා කොට සියලුම දෙව් දේවතාවුන් වහන්සේලාට ආරාධනා කරනුයේ මුනි රාජයෙන් වහන්සේ දෙසූ පරිදිම වූ කාලෝ හෙවත් කෙලෙස් නසන බණ ඇසීමට දිව කන හා දිව්‍ය ඥාණය මනුස්සා වේසුං ලෙස හෙවත් මනුෂ්‍ය ස්වරූපයේ කනකට හා මනසකට පරිවර්තනය කරගෙන උතුම් බුද්ධ ධර්මය ශ්‍රවණය කිරීමට පැමිණෙන ලෙසයි.

මෙසේ දේවතා ආරාධනාවෙන් පසු පැමිණෙන සම්‍යක් දෘෂ්ඨික දෙව් දේවතාවෝ අමුතුවෙන්ම මනුෂ්‍ය කන් මනුෂ්‍ය මනස සකසා ගෙන පැමිණ උතුම් බුදුබණ අසා සෙත සළසා ගනිද්දී උපතින්ම හිමි මනුෂ්‍ය කන් හා

මනුෂ්‍ය මනස හිමි මනුෂ්‍යයෝ උතුම් බුදු බණ පවතිද්දී එය නොඇසීමට හේතුවන අකුසලයෙන් බැහැර විය යුතුය.

සියලුම පින් යදින අමනුෂ්‍යයෝද උන් වහන්සේ මනුෂ්‍ය ලොව වැඩ වසන පුවත දනිති. සියයුම අමනුෂ්‍යයෝ තම තමාගේ මනුෂ්‍ය ඥාතින්ගෙන් බලාපොරොත්තු වනුයේ දැන් දැන්වත් උන් වහන්සේගෙන් උතුම් බුදුබණ අසා දැන කටයුතු කොට ඒ අනුව නිවැරදිව පින් අනුමෝදන් කොට ඔවුන්ටත් එම බුදුබණ ඇසිමට හැකිවන සේ කටයුතු කිරීමට ඔවුන්ගේ එම දුක්ඛිත ආත්ම වලින් මුදවන ලෙසයි.

ගහකොළ සතා සිවුපාවා ඇතුළු මුලු පරිසරයම උන් වහන්සේගේ ලොව පහලවීම දැනගන්නා සේය. මුළු පරිසරයම විශාල වශයෙන් සැනසෙන්නේ නම් ඒ උන් වහන්සේ නිසාය.

විද්‍යාවේ අතිවිශාල සංවර්ධනයකින් මනුෂ්‍ය මොළ මේ තරම් විනාශ වූ යුගයක් අතීතයේ කවර හෝ බුදුන් වහන්සේලා වැඩ සිටි සමයක පැවතියාදැයි අපට සිතාගතවත් නොහැක. එහෙත් වර්තමානයේ විද්‍යාවේ සංවර්ධනය යනු රාගයේ, ද්වේශයේ, මෝහයේ අති විශාල වර්ධනයයි. භෞතික විද්‍යාවේ සංවර්ධනයක් සමග සිදුවනුයේ අවිද්‍යාවේ අන්ධ බවකි.

රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් මත්වීමත් සමග සිදුවන මනුෂ්‍ය කටයුතු තුලින් පරිසරය විශාල වශයෙන් දූෂණය වී පරිසර විපත් දිනෙන් දින වර්ධනය වන බව අප සියලුම දෙනාට මනාව වටහාගත හැක.

එසේ පරිසර දූෂණය උත්සන්න වීමෙන් වර්ෂ 2012 දෙසැම්බර් මාසයේ සිදුවීමට නියමිතව තිබූ මහා පරිසර විපතක් කලින්ම දුටු උන්වහන්සේ එය වලකාලිමට හෝ විපත් අවම කිරීමට කටයුතු කළ ආකාරය මුළු පරිසරයම දැන සිටියත් ඒ බව මනුෂ්‍ය ලොව බොහෝ පිරිසක් තවම නොදනිති. සිදුවීමට නියමිතව තිබූ මහා පරිසර විපතෙහි සියලු තතු හැකි සෑම අයුරින්ම බණ අසන ලක්ෂ සංඛ්‍යාත පිරිසට දැන්වූ උන් වහන්සේ එය වළක්වාලීමට කටයුතු කළ යුතු ආකාරයද මනාව පෙන්වා දුන් සේක.

නිවන් දැකිමට පින් ඇති තවත් බොහෝ මනුෂ්‍ය පිරිසක් මනුෂ්‍ය



ලොව සිටින බව දුටු උන්වහන්සේ තවත් කාලයකට මේ පරිසරය රැක ගැනිමට සිදුකළ මෙහෙය අප සියලු දෙනාම දැනුවත් වීම වත් අප සැමගේ යුතුකමකි.

පඨවි, ආපෝ, තේජෝ, වායෝ වලින් සෑදුණු පරිසරය විනාශ කිරීමට මෙන්ම යහපත් කිරීමට පිරිසිදු කිරීමට හැක්කේද මනුෂ්‍යයාට බව උතුම් බුද්ධ ධර්මය තුලින් උන් වහන්සේ පහදා දෙන අයුරු අසා දැනගත යුතු වෙයි.

උන් වහන්සේ විග්‍රහ කරදෙන බුදු බණ ඇසිමෙන් අපට අවබෝධ වනුයේ අප මේ ලබා ඇති මනුෂ්‍ය ජාතියේ අනන්ත වටිනාකමයි.

මහා දන් පින්කම් කරන්නට කිසිම මුදලක් තමන් සතු නොවුනත් කොතරම් අග හිගකම් මැද ජිවිත පැවැත්ම ගෙවන්න සිදුවුනත් ජිවිතයේ කොතරම් අවහිර බාධක හමුවුනත් තමන්ගේ හිත කිසිම දුකකට පත් නොවන, කම්පාවට පත් නොවන ශාන්ත වූ සැනසිලිදායක වූ කම්පාව වෙනුවට විශාල නිරාමිස සුවයක් අත්විඳ ගත හැකි වන්නා වූ උදාරතර ජිවිතයක් ගෙවන්නට හැකියාවක් අත්පත්කර ගැනීමට උන් වහන්සේගේ මග පෙන්වීම අනුව අපට හැකිවේ.

කිසිම මුදලක් වස්තුවක් වැය නොවුනත් අමුතුවෙන් කියා කාලයක් වෙන්කොට නොගෙන තම තමාගේ ජිවිත පැවැත්ම තුළම සිදුකරන සියලුම කටයුතු තුල බුදුන් වහන්සේ දේශනා කළ පරිදි නිවැරදිව හිත පිහිටුවා කටයුතු කිරිම තුලින්ම ලබන මහා සෙතක් උන් වහන්සේ මුළු උතුම් බුද්ධ දේශනාව තුලින්ම අපට පහදා දෙන සේක.

ත්‍රිපිටකය, පිරිත් සූත්‍ර දේශනා ඇතුළු පාලි භාෂාවෙන් ලියා ඇති උතුම් බුදුබණ වල මාගධී බසින් බුදුන් වහන්සේ දේශනා කළ සත්‍යම අර්ථය, අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන යන සිවුපිලිසිඹියාපත් ශක්තියෙන් නිවනට උපකාරී වන ලෙසින් උන් වහන්සේ විග්‍රහ කරදෙන අයුරු අනුශාසනා ප්‍රාතිහාර්යක්මය. නානා අර්ථ තුළ ඇති අදහසත් ලෝක පැවැත්ම හෙවත් ලෞකික පැවැත්ම තුළ ඇති අදහසේ වැරැද්දත් නිවැරදිව නිවනට උපකාරීවන ලෙස බුදුන් වහන්සේ දෙසු අර්ථයත් උන් වහන්සේගේ සිරි මුඛයෙන් දේශනා කරද්දී අසන්නෙකුට පුදුම හිතෙන්නේ

උන් වහන්සේ මෙසේ ධර්මය දේශනා කරන්නේ කෙසේද ලෙසයි. උන් වහන්සේ ගේ ගුරුවරයා කවුද? පරිශීලනය කළ පොත්පත් මොනවාද ලෙසයි.

උන්වහන්සේගේ ධර්ම දේශනාවක් අසන පින් ඇති සියලු දෙනාගේ එවැනි පුදුමය මොහොතකින් නැතිවී යන්නේ උන් වහන්සේ කවරෙක්දැයි මනාව පසක් වන බැවිනි.

බුද්ධ දේශනාවේ ඕනෑම තැනක සඳහන් ඕනෑම මාගධි පද පෙලක් උන් වහන්සේගෙන් විමසා දැනගත හැක. ඕනෑම සූත්‍ර දේශනාවක් හෝ මාගධි පද පෙලක් ගැන කෙනෙක් උන් වහන්සේගෙන් විමසූ විට උන් වහන්සේ එය විග්‍රහ කර දෙන්නේ බුදුන් වහන්සේ කවදා කොතැනක කවුරුන් අරඹයා එය දේශනා කලේද එහි අර්ථය කුමක්ද ලෙස ඉතා සරලවත් ඉතා පැහැදිලිවත්වය.

උන් වහන්සේ මාගධී පදවැල්වල ගැබ් වී ඇති අර්ථය ලිහා දක්වා විග්‍රහ කරන විට එය අසා සිටින ඕනෑම කෙනෙකුට මහා පුදුමයකුත් මහා සැනසීමකුත් සම්පූර්ණයෙන් ම හිත සෑහීමකට පත්වීමකුත් ඇතිවී අවසානයේදී උන් වහන්සේ කෙරෙහි ඒ මොහොතේම අති මහත් ගෞරවයකුත් චිත්ත ප්‍රසාදයකුත් ඇතිවේ. සිතකට අතිමහත් පුදුමයක් දැනෙනුයේ මෙතෙක් කල් තමා දැන සිටි වැරදි අර්ථය නිසා තමා කොතෙක් මං මුලාවූ බව වැටහීමෙනි.

උන්වහන්සේ මේ උතුම් බුද්ධ ධර්මය අවබෝධ කර ගැනිම සඳහා දැනට ගිහි පැවිදි පිරිස ලියා දක්වා ඇති කිසිම පොතක් පතක් පරිහරණය කොට නොමැත.

දිනක් පින්වතකු උන් වහන්සේගෙන් ඇසුවේ උන්වහන්සේගේ ගුරුවරයා කවරෙක්ද? කළ්‍යාණ මිත්‍රයා කවරෙක්ද ලෙසයි. එවිට උන් වහන්සේ පිළිතුරු දෙමින් ප්‍රකාශ කලේ මීට පෙර පහල වූ බුදුවරයන් හත් නමකින්ම බුදු බණ අසා සිතෙහි ධාරණය කරගත් බවයි. ඒ අනුව නියත විවරණ ගත් බවයි. මේ මනුෂ්‍ය ජාතියේ ජාත සෝතාපන්න හෙවත් සෝවාන්



ඵල ලාභියෙක් සේ උපන් බවයි.

උන්වහන්සේ අතීත බුදුවරු හත්නමක් ඉදිරියේදීම නියත විවරණ තුලින් අධිෂ්ඨාන කොට ඇත්තේ පහත සඳහන් ලෙසය.

ගෞතම බුදුන්ගේ බුද්ධ කල්පය තුළ බුද්ධ දේශයේ උතුම් බුද්ධ ධර්මය අවුරුදු දහස ඉක්මවා යන කාල වකවානුවකින් යටපත් වී යද්දී නිවන් දැකීමට පින් ඇති බොහෝ මනුෂ්‍ය පිරිසක් ඉපදී ඇතිනම්, බුද්ධ ශ්‍රාවක මහා ප්‍රාඥයන් වහන්සේ කෙනෙකු සේ බුද්ධ දේශයේ බිහිවීමයි.

ඒ අනුව මේ උතුම් බුද්ධ ධර්මය අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන ස්වරූපයෙන් විග්‍රහ කොට සිවුපිළිසිඹියා පත් නුවණින් අනුශාසනා ප්‍රාතිහාර්ය පා යටපත්ව වැසිගිය උතුම් බුද්ධ ධර්මය යලි ඉස්මතුකොට උතුම් බුද්ධ දේශය යලි ස්ථාපිත කොට තවත් අවුරුදු සිය ගණනකට බුද්ධ දේශය හා උතුම් බුද්ධ ධර්මය සුරක්ෂිත කරමින් සියලුම සත්වයන්ට මහා සෙතක් සැලසීමයි.

උන්වහන්සේ ගේ ගුරුවරයා උන් වහන්සේ බුදුවරු හත් නමකින් අසා දැන ධාරණය කරගත් උතුම් බුද්ධ ධර්මයයි.

එසේ ධර්මය දැනගෙන හා දැකගෙන උන් වහන්සේ සෝවාන් ඵලයට පත්වී ඇත්තේ මීට අවුරුදු 2500 කට පමණ ඉහත ගෞතම බුදුන් දවස සමන රජ සමයේදීය.

සෝවාන් ඵලයට පත්වූ කෙනෙකු ධම්මේ හවේ රක්ඛති ධම්මචාරී යන ධර්මතාවයට අනුව කටයුතු සැලසීම හා කටයුතු කිරීම තුලින් සකෘදාගාමි, අනාගාමි, අරිහත් යන ඉතිරි මගඵල වඩා උන් වහන්සේ මේ මනුෂ්‍ය ජාතියේ චතු අරිය සත්‍ය අවබෝධ කර ගැනීම සම්පූර්ණ කොටගෙන ඇත.

එක් සෝවාන් ඵල ලාභියෙකු හෝ මනුෂ්‍ය ලොව වැඩවසන තාක් කල් ලෝක විනාශයක් කිසිදා සිදුනොවන්නක් බව උන්වහන්සේ පෙන්වා දෙයි. අවුරුදු 2500 ක් තරම් කාලයක් පුරාත් බුද්ධ දේශය රකිමින් උතුම් බුද්ධ

ධර්මය පන දහසක් කල් හෙවත් බොහෝ කාලයක් පවත්වා ගැනිමට උන් වහන්සේ මීට පෙර අත්බැව් වල ලොවට කර ඇති සෙතද අතිමහත්ය.

උතුම් බුද්ධ ධර්මයේ උන්නතිය උදෙසාම කර ඇති සියලුම පුණ්‍ය කර්ම ලෝකෝත්තර පුණ්‍ය ශක්තින් බැවින් උන් වහන්සේට මේ මනුෂ්‍ය ජාතියේ නිවන් අවබෝධ කර ගැනීමටත් තවදුරටත් සැනසිල්ලේ පැවැත්ම අවසන් කර ගැනීමටත් එම මුළු මහත් පුණ්‍ය ශක්තියම උපකාරී වී ඇත.

අතිවිශාල පෙර පින්කඳකින් හෙබි උන් වහන්සේ කිසිම පුණ්‍ය ශක්තියක් උපාදානය කර නොගනිමින් තමා සතු සියලුම පුන්‍ය ශක්තිය පින් බලාපොරොත්තු වන සියලුම දෙනා වෙත සම මෙත් සිතින් විහිදුවා පතුරුවා හරිමින් පින් ලබාදෙමින් පින් අනුමෝදන් කර දෙමින් අතිමහත් පිරිසක් දුක්ඛිත ආත්ම වලින් නිදහස් කරමින් උන් වහන්සේද සියලුම දෙනා සමග වු සංසාර ගනුදෙනුවෙන් සහමුලින්ම මිදී නිදහස් වී ඇත.

තවද උන් වහන්සේ සිවුපසය පිළිගැනීමේදී පැමිණි නොපැමිණි සියලුම දෙනාට පින් දී පින් පවරා පින් අනුමෝදන් කරමින් සියලුම සත්වයන්ට අතිමහත් සෙතක් සලසමින් තවදුරටත් කිසිම සංසාර ගනුදෙනුවකට සම්බන්ධ නොවී වැඩ වාසය කරන සේක.

උන් වහන්සේ පෙන්වා දෙන්නේ ගෞතම බුදුපියාණන් වහන්සේ වසර හතලිස් පහක් තුළ දිවා රෑ නොතකා දෙව් මිනිසුන්ට ධර්මය දේශනා කලේ කරුණු පහක් සම්පූර්ණ කරගැනිම පිණිස බවයි. එය ත්‍රිපිකටයේ අංගුත්තර නිකායේ පළමු කොටසේ මෙසේ සඳහන් වන බව උන් වහන්සේ පෙන්වා දෙන සේක.

1. බුද්ධෝ සෝ භගවා බෝධියාම් ධම්මං දේසේති
2. දන්තෝ සෝ භගවා දමතයං ධම්මං දේසේති
3. සංතෝ සෝ භගවා සමථයං ධම්මං දේසේති
4. තින්නෝ සෝ භගවා තරණයං ධම්මං දේසේති
5. පරිනිබ්බුතෝ සෝ භගවා පරිනිබ්බානයාම් ධම්මං දේසේති



වර්තමානයේ මේ හෙලබිමේ වැඩසිටින අතිපූජ්‍ය මීවනපලානේ සිරිධම්මාලංකාර හිමිපාණන් වහන්සේද අවුරුදු දශකයකට ආසන්න කාලයක් තිස්සේ මුළු ජිවිත කාලය පුරාමත් දිවා රෑ නොතකා උතුම් බුද්ධ ධර්මය දේශනා කරනුයේ එම කරුණු පහ සම්පූර්ණ කරගැනීම පිණිසම වේ. උන් වහන්සේට අදාලව එම කරුණු පහ මෙසේ අර්ථ ගැන්විය හැකිය.

1. රාග බව, ද්වේශ බව මෝහ බව යන කෙලෙස් බව තම සිතින් සහ මුලින්ම උදුරා දැමූ (බව උදුරා දැමූ) උන්වහන්සේ භව උදුරා දමන මාර්ගය ලෝකයාට දැනගැනිම පිණිස ධර්මය දේශනා කරන සේක.

2. සංවරත්වයෙන් දමනය වු ඉන්ද්‍රිය දමනය කරගත් සංවර වූ ශික්ෂණය වූ හික්මුණු උන්වහන්සේ අනෙකුත් සියලු දෙනාද දමනය කරන්නට නැතහොත් අනෙක් අය සංවරත්වයට පත් කරන්නට ධර්මය දේශනා කරන සේක.

3. සංවරත්වයට පත්වූ සංසාර බැමි තේරුම් ගෙන සංසාර සම්බන්ධතාවයන් ගසා බිඳ දැමූ සම්මා යන තත්වයට පත්වූ උන් වහන්සේ අනෙක් සියලු දෙනාටත් සම්මා වීමේ මාර්ගය පෙන්වා දීම සඳහා ධර්මය දේශනා කරන සේක.

4. ගංඟා හතරක් තරණය කරන ලෙස මාර්ග ඵලවලට පත්වූ උන් වහන්සේ කාම ඕඝ, දිට්ඨි ඕඝ, භව ඕඝ, අවිද්‍යා ඕඝ තරණය කර නාපරං තත්වයට පත්වී අනෙක් සියලු දෙනාටද එසේ තරණය කිරීමේ ප්‍රතිපදාව දේශනා කරන සේක.

5. පූර්ණ වශයෙන්ම බාන් තුනෙන්ම මිදී නිදහස් වී පරිනිබ්බුතෝ තත්වයට පත්වූ උන්වහන්සේ අනෙකුත් සියලු දෙනාටත් රාගක්ඛය. දේශක්ඛය මෝහක්ඛය කර පරිනිබ්බාණ තත්වයට පත්වීමට මග පෙන්වා දීම සඳහා ධර්මය දේශනා කරන සේක.

රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් සම්පූර්ණ තොර උන් වහන්සේ අතිශය නිහතමානිව අරිය උපේක්ඛා සිතින්ම කටයුතු කරමින් වැඩ වාසය

කරන සේක. උන් වහන්සේ සතු ශක්තීන් හා හැකියාවන් කෙනෙකුට මානයක් ඉපදවීමට හෝ උන්වහන්සේ මානයකින් සතුටුවීමට හෝ උන්වහන්සේ ප්‍රකාශ කරන්නේ නැත.

උන්වහන්සේ සියලුම දෙනා වෙත සම මෙත පතුරුවයි. වර්තමාන සමාජයේ මිනිසුන් උගත්, නුගත්, දුප්පත්, පොහොසත්, යහපත්, අයහපත් ලෙස නොයෙක් ආකාරයෙන් බෙදී සිටියත් උන් වහන්සේ ඔවුන් සියලුම දෙනා දෙස බලනුයේ සංසාර ගමනේ පැටලී ඇති හේතු ඵල සම්බන්ධතාවයන් ලෙසයි. නොදන්නා කමින් ඉන්ද්‍රියන් පිනව පිනවා ඉතාම සුළු ආස්වාදයකට රැවටී කටයුතු කරන මනුෂ්‍යයන් කෙරෙහි අනන්ත වූ මෛත්‍රියෙන්, කරුණාවෙන්, මුදිතාවෙන්, උපේක්ඛාවෙන් උන් වහන්සේගේ ගුණකඳ විහිදෙනුයේ සියලුම දෙනා අවිද්‍යාවෙන් කරන හේතූන් වලින් වැලකී දුක් උපදවන ඵලයෙන් මිදී නිදහස් වීමෙන් සංසාර දුකෙන් සදහටම මිදී නිදහස් වන ලෙසයි.

ඒ සඳහා උන් වහන්සේ සංසාර ගමනේ ආදීනව, හිතක දුක සැකසෙන අයුරු, සංසාර ගමනට හේතු සැකසෙන අයුරු, සංසාර ගමනට සැකසෙන හේතු නවත්වන අයුරු, සංසාර ගමනේ හේතු සදහටම නැවැත්වීමට අනුගමනය කළ යුතු වැඩ පිළිවෙල ඉතාම සරලවත් ඉතාම පැහැදිලිවත් චතු අරිය සත්‍යයෙන් පහදාදීමට උන් වහන්සේගේ මුළු ජීවිත කාලයම දිවා රෑ නොබලා කටයුතු කරනුයේ නිස්සරණ අධ්‍යාසයෙන්මය. එනම් කිසිම කෙනෙකුගෙන් කිසිම නම්බුනාම, කීර්ති ප්‍රශංසා, ලාභ සත්කාර ආදි කිසිම බලාපොරොත්තුවකින් තොරවයි.

හිතක බිහිවන පිරි අපිරි ( ප්‍රියතාවය හා අප්‍රියතාවය )දෙකම සිඳ, පිරිසිඳ දැකගත් උන්වහන්සේ ලාභ, අලාභ, දුක, සැප, නින්දා, ප්‍රශංසා, යස, අයස යන අටලෝ දහමෙන්ම කිසිදා කම්පා නොවේ. එනම් දුකෙන් සදහටම තොරය.

හිතක බිහිවන පිරි නිසා රාගයත්, අපිරි නිසා ද්වේශයත්, පිරි අපිරි අතර විවිධ වූ සාපේක්ෂ මැනීම නිසා මානයක් බිහිවන අයුරු ඉතා



පැහැදිලිව විග්‍රහ කරදෙන උන් වහන්සේ සත්‍ය උතුම් බුදු බණ අසා දැන ගැනීමෙන් කෙනෙකුට හිතක බිහිවන පිරි අපිරි දෙකම සිඳ, පිරිසිඳ දැක ගැනීමේ හැකියාවක් ලබාගත හැකි බව පහදා දෙන සේක. ඒ අනුව හිතක පිරි අපිරි සිඳ දකින්නට පුරුද්දක් ඇතිකර ගැනීමෙන් සිතක රාගය, ද්වේශය, මෝහය බිහිවීමේ පුරුද්දෙන් මිදිය හැකිවේ. ඒ අනුව රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් සිතින්, කයින්, වචනයෙන් කරන සියලුම ක්‍රියා හෙවත් සංකාර කිරීමේ පුරුද්දෙන් මිදිය හැකිවේ.

උන්වහන්සේ නිවන් දැකීම සඳහා අපට පෙන්වා දෙන්නේ සෑම වර්තමාන මොහොතකම සංකාර නොකර, කාර හෙවත් පිරිසිදු ක්‍රියාම කළ යුතු බවයි. මේ සඳහා උතුම් බුද්ධ ධර්මය අසා යථාභූත ඥාණ දර්ශනයක් ලබාගත යුතු වෙයි. මේ අනුව දුකට පත් නොවන අකම්පිත පිරිසිදු සිතක්ම පහදා ගැනීමට හැකිවීමෙන් උතුම් නිවනම සාක්ෂාත් කර ගත හැකි බව උන් වහන්සේ විග්‍රහ කර දෙන සේක.

ප්‍රඥා සිතෙන්ම පිරි උන්වහන්සේට ලොව සියලු සත්‍යයන් දැකගත හැක. අතීත වර්තමාන අනාගත ලොව ඇති බොහෝ දේ උන් වහන්සේට සොයා දැන ගත හැකි වුවත් මනුෂ්‍යයන්ගේ හිතේ කෙලෙස් උපදින්නට හේතු වන්නේ නම් ඒ කිසිවක් උන් වහන්සේ ප්‍රකාශ නොකරන්නේ මනුෂ්‍යයන් කෙරෙහි අනුකම්පා වෙන් හා කරුණාවෙන්ය.

ලොව සියලුම දෙනා අතිශය මවිතයට පත්කළ හැකි සේ උන් වහන්සේ සතු ශක්තීන් අනන්තවත් තිබෙද්දී උන් වහන්සේ ජීවත් වන්නේ අතිශය චාම් නිහතමානි අල්පේච්ඡ ස්වරූපයෙනි.

මනුෂ්‍යයන්ට උතුම් බුද්ධ ධර්මය තෝරා බේරා පහදා දෙන්නට සෘද්ධි ප්‍රාතිහාර්යය ඇතුළු නොයෙක් මාදිලියේ අභිඥා ශක්තීන් මැජික් සංදර්ශන සිතාගත නොහැකි අද්භූත සිදුවීම් ආදි කිසිවකින් මනුෂ්‍යයන්ගේ සිත් රැවටීමකට මායාවකට හසු නොකළ යුතු බව ගෞතම බුදුන් වහන්සේ පවා දේශනා කොට ඇති බව උන් වහන්සේ පෙන්වා දෙන සේක. ඒ වෙනුවට උන් වහන්සේ පෙන්වා දෙන්නේ අනුශාසනා ප්‍රාතිහාර්යම එනම් උතුම් බුද්ධ ධර්මය ඉතා නිවැරදිව ඉතා පැහැදිලිව ධර්ම අවබෝධයේ පිහිටන පරිදිම

විග්‍රහ කිරීමම උතුම්ම බවයි.

බුදුන් වහන්සේලා සතු ගුණකඳද කවදාවත් කෙනෙකුගේ ජීවිත කාලය ගෙවී අවසන් වන තුරුත් කියා නිමකළ නොහැකි බව අප අසා ඇත්තෙමු. මීවන පලානේ සිරිධම්මාලංකාර ස්වාමින් වහන්සේගේ ගුණකඳ මටද ලියා අවසන් කළ නොහැක. උන්වහන්සේ සතු ශක්තින්ගෙන් මා දන්නේද අබමල් රේණුවක් තරම් පමණි.

උන්වහන්සේ සතු ශක්තින්ගෙන් උන්වහන්සේ පරිහරණය කරන්නේ නිවන් දැකිමට පින් ඇති පිරිස සංසාර දුකෙන් එතෙර වීමට මග කියා දීමට කටයුතු කිරීමට අවශ්‍ය ශක්තියයි.

මේ අනුව සංසාර රෝගයෙන් දුකෙන් පෙලෙන දෙව් මිනිසුන්ට එම සංසාර රෝගයෙන් සදහටම සුවපත් වන්නට දිව ඔසු සාදා ගන්නා අයුරු පහදා දෙන මහා වෙද ඇදුරු උතුමාණන් කෙනෙක් ලෙස උන්වහන්සේ හඳුන්වාදිය හැකිය.

උන් වහන්සේ අවුරුදු 10 කට වැඩි කාලයක් තිස්සේ දවසේ පැය 24න් පැය 20 කට නොඅඩු කාලයක් පුරා සෑම දිනයකම ඇප කැප වීමෙන් සිතෙන්, කයෙන්, වචනයෙන් සියලු ක්‍රියා සිදුකරනුයේ සියලුම සත්වයන් කෙරෙහි වූ අතිමහත් කරුණා ගුණයෙනි. උන්වහන්සේ සිතෙන් විහිදෙනුයේ සියලු දෙනාට සත්‍ය ක්‍රියා බලයකි. සෙත් ශාන්තියකි. උන්වහන්සේ කයින්, වචනයෙන් ක්‍රියාකරමින් මුළු රට පුරා ආවරණය වන සේ බොහෝ ප්‍රදේශ වලට වඩිමින් ධර්ම දේශනා මාලා පවත්වමින් ධර්ම සාකච්ඡා පවත්වමින් මනුෂ්‍යයන් ධර්ම අවබෝධයේ පිහිටුවන සේක.

ධර්මය සම්බන්ධ ගැටළු නිරාකරණය කරදෙමින්, සැක සංකා දුරු කර දෙමින්, නොදන්නා සියලු දේ තෝරා බේරා පහදා දෙමින්, දෙස් විදෙස් බණ අසන පිරිසට සෙත සැලසීමට කටයුතු කරනුයේ උන්වහන්සේගේ වෙහෙස මහන්සිය ගැන නොතකමිනි.

ගම්පහ, කොළඹ, හොරණ, පානදුර, ගාල්ල , මාතර, තිස්සමහාරාම,



කතරගම, ඇඹිලිපිටිය, බදුල්ල , බිබිල, අම්පාර, මහනුවර, මාතලේ, රත්නපුරය, කුරුණෑගල , මිරිගම යන බොහෝ ප්‍රදේශ වලට වඩිමින් ධර්ම දේශනා මාලාවන් පවත්වමින් මේ උතුම් බුද්ධ ධර්මය පතුරුවාලීමට කටයුතු කරනුයේ කිසිම පංචස්කන්ධයක් උපාදානය කරගැනිමේ චේතනාවෙන් තොරවයි. සත්වයාට සෙත සැලසිමේ මහා කරුණා ගුණයෙන්මය.

උන් වහන්සේගෙන් පරම පවිත්‍ර සිරි සද්ධර්මය එදිනෙදා අසා දැන ගැනිමට අප රට ජනතාවට මෙන්ම විදේශික හා විදේශ ගත විශාල ජන පිරිසක් අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ වෙමින් බලා සිටිති.

උන්වහන්සේ බැහැ දැක ගැනිමට වැඳ පුදා ගැනිමට තවත් බොහෝ ධර්ම කරුණු අසා දැන ගැනිමට සිවුපසය පිළිගැන්වීමට ආදි නොයෙක් හේතුන් වෙනුවෙන්ම පින් ඇති බොහෝ විදේශික හා විදේශ ගත ජන පිරිසක් උන් වහන්සේ සොයා මේ රටට පැමිණෙති.

හැත්තෑ අට වන වියේ පසුවන උන්වහන්සේ වර්තමානයේ වැඩ සිටිනුයේ මිරිගම කටුවාකැලේ පරම නිබ්බාන ධර්මායතනයේය. (සමන අරණ ධර්මායතනය)

සෑම පොහෝය දිනකම එහි පැමිණෙන දහස් සංඛ්‍යාත පින්වත් පිරිසට උදේ පටන් සවස් වන තුරු ධර්ම දේශනා සහ ධර්ම සාකච්ඡා පවත්වමින් උන් වහන්සේ මහා සෙතක් සලසන සේක.

එනම් මනුෂ්‍යයන්ට සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන මගඵල වලට පත්වීමට සම්පූර්ණ කළ යුතු අංග සියල්ල සම්පූර්ණ කර ගැනිමට අවස්ථාව උදාකර දෙන සේක.

සෝතාපත්ති අංග වන කල්‍යාණ මිත්‍ර සම්පත්තිය, සිරි සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝමනසිකාරය, ධම්මානුධම්ම පටිපදාව යන සියල්ලමත් පැහැදිලි කර දී පරතෝඝෝෂක ප්‍රත්‍ය ලබාදෙමින් පින් ඇති පිරිසට මගඵලවලට පත්වීමට අවශ්‍ය සියලු අවශ්‍යතා සපුරාලන සේක.

පරතෝඝෝෂක ප්‍රත්‍ය ලබා ගැනීම යනු ගෞතම බුද්ධ ශාසනයේ කෙනෙක් මගඵලවලට පත්වීමට නම් බුද්ධ ශ්‍රාවකයෙකුගේ කටහඬින්ම එක් වරක්වත් පරම පවිත්‍ර සිරි සද්ධර්මය ශ්‍රවණය තුලින් නිවන් මගට යොමුවීමට හේතුවන ශක්තියක් ලබාගැනීමයි.

උන් වහන්සේ දේශනා කරනුයේ, කෙනෙකු බුද්ධ ශ්‍රාවකයෙකුගේ කටහඬින්ම එක් වරක් වත් බණ නොඅසා කොතරම් බණ පොත් කියවා හෝ භාවනා කිරීම් කොතෙක් කර හෝ ස්වඋත්සාහයෙන් පමණක් සෝවාන් ඵලයට වත් කිසිදා පත් නොවන වගයි. පරතෝඝෝෂක ප්‍රත්‍යයේ වටිනාකම දත් උන්වහන්සේ පින් ඇති මනුෂ්‍යන්ට උන්වහන්සේගේ කටහඬින්ම ධර්මය දේශනා කිරීමට හැකි සියලුම අවස්ථාවල කටයුතු කරන සේක.

මා මේ පොතින් උන්වහන්සේ කවරෙක්දැයි ඔබ සැමට හඳුන්වාදී උන් වහන්සේ ජීවමානව වැඩ සිටිද්දී එක් දවසක් වත් උන්වහන්සේගේ කටහඬින්ම බණ ඇසීමේ වැදගත්කම පෙන්වාදීමට උත්සාහ ගනිමි. උන්වහන්සේගේ කටහඬින්ම ධර්ම දේශනයක් ඇසීමට අවස්ථාවක් උදාකර ගැනිමට ඔබ උත්සාහ වන්ත නැතිනම් ඒ ඔබට තවත් අනන්ත සංසාරයේ දුක් විඳීමට ඇති උරුමයක් නිසාම විය යුතුය.

තිස් එක් තලයක ජිවත්වන සියලුම සත්වයන්ටත් ගහකොළ ඇතුළු මුලු පරිසරයටත් සෙත සැලසෙන එකම එක වැඩ පිළිවෙල උතුම් බුද්ධ ධර්මය තුලින් විග්‍රහ වේ. මේ අනුව මුළු විශ්වයටම සෙත සැලසෙන වැඩ පිළිවෙල සොයා දැන ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසෙන්නේ බුද්ධ දේශයේ පමණක් බිහිවන බුද්ධ හෙවත් රාග බව, ද්වේශ බව, මෝහ බව සහමුලින්ම උදුරා දැමූ උතුමන් වහන්සේලා ගෙනි. ඒ අනුව උන් වහන්සේද මුළු විශ්වයටම සෙත සැලසෙන වැඩ පිළිවෙලෙහි අනුගමනය කළ යුතු සියලුම පියවරවල් ඉතා පැහැදිලිව ඉතා නිවැරදිව අපට තෝරා බේරා දීමට උන් වහන්සේගේ ජීවිත කාලයම කැපකරමින් අප්‍රමාණ වෙහෙසකින් කටයුතු කරන සේක.

මෙසේ උන්වහන්සේ උතුම් බුද්ධ ධර්මය දේශනා කරමින් අපට



අවබෝධ කරවීමට උත්සාහ ගන්නා කාරණා මම අවබෝධ කරගත් පරිදි කෙටියෙන් මෙසේ ලියා දක්වමි.

ස්වභාව ධර්මය ක්‍රියාත්මක වනුයේ නියමයන් හෙවත් නියාම ධර්ම පහකට අනුකූලවය. එනම්, උතු නියාමය, බීජ නියාමය, ධම්ම නියාමය, චිත්ත නියාමය හා කර්ම නියාමය වේ.

නියාම ධර්ම වලින් විග්‍රහ වන සත්‍ය විග්‍රහය උතුම් බුද්ධ ධර්මය අසා දැනගත යුතු වේ.

මෙම නියාම ධර්ම වලට අනුකූලව හේතු ඵල පරම්පරාවක් ලෙස ක්‍රියාත්මක වීමෙන් විවිධ සත්ව පුද්ගල සංඥා බිහි වෙවී සත්වයාගේ පැවැත්මක් විද්‍යාමාන වේ.

සෑම සත්වයෙකුටම සෑම වර්තමාන මොහොතකම තම තමාගේ කැමැත්තෙන් සිදුකරන හේතුවලට ඵලඋරුම වනුයේ කිසිසේත්ම තම තමාගේ කැමැත්ත පරිදි නොවේ.

තම තමා සෑම මොහොතකම කැමැත්තෙන් සිදුකළ හේතුවේ ස්වභාවයට අනුව නියාම ධර්ම ක්‍රියාත්මක වී ඒ අනුව ඵල උරුම වේ.

එහෙත් මනුෂ්‍යයෝ නොදන්නාකමින් සැප හෝ ලාභ යන ඵලය බලාපොරොත්තුවෙන් සිදු කරනුයේ නිවැරදි හේතුවෙන් බැහැර වූ වැරදිම වූ හේතුවකි. ඒ අනුව දුකම උරුම කරගනී.

මෙලෙස ක්‍රියාත්මක වන හේතුඵල පරම්පරාව ගැන නිවැරදි අවබෝධයක් නොමැති තාක් කල් සත්වයා සෑම මොහොතකම සංසාර ණය ගනුදෙනුවක් අලුතෙන් උපදවා ගෙන අතීතයේ පටන් වූ සංසාර ණය ගනුදෙනුවට සම්බන්ධ වෙවී යන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වීමට ඉඩ සලසා ගනී.

මෙසේ සැකසෙන සංසාර ණය ගනුදෙනු වැඩ පිළිවෙල දිගටම සකස් වෙමින් පැවතීමට එක්තරා මායාකාරී උගුලක් සෑම සත්වයෙකු තුලම ඇටවී ඇත.

කෙනෙකුගේ ජීවිත පැවැත්මට කිසි ලෙසකින් උපකාරි නොවන ජීවිත පරිහරණය අවශ්‍යතාවයක් නොවන ආස්වාදය නොහොත් ඇස, කණ, නාසය, දිව, කය, මන යන ඉන්ද්‍රියන් හය පිනවීමේ අවශ්‍යතාවය ලෙස මෙම උගුල ක්‍රියාත්මක වේ.

සෑම ආශ්වාදයක්ම ඉතා සුළු වේලාවක තාවකාලික සුවයක් ලබාදී එම සුවය නැතිවී විපරිනාමයට යෑම ස්වභාව ධර්මයේ නියමයන් අනුව සිදුවේ.

මේ අනුව ආස්වාදය මිහිරිය. සුවය. සැපයි යැයි අල්ලා ගැනීමට කටයුතු කරන සෑම ක්‍රියාවක්ම නිසා ආස්වාදය අනිවාර්යෙන්ම නැතිවී යෑමේදී දුකක් උරුම වන නියත ස්වභාවයක් පවතී

සදා නොලැබෙන මොහොතකට පමණක් ලැබෙන ආස්වාද උගුලේ පැටලී කටයුතු කරන සෑම කෙනක්ම සැම වර්තමාන මොහොතකම රාගය, ද්වේශය, මෝහය යන අයහපත් ශක්තියෙන් හෙවත් විඤ්ඤාණ ශක්තියක් බිහිකර ගනී.

සෑම වර්තමාන මොහොතකම මෙලෙස විකෘති ඥාන ශක්තියක් (විඤ්ඤාන ශක්තිය ) උපද්දා ගන්නා සෑම කෙනෙක්ම රාග බවින්, ද්වේශ බවින්, මෝහ බවින් කටයුතු කරමින් අතිතයේ පටන් වූ සංසාර ගනුදෙනුව දිගටම ගොතන බැමි තුන හෙවත් රාග බැම්ම, ද්වේශ බැම්ම, මෝහ බැම්ම දිගටම ගොතමින් යන වැඩ පිළිවෙල සකසා ගනි. මෙසේ සැකසෙන දෙවි බ්‍රහ්ම සිට නිරය දක්වා වූ සියලුම සත්ව පරම්පරාවල ඇත්තේ දුක් උපදවන වැඩ පිළිවෙලක්ම බව උන් වහන්සේ උතුම් බුද්ධ ධර්මයෙන් පැහැදිලි කර දෙන සේක.

සත්වයන් සෑම වර්තමාන මොහොතකම ආස්වාද උගුලට අසුවීම නිසා රාගය, ද්වේශය, මෝහය යන අයහපත් කිලිටි ශක්තියක් බිහිවීමෙන් රාග බවින්, ද්වේශ බවින්, මෝහ බවින් කටයුතු කරමින් තමන්ටත් අනුන්ටත් මුළු පරිසරටයත් විපතක් සිදුවන වැඩ පිළිවෙලක් අලුතින් සකසා ගනි.



සංසාර උගුලේ හෙවත් ආස්වාද උගුලේ සියලුම ආදිනව උතුම් බුද්ධ ධර්මය තුලින් උන් වහන්සේ අපට පහදා දෙන්නේ මින් මතු මෙවන් උගුලක පැටලී කිසිසේත්ම කටයුතු නොකරන ලෙසට අප සිත් තුළ අධිෂ්ඨාන ඇතිකරවමිනි.

හේතුඵල පරම්පරාවක් තුළ ආස්වාද උගුල හරහා තණ්හා, උපාදාන ක්‍රියාත්මක වෙමින් මම මාගේ ලෙස අත්ත සංඥා බිහිවී දුක යන ඵලය බිහිවන අයුරු අවිද්‍යා මුල පටිච්ච සමුප්පාද ධර්මය තුලින් ඉතා පැහැදිලිව උන් වහන්සේ විග්‍රහකර පෙන්වා ඇත.

ඒ අනුව විශ්වයේ පවතින පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතවලින් සැකසෙන විවිධ ස්වරූපයේ ශරිර කූඩු උරුම වන අයුරු සහ එම ශරිර කුඩු විපරිනාමයට පත්වී දිරාපත් වී වැනසී යමින් දුක උරුම කර දෙන අයුරුත් එම සියලු ක්‍රියාදාමයන් තම තමාගේ කැමැත්තෙන් බැහැර වූ විශ්වයේ ක්‍රියාත්මක වන නියාම ධර්ම වලට අනුකූළව ක්‍රියාත්මක වන අයුරුත් උන් වහන්සේ ඉතාම පැහැදිලිව අපට විග්‍රහ කර දෙමින් අපව විද්‍යා උදපාදි යන තත්වයට පත්කරන සේක.

මෙසේ මායාවෙන් බැහැරව බැලූ බැල්මට පෙනෙන සම්මුති දැනුම ඉක්මවා විනිවිද බලා සත්‍ය අවබෝධ කර ගැනිමේ ශක්තියක් ලැබීම අවිද්‍යාව දුරුවීම හෙවත් විද්‍යාව උපදීම හෙවත් විද්‍යා උදපාදි ලෙස උන්වහන්සේ පෙන්වා දෙන සේක.

සත්‍ය නිවැරදිව දැනගත් කෙනෙකු මායාවකට රැවටෙන්නේ නැත. මේ අනුව මායාවකට නොරැවටී සෑම වර්තමාන මොහොතේම සත්‍ය අවබෝධයේ පිහිටා අලුතෙන් සංසාර ණය ගනුදෙනුවක් සකස් කර නොගැනීමට අධිෂ්ඨානයෙන් කටයුතු කරන ආකාරය උන් වහන්සේ උතුම් බුද්ධ ධර්මය තුලින් විග්‍රහ කර දෙන සේක.

වර්තමාන මොහොතේ අලුතින් සංසාර සම්බන්ධයක් බිහිකර නොගැනීමට කටයුතු කිරිම තුලින් චිත්ත සංථානය සම්පූර්ණයෙන්ම පිරිසිදු

කරගැනීම සිදුකළ හැකි තත්වයක් බව පළමුකොට එසේ කටයුතු කොට තම චිත්ත සංථානය සහමුලින්ම පිරිසිදු කරගත් උන්වහන්සේ අපටද එසේ කළ හැකි බවත් එසේ චිත්ත සංථානය පිරිසිදු කරගන්නා ආකාරයත් අපට ආදර්ශයෙන්ම පෙන්වා දෙන සේක.

මේ අනුව සංසාරයට බැඳ තබන රාග බැම්ම, ද්වේශ බැම්ම, මෝහ බැම්ම යන බැම් තුනම හෙවත් බාන් තුනම සහමුලින්ම එකවර කපා දමා (නිබ්බාන) යන තත්වයට පලමුව තමන් පත්වී අපටද එම සංසාර බැම් තුන කපා දැමිය හැකි බවත් නිබ්බාන යන තත්වයට පත්විය හැකි බවත් උන්වහන්සේ අපට ආදර්ශයෙන් පෙන්වා දෙන සේක.

මෙලෙස නිබ්බාන හෙවත් බිහිකිරිමේ ශක්තිය සහමුලින්ම උදුරා දැමූ බුද්ධ යන තත්වයට පත්වීමට උන් වහන්සේ අපට අනුගමනය කිරිමට පෙන්වා දෙන්නේ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ඛා වැඩ පිළිවෙලයි. නැතහොත් සංවර, සංසිදීම, සම්මා යන වැඩ පිළිවෙලයි.

සතර සංවර ශීලයෙන්ම සංවරව අරිය ආනාපාන සති සමාධියෙන්ම සමාධිමත්ව ප්‍රඥා සිතෙන්ම අගතැන්පත් උන්වහන්සේ ආදර්ශයෙන් අපට පෙන්වා දෙන්නේ මේ හැම තත්වයකටම අපටද පත්විය හැකි බවයි. එසේ පත්වන ක්‍රමවේදය උන් වහන්සේ සියලු ධර්ම දේශනා තුලින් අපට පෙන්වා දෙන සේක.

වර්තමාන සමාජයේ සංවර්ධනය සැලසීම යනු දිනෙන් දින ආස්වාදයෙන් මත්වී අවිද්‍යාවෙන් අන්ධව මායාවකට රැවටී සංසාර උගුලේ ඇම ගිලීමට වැඩි වැඩියෙන් කටයුතු සැලසී පැවතීමයි. මායාවේ වැඩි වැඩියෙන් රැවටීම සතුට ලෙස දකින්නට මනුෂ්‍යයා හුරු කිරිමේ වැඩ පිළිවෙල වල් වලින්ම සමාජය සැකසී මනුෂ්‍ය මනසට නිදහසේ සිතිමට, හරි වැරැද්ද තේරුම් ගැනිමට අවස්ථාවක් නොලැබෙන සේ දවසේ මුළු කාලය යන්ත්‍ර සේ කටයුතු කිරිමට සළස්වා වටිනා මනුෂ්‍ය ජිවිතය දුකෙන්ම කෙළවර කරන්නට අප රට වර්තමාන මනුෂ්‍ය ජිවිත පැවැත්ම සැකසී ඇත.



මේ අනුව වර්තමාන මනුෂ්‍යයෝ සත්‍ය අසන්නට දකින්නට හිතන්නට මැලි, අකමැති ස්වභාවයකින් කටයුතු කරති. මෙය පංචකාම නීවරණ ධර්මවල ථීනමිද්ධය ලෙස උන්වහන්සේ පෙන්වා දෙයි.

බොහෝ බලවතුන් හා පැවිදි පිරිසක් මනුෂ්‍යයාට සත්‍ය වසන් කිරීමට කැමැත්තෙන් බොහෝ පාපකාරී ක්‍රියාකරනුයේ තම තමාගේ ලාභ අපේක්ෂාවෙන්මය. තමාත් තමාගේ පිරිසටත් පමණක් ලාභයක්, වාසියක් වී අන් මනුෂ්‍යයන් ඇතුළු සියලුම සත්වයන්ටත් පරිසරයටත් කිනම් විපතක් වුවත් කම් නැත ලෙස සිතා කටයුතු කරනුයේ මනුෂ්‍යයන් සතු අදුරදර්ශි බවත් උතුම් බුද්ධ ධර්මයක් නොදන්නා බවත් නිසාමය.

ඒ අනුව උන්වහන්සේටද බුදුබණ තුලින් මනුෂ්‍යයන්ට සත්‍ය පෙන්වා දීමට කටයුතු කිරිමට සිදුවී ඇත්තේ බොහෝ කරදර බාධක කම්කටොළු මධ්‍යයේය.

අප රටේ පැවිදි පිරිසගෙන් හා රටේ පාලක පිරිසගෙන් උන්වහන්සේගේ ධර්ම දේශනා වලට හා ධර්ම පුස්තක වලට ලැබෙන අනුග්‍රහය ඉතාම අල්පය. මනුෂ්‍යයන් ලක්ෂ කෝටි ගණනින් සත්‍යයට භය වුවත් සත්‍යයේ අගයත් එයින් ලොවට උදාවන අති මහත් සෙත් ශාන්තියත් එක් මනුෂ්‍යයෙකු හෝ අවබෝධ කරගෙන තමාම සත්‍යයේ පිහිටමින් කටයුතු කරන්නට අධිෂ්ඨාන කරන්නේ නම් ලක්ෂ කෝටි ගණනක් අඥාණ මනුෂ්‍ය සිත් අභිබවා ජය ගත හැකි ශක්තියක් මනුෂ්‍යයාට උපදවා ගත හැකි බව උන්වහන්සේ අපට ආදර්ශයෙන්ම පෙන්වා දී ඇත. අතිතයේ මෙලෙස අසත්‍යයට බිය නොවන මනුෂ්‍යයාට විශාල සෙතක්ම සැලසූ උදාරතර මනුෂ්‍යයන් අප රට බිහි වී කටයුතු කර ඇති බව ඉතිහාස කථා තුලින් අපට අවබෝධ කරගත හැකිවේ.

උන් වහන්සේ කිසිම කෙනෙකුට හිංසාවක් පීඩාවක් වීමට හේතුවන දේ කිරීමට කිසි ලෙසකත් කටයුතු නොකරන සේක. කිසි කෙනෙකුගේ ලාභ සත්කාර වලට අවුල් ඇති කිරීමට කටයුතු නොකරන සේක. උන් වහන්සේ ඉවසිලිවන්තය.

මනුෂ්‍යයාගේ සෙත සළසා ගැනීම උදෙසා උන් වහන්සේ සොයා දැනගත් බොහෝ වැදගත් කරුණු එළිදැක්වීමට සුදුසු අවස්ථාව එනතෙක් උන්වහන්සේ නිහඬව වාසය කරමින් කියා සිටියේ දෙබරකට ගල් ගැසිය යුතු නොවන බවයි.

එහෙත් උන් වහන්සේ අභීතය. සත්‍යවාදීය. අවිහිංසාවාදීය. මරුට ණය ගෙවා අවසන් බැවින් මරණ බියක්ද නැත. සුදුසු අවස්ථාව පැමිණි විට මනුෂ්‍යයාට කිව යුතු දේ කියා දෙමින්, පෙන්වා දිය යුතු දේ පෙන්වා දෙමින්, කාරුණික සිතින්ම උන් වහන්සේ කටයුතු කරනුයේ නොදන්නා කමින් කටයුතු කරන මනුෂ්‍යයන් තවදුරටත් අනන්ත වූ දුක් පොදියකට උරුමකම් ඇතිකර ගැනීමෙන් වළක්වා ගැනිමේ මහත් කරුණා ගුණයෙන්මය.

උන් වහන්සේ ගේ ධර්ම ප්‍රචාරයට බොහෝ සෙයින් අනුග්‍රහය දක්වන්නේ අප රට ජීවත්වන පින් ඇති ගිහි පිරිසයි. පින් ඇති ගිහි පිරිස සතුව විශාල ධන සම්පත් නොතිබුණත් විශාල දාන මාන ඇතුළු විශාල පුණ්‍ය කර්ම සිදුකිරීමට හැකියාවන් ඔවුන් සතු වනුයේ බුද්ධ ධර්මය අසන ඔවුන්ගේ පිරිසිදු චිත්ත ශක්තියේ බලයෙන්මය.

ගිහියන්ගේ ආරාධනාවෙන් ඔවුන්ගේ නිවෙස් තුළ පැවැත්වෙන ධර්ම දේශනාව සහ දානමය පුණ්‍ය කර්මයට සහභාගි වීම සඳහා කැමති සියලුම පින්වතුන් සඳහා විවෘත ආරාධනා ලැබෙයි.

බණ ඇසීමට දහස් සංඛ්‍යාත පිරිසක් පැමිණ සිටියත් ඔවුන් සියලු දෙනාම තුලින් දිස්වනුයේ නිවුණු ස්වභාවයකි.

කොතරම් දහස් සංඛ්‍යාත පිරිසක් ධර්ම ශ්‍රවණයට පැමිණ සිටියත් ඔවුන් සියලු දෙනාම උන් වහන්සේගේ ධර්ම දේශණය ආරම්භ වීමත් සමග සම්පූර්ණයෙන් නිහඬ වනුයේ කිසිවෙකුගේ මෙහෙයවීමකින් තොරවයි.

උන් වහන්සේ ධර්ම දේශනයට වඩිනා විට පරිසරයද ඒ පුවත දැන සිටියා සේය. පරිසරය ධර්ම දේශනයට සුදුසු ආකාරයට සැකසෙන අයුරු සියලුම දහස් සංඛ්‍යාත පිරිස එදිනෙදා අත් දකිති.



මහා වැසි හෙණ හඬ නැවතී, පරිසරය සිසිල් වී සතා සිවුපාවා නිහඬ වී පැමිණ සිටින සියලු දෙනාට සිවුපසයෙන් අඟහිඟ නොවී පැමිණ සිටින සියලු දෙනාට උතුම් බුදු බණ ඉතාම පැහැදිලිව ශ්‍රවණය වීමට සියලු කටයුතු සැකසී පැමිණ සිටින සියලුම දෙනා සන්තුෂ්ඨියට පත්වන අයුරු පුදුම සහගතය.

ධර්ම ශ්‍රවණයට පැමිණෙන විශාල නොපෙනෙන සත්වයන් නිවැරදිව පින් අනුමෝදන් වී ඔවුන්ගේ සෙත සළසා ගනිති.

උන්වහන්සේ ඕනෑම මොහොතක ඉතා සැහැල්ලු සිනහවකින් සියලු දෙනා සමග සුහද බවකින් කතා කරමින් දහස් සංඛ්‍යාත පිරිසක් දැන හඳුනා ගනිමින් ඔවුන් සමග පිළිසඳරේ යෙදෙනුයේ කිසිම ආකාරයක කෙළෙස් සිතිවිල්ලක් ක්‍රියාවක් වචනයක් පරිහරණය නොකරමිනි. ඒ අනුව අපටද එසේ ජීවත්විය හැකි බව අවබෝධ කරගත යුතුව තිබේ.

මනුෂ්‍ය සමාජයෙන් වෙන් නොවී යුතුකමෙන් වගකීමෙන් බැහැර නොවී අලස නොවී සෑම මොහොතකම කාලය ප්‍රයෝජනවත්ව ගත කරමින් කිසි ලෙසකින් දුකට පත් නොවී අකම්පිත මෛත්‍රී සිතින්ම ජීවත්වෙමින් පිරිසිදු සිතින්ම සියලු කටයුතු කරමින් වැඩ වාසය කරන උන් වහන්සේ උන් වහන්සේගේ ජිවිත ආදර්ශය තුලින් නිවන ගැන බොහෝ පාඩම් අපට පෙන්වා දෙන සේක.

උන් වහ්නසේ කිසිදා කිසිම පා සඟලක් පරිහරණය නොකරමින් එහි ඇති වැදගත් අර්ථය ආදර්ශයෙන් පෙන්වා දෙන සේක. බොහෝම සරල ලෙස සිවුපසය පරිහරණය කරමින් සියළු දෙනාටම සිවුපසය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු සරල පිළිවෙත ආදර්ශයෙන් පෙන්වා දෙන සේක.

උන් වහන්සේ වැඩ සිටින ධර්මායතනයට ධර්ම දේශනා පවත්වන ඕනෑම දවසක කොතරම් දහස් සංඛ්‍යාත පිරිසක් පැමිණියත් ඒ සියලුම දෙනාට අවශ්‍ය සිවුපසය සම්බන්ධයෙන් ඉහළම වගකීම දරන්නේ උන් වහන්සේය. දාන ශාලාවේ කෑම උයන සියලු දෙනාත් උදව් උපකාර කරන

සියලු දෙනාත් නිරන්තරයෙන් උන් වහන්සේගේ අවධානයට ලක්වේ. ඕනෑම කටයුත්තක් කිරීමේදී උන් වහන්සේ දැනුවත් කළ විට උන් වහන්සේගෙන් එම කටයුත්ත ඉතාම නිවැරදිව ඉතාම සාර්ථකව ඉතාම සාමකාමීව කිරීමට ලැබෙන අවවාද අනුශාසනය වාක්‍ය කිහිපයකින් කැටිවූ ඉහළම අවවාද අනුශාසනයි.

අප රට නායකයන්ට සිරි ලංකාව ලෝකෙන් උතුම් රට ලෙස බැබලවීමට හැකි ලෙස ඉතා වටිනා අවවාද අනුශාසනා ඉතාම සරලව පැහැදිලිව ඉතාම නිවැරදිව ලබාගැනීමට සමත් මෙතරම් වටිනා මනුෂ්‍ය රත්නයක් අප රට වැඩ සිටිද්දී ඒ බව නොදැන සිටීම හෝ ඒ ගැන නොසළකා හැරීම අප රට වැසියන්ගේ පූර්වේ කර්ම දෝෂයක් විය යුතුය.

අවිහිංසාවාදී ප්‍රතිපත්තියත්, මානයෙන් තොරබවත්, සියලුම වැදගත් කටයුතු සම්බන්ධයෙන් නොසැලෙන වගකීමෙන් යුතුවීමත් ඉවසීමේ ගුණයත් පිරිසිදු සිතිවිල්ලෙන්ම කටයුතු කරන බවත් උන්වහන්සේ තුලින් ඕනෑම අවස්ථාවක විද්‍යාමාන වේ.

ධර්ම ශ්‍රවණයට පැමිණ ඇති දහස් සංඛ්‍යාත පිරිස අතර කිහිප දෙනෙක් හෝ ධර්ම ශ්‍රවණයෙන් බැහැරව සිරි සද්ධර්මයට හෝ වෙනත් කාට හෝ හිංසා පැමිණවීමේ චේතනාවෙන් පැමිණ සිටියොත් ධර්මාසනයේ අසුන්ගත් ගමන් ඔවුන් හදුනාගන්නා උන්වහන්සේ ධර්ම දේශනය අවසානයේ පවසා සිටිනුයේ එසේ පැමිණි පිරිසත් දැන්වත් වැරැද්ද හඳුනාගෙන තම තමාගේ සෙත සළසා ගන්නා ලෙසයි.

උන්වහන්සේ ඉදිරියට පැමිණෙන මනුෂ්‍යන්ගෙන් තම තමා වටේ ඇති රැස් වළල්ලේ පාටින් ඔවුන්ගේ සිත්වල ස්වභාවය ක්ෂණිකව හඳුනාගන්නා උන් වහන්සේ ඒ අනුව ඔවුන් සමග කටයුතු කළ යුතු ආකාරය අවබෝධ කර ගන්නා සේක.

ප්‍රබල සත්‍ය ක්‍රියා බලයකින් බොහෝ සෙත සැලසෙන කටයුතු සිදුකරන උන් වහන්සේ අපටද එවැනි බලගතු සත්‍ය ක්‍රියා බලයක් විහිදවිය හැකි බවත් එවැනි පිරිසිදු ශක්තියක් බිහිකරන වැඩ පිළිවෙලත් අපට ඉතාම



නිවැරදිව පැහැදිලිව සරලව පහදා දෙන සේක.

2012 වර්ෂයේ දෙසැම්බර් මාසයේ පටන් ආරම්භ වූ කල්ප විනාශය කලින්ම දුටු උන් වහන්සේ එහි විනාශය අවම කර තවත් පින් ඇති පිරිසට සෙත සැලසිය හැකි සේ සත්‍ය ක්‍රියා බලයකින් විශාල පිරිසිදු කිරණ ශක්තියක් විශ්වයට මුදා හරිමින් විශාල ලක්ෂ සංඛ්‍යාත මනුෂ්‍ය පිරිසක් හා එක්වෙමින් පිරිසිදු කිරණ ශක්තිය බලවත් කරමින් කටයුතු කොට සියලුම සත්වයන්ටත් මුළු මහත් පරිසරයටත් මහත් සෙතක් සිදුකළ සේක. එහෙත් උන් වහන්සේ ප්‍රකාශ කළ කල්ප විනාශය වනතුරු කට ඇරගෙන පමණක් බලා සිටි විග්‍රහ විවේචනයට පමණක් ලෑස්ති වූ පිරිස තම තමා බලාපොරොත්තු වු පරිදි ක්ෂණික විනාශයකින් සියල්ල අවසන් නොවී තම තමාගේ කිලිටි සිතිවිල්ල ඉටු නොවීම තුළ උන් වහන්සේ ඉටුකළ මහා සෙත උදාර මෙහෙය අවබෝධ කර ගැනීමට අසමත් වී උන් වහන්සේ අසත්‍යවාදියෙක් ලෙස තීරණය කොට බුදුබණ කෙරෙහිත් සැක උපදවා බැහැර කරන්නට තරම් අඥාණකමට කරුමයට ජය ලබාදෙන්නට ඔවුන් සමත් වූහ. මේ සියලු අභියෝග නින්දා අපහාස හමුවේ අතිශය කාරුණිකව සිනා දක්වන උන් වහන්සේ නිරාමිස සුවයෙන් නිහඩව වාසය කරමින් කිසිම ලෙසකින් උදම් ඇනීමක්ද කම්පා වීමක් ද සිදු නොකරන සේක.

මේ අනුව උන්වහන්සේ මනුෂ්‍ය ජාතියක ඉපදීමෙන් උතුම් මනුෂ්‍ය ගතිම තෝරා බේරාගෙන ඉස්මතු කරගත් ආකාරය ගැන දැන ගැනිමට උන් වහන්සේගේ ගිහි ජීවිතය කෙබඳු වී දැයි කෙනෙකුට සිතිය හැකි බැවින් උන් වහන්සේගේ ගිහි ජීවිතයෙන් අපට දෙන ආදර්ශ බිඳක් ලියා දක්වමි.

ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා බල මහිමයෙන් පිරි උන් වහන්සේගේ උප්පත්තිය සිදුවුයේ 1942 අප්‍රේල් 12 වෙනි දින රයිගම් කෝරලයට අයත් මීවනපලානේ ග්‍රාමයේය. විලියම් හපුතන්ත්‍රි සහ ඇලිස් හපුතන්ත්‍රි යන ප්‍රභූ දෙපල උන් වහන්සේගේ දෙමාපියන් දෙදෙනාය.

පවුලේ වැඩිමහල් දරුවා වෙමින් තවත් සහෝදර සහෝදරියන් පස් දෙනෙකු සමගින් අගහිඟකමින් තොර සැප සම්පතින් පිරි ගිහි ජීවිතයක්ම ගත කිරීමට හැකිවුයේ උන් වහන්සේ සතු අනන්ත අප්‍රමාණ වූ පුබ්බේත කත

පුණ්‍යතා ශක්තියයි.

ජාත සෝතාපන්න බවින් ලත් උසස් අධ්‍යාත්මික ගති ස්වභාවයත් පුණ්‍යතා ශක්තියෙන් ලැබෙන සැප සම්පත් හමුවේ නොමුලාවන ස්වභාවයත් උපේක්ඛා සිතින්ම කටයුතු කිරීමත් ගිහි ජීවිතයේ සියලු කටයුතු වල හරය ලෙස පෙන්වා දිය හැකිය.
සිරිසේන හපුතන්ත්‍රි ලෙස නම් ලැබූ මෙම කුල කුමරුවා මීවනපලානේ (තම ගමේ) රජයේ විදුහලෙන් ප්‍රාථමික අධ්‍යාපනය හදරා පසුව ද්විතියික අධ්‍යාපනය සඳහා හොරණ තක්ෂිලා මධ්‍ය මහා විදුහලේ ඇතුලත් වී පසුව වර්ෂ 1962 දී විදුහලේ දීප්තිමත් ශිෂ්‍යයෙකු වශයෙන් තම සරසවි පිවිසුම් පෙළ විභාගය ඉහලින්ම සමත්වී ඇත.

වර්ෂ 1963 දී තම උපන් ග්‍රාමයෙන් ප්‍රථම වරට පේරාදෙණිය සරසවියට ඇතුලත් වීමට වරම් ලද මොහු සංඛ්‍යා ලේඛන හා ආර්ථික විද්‍යාව යන විෂය ධාරාවෙන් විශේෂ උපාධියක් ලබා උසස් අධ්‍යාපනයද ජයගනු ලැබුවේය.

ගණිත විෂයට අද්විතිය දස්කම් පාමින් උසස් අධ්‍යාපනයෙන් නොනැවතුණු සිරිසේන හපුතන්ත්‍රි ශිෂ්‍යයා තම පශ්චාත් උපාධි කටයුතු සඳහා විදෙස් ගතවුයේය.

නෙදර්ලන්තයේ හේග් විශ්ව විද්‍යාලයෙන් කෘෂිකර්මය හා සංඛ්‍යා ලේඛණ පිළිබඳ පශ්චාත් උපාධියත් ඇමරිකාවේ නෝර්ත් කැරොලිනා රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යා විශ්ලේෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ඔහු සම්පූර්ණ කරගත්තේය.

වර්ෂ 1968 වන විට සිරිසේන හපුතන්ත්‍රි මහතා කෘෂිකර්ම ආහාර හා සමුපකාර අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛණඥ ලෙස තම මුලික රැකියාවේ වැඩ භාරගන්නට යෙදුනේය.

විශේෂයෙන්ම රටේ ජිවනාලිය බඳුවූ ගොවි ජනතාවට වැඩදායි බොහෝ ව්‍යාපෘතින් ක්‍රියාවට නැගුනේ සිරිසේන හපුතන්ත්‍රි මහතාගේ මුලිකත්වයෙනි.



තවද එතුමා රටට වැඩදායි ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වමින් කොන්දේසි විරහිතව ගොවියන්ට ගොවි ණය ලබාදීමේ ව්‍යාපෘති දියත් කරමින් ගොවියන්ට බොහෝ සෙත සළසා ඇත.

එපමණක්ද නොව වර්ෂ 1979 දී අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්ත වෙමින් එහි ප්‍රධාන සංඛ්‍යා ලේඛනඥවරයා ලෙස කටයුතු කොට ඇත.

ඔහුගේ මුලිකත්වයෙන් දීප ව්‍යාප්තව පවත්වන ලද පාසල් නොයන සහ පාසැල් හැරයන ළමුන්ගේ භේද සෙවීමේ සමීක්ෂණ වාර්තාව එක්සත් ජාතින්ගේ ළමා අධ්‍යාපන අරමුදලේ (යුනිසෙප්) එම ව්‍යාපෘතිය සාර්ථකව කර ගැනිමට බෙහෙවින් ඉවහල් වී ඇත. විශේෂයෙන්ම ඔහු සකස් කළ එම වාර්තාවේ ඉවහල් වූ කරුණු සළකා බලා පාසල් ළමුන්ට නොමිලේ දිවා ආහාර වේල් පාසල් නිළ ඇඳුම් හා පොත්පත් පවා ලබාදීමට රජයෙන් කටයුතු කොට ඇත.

යුරෝපීයන් විසින් වතුකරයේ දෙමළ ජාතික ළමුන්ට පස්වෙනි ශ්‍රේණිය දක්වා පමණක් සීමාකර තිබූ අධ්‍යාපන පහසුකම් ඉහළ ශ්‍රේණි දක්වා විවෘත කර දීමේ අවශ්‍යතාවය එහිදී පෙන්වා දී ඇත. පසුව ඒවාද ක්‍රියාවට නැංවී ඇත.

තම රාජ්‍ය සේවා කාලය තුළ විදෙස් රටවල් 60 ක පමණ සංචාරය කොට අත්දැකීම් ලද හපුතන්ත්‍රි මහතා වර්ෂ 2002 දී විශ්‍රාම ලබන විට කෘෂිකර්ම අමාත්‍යංශයේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය හොබවමින් රාජ්‍ය සේවයෙන් සමුගෙන ඇත.

එතුමා සංසාර සම්බන්ධතාවයෙන් මිදී නිදහස් වීමට එතුමාගේ සේවා කාලය තුළ කටයුතු කොට ඇති ආකාරය මේ අනුව පෙන්වා දිය හැක. ශිල්ප ශාස්ත්‍ර මැනවින් ඉගෙන ගෙන තමා උගත් දැනුමෙන් තම රට දැය වෙනුවෙන් ඉතා අවංකවත් ඉතාම නිවැරදිවත් ඉතා කැපවීමෙන් හා වගකීමෙන්ම පිරිසිදු සිතෙන්ම කටයුතු කොට මනුෂ්‍යයන්ට විශාල සෙතක්

සළසා ඇත. මේ සියලු කාලය තුළ කටයුතු කර ඇත්තේ සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා යන තත්වය තුළ රැඳෙමින්ය.

ඉතා සාර්ථක පවුල් ජීවිතයක් ගතකළ මෙතුමාගේ බිරිඳ වූයේ දිවයිනේ ප්‍රධාන බාලිකා පාසල් කිපයක විදුහල්පති තනතුර දැරූ ගුරු මාතාවකි. දරුවන් දෙදෙනකුගේ පියෙකු වූ මෙතුමා ඉතා හොඳ ආර්ථික තත්වයකින් සහ සමාජ තත්වයකින් ජීවිතය ගතකර ඇත. මෙම ආදර්ශයෙන් අපට පෙන්වන්නේ කෙනෙකු පිරිසිදු සිතින් රාජකාරි කටයුතු කිරීම, ආර්ථික කටයුතු මෙහෙයවීම. කෙනෙකුගේ ආර්ථික පරිහානියට කිසි ලෙසකින් හේතු නොවීමයි. ඒ වෙනුවට හේතුඵල සම්බන්ධයට අනුව අන් අයගේ සෙත සැලසීමට අවංකව කැපවීම යන හේතුව මත තමන්ගේ සෙත ආර්ථික හැකියාව දිනෙන් දින වර්ධනය වීමට සිදුවන සේ ධර්මතාවයෙන් කටයුතු සැලසෙන බවයි.

එහෙත් වර්තමාන සමාජයේ මනුෂ්‍යයාගේ සිතිවිලි වල ස්වභාවය මීට හාත්පසින්ම වෙනස්ය. වර්තමාන මනුෂ්‍යයන් සිතනුයේ රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් බැහැර වී පිරිසිදු සිතින්ම කටයුතු කිරීම ප්‍රායෝගිකව කළ නොහැක්කක් ලෙසයි. ලාභ අපේක්ෂාව කෙලෙස් ගති නැතිව ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙලවල් කළ නොහැකි බවයි. මේ අනුව සිතා නිවන් ලබාගැනීමට කටයුතු කිරීම වයසට ගොස් මරණය ලංවූ කළකදී වූ කාලයකට සීමා කිරීමට සිතා කෙලෙස් ගති වලින් ජීවිත පැවැත්ම ගෙවා දමන්නට මනුෂ්‍යයන් පුරුදුව ඇත.

එහෙත් හේතුඵල සම්බන්ධතාවය අනුව තමා පරිහරණය කළ කිළිටි සිතිවිල්ලේ දූෂ්‍ය තරම අනුව සිදුකරන ක්‍රියා පිලිවෙලේ පාපකාරි තරම අනුව ඔවුන්ගේ ආර්ථිකයද දිනෙන් දින පරිහානිය කරා යමින් ජීවිත පැවැත්ම තුළ දුකම උරුම වන අයුරු මනුෂ්‍යයන් උතුම් බුද්ධ ධර්මය අසා දැන අවබෝධ කොටගත යුතුවේ.

එතුමාගේ විශ්‍රාම දිවිය ඇරඹුමත් සමග ඇතිවූයේ තවත් විශාල ජීවිත අවබෝධයකි. එනම් ජීවිත පැවැත්ම තුළ වන සත්‍ය අවබෝධයකි. මේ අනුව එතුමා පිරිසිදු බුදු දහම කෙරේ දැඩි නැඹුරුතාවයක් දක්වමින් කටයුතු කිරීමට පෙළඹී ඇත.



එතුමාගේ මිතුරෙකු වූ අබේරත්න මහතා නම් කල්‍යාණ මිත්‍රයා (පසු කලෙක් වහරක අභයරතන නමින් පැවිදි වූ) ආශ්‍රයද උතුම් බුද්ධ ධර්මය තමන්ගේ සිතින් ඉස්මතු කර ගැනීමට බෙහෙවින් උපකාරීවී ඇත.

තමාගේ පිරිසිදු සිතෙහි පෙර ඇසූ උතුම් බුදු බණ ඉස්මතු වෙද්දී තමා දැනගත් දේ තමා තුලින්ම දැක ගනිමින් අරිය පර්යේෂණයක යෙදෙමින් අනුපස්සනා විපස්සනා නුවණින් කටයුතු කරමින් දිනෙන් දිනම තමන්ගේ පිරිසිදු ප්‍රඥා සිත පෑදෙන අයුරු ප්‍රත්‍යාවේක්ෂා වෙමින් නිවැරදි නිවන් මග කුමක්දැයි පසක් කොට ගත්තේය.

මෙසේ නිවන් මගේ අවසානය තෙක්ම අධිෂ්ඨානයෙන් කැපවීමෙන් කටයුතු කළ එතුමා උතුම් නිවනින් නිවන් මග කෙළවර වන හැටි අත්දැක ගත්තේ ගිහි ජීවිත කාලය තුළදීමයි.

මේ අනුව සාමාන්‍ය ජීවිත පැවැත්මකද පිරිසිදු සිතෙන්ම කටයුතු කිරීමෙන් ගිහි ජීවිතය තුළදීම නිවන් අවබෝධ කොටගත හැකි බව මෙහි ගැබ්වී ඇති ආදර්ශයයි. ගිහි ජීවිතය තුළ නිවනම සාක්ෂාත් කළ එතුමාගේ ගිහි ජීවිතයෙන් පෙන්වා දෙන තවත් ආදර්ශ කීපයක් මෙසේ ලියා දක්වමි.

මනුෂ්‍ය වාසයෙන් බැහැරව වනගතවී පර්යංකයෙන් හිඳ භාවනා කරමින් ආදී කිසිම සම්මතයේ ඇති භාවනා වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබීම.

ගිහි ජීවිතයේ මුල් කාලයේ පටන් පන්සල් වල රැඳී වන්දනා කිරීම් සිල් රැකීම් භාවනා කිරීම් ආදියට කැමැත්තක් නොතිබූ අතර මේ අනුව වන්දනා, පූජා පැවැත්වීම් ඇදහිලි, යාඥා ආදි නොයෙක් වැඩ පිළිවෙලවල් වල නියැලි නොමැති බව.

ගිහි ජීවිතයේ අවසන් කාල වකවානුවල ලංකාව පුරා ඇති සියලුම ප්‍රසිද්ධ භාවනා මධ්‍යස්ථාන වලට ගොස් සති කිහිපයක් එම ස්ථාන වල රැඳෙමින් භාවනා යෝගීන් නිවන් ලබාගැනීමට අනුගමනය කරන වැඩ

පිළිවෙලවල් අධීක්ෂණය කොට ඇත. එසේ කාලය ගතකරමින් එතුමා අවබෝධ කොට ගෙන ඇත්තේ ලංකාව පුරා වූ සියලුම භාවනා මධ්‍යස්ථාන වල යෝගීන් නිවන් ලබාගැනීමට යෙදෙන අසාර්ථක උත්සාහයේ ස්වභාවයයි. භාවනා නොකරන අයටත් වඩා සංසාරයේ අතරමං වන වැඩපිළිවෙලෙන් වන අන්ධ වැඩපිළිවෙලවල් වල එල්ලී යෝගීන් යෙදෙන

අසාර්ථක උත්සාහයේ විපත් ස්වභාවය අවබෝධ කොටගත් එතුමා තමා තුලින්ම අත් දැකගත් සත්‍ය බුද්ධ භාවනාව මනුෂ්‍යයාට පහදා දීමට කටයුතු කිරීමට අධිෂ්ඨානකොට ඇත.

අලුතින් සංසාර ණය ගනුදෙනුවක් සකස් නොවන ආකාරයට සෑම වර්තමාන මොහොතකම පිරිසිදු සිතින්ම කටයුතු කර තිබීම.

සංසාර ණය ගනුදෙනුවක් අලුතින් සැකසෙනුයේ කෙනෙක් රාගයෙන්, ද්වේශයෙන්, හා මෝහයෙන් කටයුතු කිරීමෙනුයි.

යුතුකම් වගකීම් අවංකවත් පිරිසිදු සිතින්ම ඇප කැපවීමෙන් ඉටුකොට ඒ වෙනුවෙන් අයිතිවාසිකම් ලාභ අපේක්ෂා ආදියෙන් තොර වීම.

සියලුම ආකාරයේ බලාපොරොත්තු අත්හැර දමමින් තම අධිෂ්ඨානයම ජයග්‍රහණය අත්පත් කර ගැනිමට උපයෝගි කර ගැනීම.

දාන, ශිල, භාවනා වැඩසටහන් වලට කොටු නොවී සංසාරයේ අතරමං වන වැඩපිළිවෙලින් වැලකීම.

තණ්හා උපාදානයෙන් තොරව ජිවිත පැවැත්මක් තුළ කටයුතු කිරිම.

තණ්හා උපාදාන පහළ වනුයේ තම සිතෙහිම සකස්වන වැරදි චේතනාවකින් බව අවබෝධ කරගත් එතුමා තණ්හා උපාදානයෙන් තොරව ජිවිත පැවැත්ම තුළ කටයුතු කළ හැකි බව මනාව පසක් කොට ගත්තේය.

තමා පිරිසිදු සිතින් කටයුතු කිරීමේදී අන් අයටත් තමාටත් සෑම මොහොතකම විශාල සෙතක් සැලසෙන අයුරු අත් දැකගත් එතුමා ඒ සෑම මොහොතකම උපදින පුණ්‍ය ශක්තියද උපාදානය කර නොගත්තේය. එම



පුණ්‍ය ශක්තිය පින් පවරා පින් අනුමෝදන් කොට පුණ්‍ය විපාකයෙන්ද නිදහස් වී ඇත.

තමා අතින් වැරැද්දක් අවැඩක් නොදැන හෝ සිදුවුනි නම් ඒ වෙනුවෙන් සමාව ගෙන තමාගේ මෛත්‍රි සිත ඒ වෙනුවෙන් පතුරුවා සිතේ පිරිසිදු බවම රැක ගැනීම.

නිවන් මග අවසාන පියවර හෙවත් අරිහත් මාර්ගය ජයගත් හැටිද උන් වහන්සේ ලියා දක්වා ඇත. මෙසේ අරිහත් මාර්ගය වැඩීම ගැන උන් වහන්සේ ලියා දක්වා ඇති විස්තරයක උපුටා ගැනීමක් මෙසේ ලියා දක්වමි.

අරිහත් මාර්ගය වැඩිම සිදුවන්නේ කුසල් සිත් හෙවත් කුසලමූල සංකාර වැඩීමෙන්ය. කුසල් සිත් වැඩීම යනු කුමක්ද? ප්‍රායෝගිකව කුසල් සිත් වැඩිය යුත්තේ කෙසේද? කුසලස්ස උපසම්පදා යන්න පූර්ණ කරගත හැකි වන්නේ කෙසේද යන්න නිවැරදිව තේරුම් ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.

සං හෙවත් රාග, ද්වේශ, මෝහ රැස් කිරිම උපාදානය කර ගැනිමේ ගති ලක්ෂණය තම සිත තුලින්ම සොයා දැන පහදාගෙන ඒ ඒ ගති ලක්ෂණයන්ම ප්‍රහාණය කර ඉන් නිදහස් වන්නට ඇප කැපවී කටයුතු කිරීම කුසල් සිත් වැඩීමයි.

තම චිත්ත සංථානයට කවදා හෝ අතීත කාලයක තමාම එකතු කර (සං) ගබාඩා කරගත් මේ කිළිටි ගති ලක්ෂණයන්ඉවත් කර ගැනිම කුණු සලාහැරීම හෙවත් කුසල් සිත් වැඩීම යනුවෙන් අදහස් කරන ක්‍රියාවලියයි.

එකතු කරගත් අතීත පුණ්‍ය ශක්තීන්ද මේ කුණු ගොඩටම අයත්ය. ඒවාද පවරා දිය යුත්තන්ට දී ගෙවා අවසන් කරගත යුතුය. මෙය ආසව ඛය කර ගැනීම ලෙසින් පෙන්වා දිය හැකිය.

තමාගේම චිත්ත සංථානයේ රාග මුල්, ද්වේශ මුල්, මෝහ මුල් සජිවීව තැන්පත් ව පවතී නම් තමාගේ සිත්හි මතු වන්නේ කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක හෝ පාප විතර්කයන්ය. මේ අවිද්‍යා මුල විතර්ක සිතේ මතුවනවාත් සමගම ඒවා මතුවන බව දැක සතියෙන්

මෙනෙහි කර එවන් අවිද්‍යා සහගත විතර්ක ප්‍රහාණය කර ඉවත්කර සිතින් ඉවත් කර රෝද නොගසා නිරෝධ කළ යුතුය. ඒ සමගම තමන් කල්පනා කළයුතු වන්නේ මෙවන් අවිද්‍යා විතර්කයන් තම සිතෙහි මතුවන්නේ රාග, ද්වේශ, මෝහ මුල් තම සිත තුළම තවමත් ඇති නිසා බවයි.

ඒ අනුව ද්වේශයක් මතුවෙනවාත් සමගම ද්වේශ සිත ප්‍රහාණය කර මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණයන් සිත තුළ වැඩි දියුණු කරගෙන ද්වේශ මූල සිත් සහමුලින්ම කපාහැර ශුද්ධ පවිත්‍ර කර ගත යුතුය.

මෙසේ කුණු සලාහැර කුණු මුල් කපා දැමීම කුසල් සිත් වැඩීමයි. මේ ආකාරයටම රාග මුලික කාම විතර්කයන් තම සිතෙහි මතුවුවහොත් තම සිතෙහි රාග මුලයක් පවතින බව දැක රාග මුලය සහමුලින්ම කපාහැර සිත ශුද්ධ පවිත්‍ර කර ගැනීමට ඡන්ද රාගය කාමච්ඡන්දය කපා හැර සිත සහමුලින්ම පිරිසිදු කරගත යුතුය. මෙය කුණු සලාහැර කුණුමුල් කපාහැර කුසල මුල සිත් වැඩීමයි. මේ ආකාරයටම මෝහ මුල පාප විතර්කයන් තම සිතෙහි මතුවනවාත් සමගම එයද ප්‍රහාණය කර ත්‍රිලක්ඛණය මෙනෙහි කර කුසල් සිත් වඩා ගන්නට සුදුසු කර්මස්ථානයක් භාවිතා කිරීමද කළ යුතුය. මේ අනුව තම සිතම පාරිශුද්ධ තත්වයට පත් කර ගන්නට කුණු සලාහැර අධ්‍යාත්මය පිරිසිදු කර ගන්නට කටයුතු කිරීම මාර්ගය පිරීමයි.

කුණු සලාහැර තම සිත පිරිසිදු වීමත් සමගම ප්‍රඥාවද පහළ වේ. ප්‍රභාෂ්වර සිතද මතුවේ.

මෙතෙක් කලක් සංසාර ගමන යෑමට තමන්ට උපකාරි වූ ආසව සියල්ලම බිය කර අඳුරු පටලයන්ගෙන් සිත නිදහස් වේ.

මජ්ජිමා පටිපදා භාගවතේන අභිසම්බුද්ධා යනුවෙන් පෙන්වා වදාලේ බුදුපියාණන් වහන්සේ අරිහත් තත්වයට පත්වීමට මග පිරූ ආකාරයයි.

අරිහත් තත්වයට පත්වන්නට හැම කෙනෙක්ම මේ ආකරයෙන් මදයෙන් හෙවත් ඉන්ද්‍රියන් හය මත්වීමෙන් මිදී නිදහස් විය යුතුය.



තවද උන්වහන්සේ අරිහත් මාර්ගය සම්පූර්ණ කර ගැනිමේදී අභියෝග ජයගත් ආකාරය මෙසේ පෙන්වා දෙන සේක.

අරිහත් මාර්ගය පිරීම, අරිහත් මාර්ගය සම්පූර්ණ කර ගැනීම යනු දැඩි ජලපහරක් ඇති ගංගාවකින් එගොඩ වීමට පිහිනා යෑමක් වැනි ක්‍රියාවකි. ඕඝ නැමැති දැඩි රළු ජල පහරෙහි නොගිලී රාග, ද්වේශ, මෝහ වලට නොබැඳී, විඤ්ඤාණයේ මතුවන වංචක ධර්මවලටද නොරැවටී, ථිනමිද්ධයට ද නොඇලී, ආලෝක සංඥාවන්ගෙන්ද මත් නොවී, අසංඥ තත්වයටත් පත් නොවී, සංඥා වේදයිත නිරෝධ සමාපත්තියට පත්වීම සඳහා මෙහිදී නොපසුබට උත්සාහයෙන්ම ක්‍රියාකළ යුතුය.

ගඟදිය පීනා යද්දී දැඩි සැඩ දිය පහරටද ඔරොත්තු දිය යුතුය. කෙලෙස් කුණු කහට වැනි බොහෝ මාර පාක්ෂික බලවේගයන්ද ඉදිරියට ඒමත් සිදුවෙයි. තමන්ගේම විඤ්ඤාණය ආහාර සොයමින් තමා නොයෙකුත් ප්‍රිය අරමුණුවලට, රාග අරමුණු වලට, ද්වේශ අරමුණුවලට, අවිද්‍යා සහගත වු මමත්වය. මානය මතුකරන සිතිවිලි සිතෙහි මතු කරන්නටත් උත්සාහ දරයි. මේ අවස්ථාවේ සම්මා සතිය පවත්වාගෙන සතර සතිපට්ඨානයෙන් කල් ගෙවීමට ලැබූ පුහුණුව අත්‍යවශ්‍ය වෙයි. මෙවැනි වංචක ධර්මයන්ට ගොදුරු වීමෙන් මෙතෙක් වැඩු මග සහමුලින්ම කැඩී බිඳී නැවතත් මුල සිටම මග වඩන්නටද සිදුවේ. මෙවැනි වංචක ධර්මයන් තමාම තේරුම් ගෙන ඒවායින් ගැලවී ඒවා අතහැර තමාම නිදහස් විය යුතුය. මාර පාක්ෂික බලවේග යනු මේවාය. සියලු බාධක අතහැර මිදී නිදහස්ව කුණු ඉවත් කරමින් කුසල් පුරා ජලාශයේ එගොඩටම පීනා එගොඩටම ගොඩවීම අරිහත් මාර්ග ඵලයට පත්වීමයි.

තමන් එගොඩටම පීනා එගොඩට වී හති ඇර අවසානයේ තමන් පීනා එගොඩ වූ රළු ජලපහර දෙසට ආපසු හැරී බැලීමක් වැනි දෙයකි. ප්‍රත්‍යාවේක්ෂා නුවන පහළවීම.

තමා ප්‍රහාණය කර නිදහස් වු රාග, ද්වේශ. මෝහ සියල්ලම මෙතෙක් තමන්ගේම අවිද්‍යාවෙන්ම නොදන්නා කමෙන් උපාදානය කරගෙන කරගහගෙන සිටි කුණු කන්දරාව කුණු ගොඩ තමාටම දකින්නට ලැබෙන්නේ

ප්‍රත්‍යාවේක්ෂා නුවණ පහලවීමත් සමගයි.

තවද අරිහත් මාර්ගය සම්පූර්ණ කර ගැනිමට සච්චිකරණ ධර්මයන්ද සම්පූර්ණ කරගත යුතු බව උන් වහන්සේ වදාරන සේක.

බුදුරජාණන් වහන්සේ ප්‍රායෝගික වශයෙන්ම අවබෝධ කරගත යුතු සච්චිකරණ ධර්මයන් සතර දෙනෙක් අංගුත්තර නිකායෙහි පෙන්වා දී ඇති බව සඳහන් කරමින් උන් වහන්සේ ලියා දක්වා ඇති විස්තරයක් පහතින් ලියාදක්වමි.

සච්චිකරණ ධර්මයෝ සතර ආකාර වෙයි.

1. ධම්මා කායේන සච්චිකරණීයා
2. ධම්මා සතියා සච්චිකරණීයා
3. ධම්මා චක්ඛුනා සච්චිකරණීයා
4. ධම්මා පඤ්ඤාය සච්චිකරණීයා

කායේන සච්චිකරණීයා ලෙස උන්වහන්සේ පෙන්වා දෙන්නේ අෂ්ඨ විමෝක්ඛ ධර්මයන් සම්පූර්ණ කරගැනීමයි. එනම් ලෝකෝත්තර සම්මා අංග පිළිබඳ යථා දැනුමක් ලබාගෙන තමා තුළ ඇති ආසවක්ඛය කර මිදී නිදහස් වීමේ පහසුම ක්‍රමයයි. මෙය ප්‍රඥා විමුක්තියයි. මිදීම හෙවත් විමුක්ත වීම මෙහිදී සිදුවෙයි.

සතියා සච්චිකරණීයා ලෙස පෙන්වා දෙන්නේ තමන් තුළම ක්‍රියාත්මක වන හේතුඵල පරම්පරාව පිළිබඳ ඇතිවූ පූර්ණ අවබෝධයයි. පුබ්බේ නිවාසානුස්සති පැවැත්විය හැකි වන්නේද හේතුඵල පරම්පරාව දිගේ විපස්සනා නුවණින් අතීතය දැකිමෙන් පැවැත්මේ ඇත්ත ඇති සැටියෙන් දැකීමෙනි.

චක්ඛුනා සච්චිකරණීයා ලෙස පෙන්වා දෙන්නේ හේතුඵල පරම්පරාවේම ඇති නැති වීම නැමැති චුති උපත පිළිබඳව යථා පරිදි මනසිකරණය කිරිමටත් හේතුඵල පරම්පරාව ඇතිවෙනු නැති වෙනු දැකීමත් සමග ලබන දැනුමකි. මෙය චුතුපපාත ඥානය ලෙසින්ද සමහර



විට විග්‍රහ කෙරෙයි.

පඤ්ඤා සච්චිකරණීයා ලෙස පෙන්වා දෙන්නේ හේතුඵල පරම්පරාවක් නොනැසී තමන් තුළම ක්‍රියාත්මක වන්නට මුල් වූ ආසව දැක ආසවක්ඛය කර ආසව වලින් නිදහස් වී මිදෙන්නට අවශ්‍ය ප්‍රඥා ශක්තිය උත්පාදනය කර ගැනිමයි.
කෙලෙස් කහට ආසව දැක දවාහැරිමත් සමගම ප්‍රභාෂ්වර චිත්තයද මතුවී ප්‍රඥාව ක්‍රියාත්මක වන්නට පටන් ගනී. මෙතෙක් කලක් සිත තුළ ක්‍රියාත්මක වූ විඤ්ඤාණ ශක්තිය සහමුලින්ම අවසන් වී චිත්ත ශක්තිය මතුවීම මෙහිදී සිදුවෙයි. දැන් අධ්‍යාත්මික අභ්‍යන්තර පාරිශුද්ධ චිත්ත ශක්තියක් මිස කෙලෙස් වලින් ආසව වලින් කිලිටි වී අදුරු සිතක් තමන් තුලින් පහලවීම සදාකාලටයම අවසන් වී යයි.

උන් වහන්සේ අත්විඳගත් මගපළ  ලාභයේ නිදහස නිවන් සුවය භුක්ති විඳීමට හැකිවුයේ අරහත් ඵල සමාපත්තියට පත්වීමත් සමග බව උන් වහන්සේ වදාරන සේක. මෙය ඉහාත්ම සුඛ විහරණය ලෙසින්ද ධර්මයේ නම්කර ඇත.

උන් වහන්සේ ලැබූ නිදහස් සුවය විස්තර කරන්නේ මෙසේය.

මෙතෙක් කල් සංසාරයේ ඉතා දීර්ඝ කාලයක සිට කර ගසා ගෙන බරට බරේ අමාරුවෙන් දුක් විඳිමින් ගෙනා කුණු මල්ලම අහකට විසිකර දමා සදහටම ඉන් නිදහස් වු බව දැක ඒ නිදහස භුක්ති විඳිම එක් සුවයකි.

ගසකට බැඳ සිටි කෙනෙකු සියලු බැමි වලින් මිදී බැමි ලෙහා නිදහස්වීම වැනි සුවයක් ලැබීම සංයෝග වලින් මිදී නිදහස් වීමයි.

බරපතල වැඩ සහිතව දඬුගෙට නියම වුවෙකු සිරකූඩුවෙන් නිදහස ලැබීම වැනි නිදහස් සුවයක් දැනීම තවත් සුවයකි.

කාන්තාරයක අතරමං වුවෙකු කතර ගෙවා ක්ෂේම භූමියකට පැමිණ නිදහස් සුවයෙන් කල් ගෙවන්නාක් වැනි සුවයක් අත්විඳ ගන්නට ලැබිම තවත් සුවයකි.

මෙලෙස අර්හත් මාර්ගය සම්පූර්ණකොට අර්හත් ඵලයට පත්වූ උන් වහන්සේ විග්‍රහ කරනුයේ අර්හත් මාර්ග ඵලයට පත්වී කල්යත්ම සමාපත්තිය ප්‍රගුණ වී මොහොතකින් අර්හත් ඵල සමාපත්තියට සම වැදි මගඵල බුක්ති විඳිමේ හැකියාව හා ශක්තියද ලැබෙන බවයි. මෙය අතහැර මිදී නිදහස් වීමේ සුවයයි. ශූඤ්ඤත සමාධි සුවයයි. අනිමිත්ත සමාධි සුවයයි.

මිනිසුන් දහසක් අතරේ පවා මහා රණ බිමකදි පවා, කල්ප විනාශකදී පවා, අරහතුන් වහන්සේට මොහොතකින් අර්හත් ඵල සමාපත්තියට සම වැදී සියල්ලෙන් මිදී නිදහස්ව සතර බ්‍රහ්ම විහරණයෙහි යෙදී අනෙකුත් අවශේෂ ලෝකයා වෙතද මෙත්තා චිත්ත කිරණ පතුරුවා සෙත් පැතිම කළ හැකිවෙයි. අර්හත් ඵල සමාපත්තියට පත්වූ අරහතුන් වහන්සේට අතීත කර්ම ශක්තියක් ඵල විපාක දීමට ශේෂ වීතිබුණේ නම් මේ ජිවිතේදීද ඒවාද ගෙවා නිමකළ යුතුය. ඒවා ගෙවා නිමකර අවසන් වන තුරු පිරිනිවීම සිදුවන්නේද නැත.

තවද උන්වහන්සේ පෙන්වා දෙන පරිදි මාර්ගය සම්පූර්ණ කරගත් මහඵල ලැබූ අරහතුන් වහන්සේ (රාගයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් ඉන්ද්‍රියයන් හයෙන්ම රහ බැලීම සම්පූර්ණයෙන්ම අත්හැරි උතුමන්)ය

අභිඤ්ඤෙය්‍යියං - අභිඤ්ඤාතං
පරිඤ්ඤෙය්‍යියං - පරිඤ්ඤාතං
භාවේතබ්බං - භාවිතං
පහාතබ්බං - පහීනං

යන සතර ආකාරයේ මාර්ගය පූර්ණ කරගත් අයෙකි. සතර අවස්ථාවකදීම මාර්ග හතරම ගෙවා දමා ඵල සිත් උපදවා ගත් උත්තමයෙකි.

දැන් කිසිසේත්ම අවිද්‍යා, සංකාරයකට බැදීමක්, ඇලීමක්, පටලැවීමක් නැත. කිසිම ප්‍රිය වස්තුවක් කෙරේ තණ්හාවක්, උපාදානය කර ගැනීමක්, අයිති කර ගැනීමත් අර්හතුන් වහන්සේ අතින් සිදු නොවේ.



කිසිම පුද්ගලයෙක්, වස්තුවක්, හෝ අවස්ථාවක් දෙස රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් බලා සිත කිලිටි කර ගන්නේද නැත. නිතරම සිතේ පවතින්නේ අපරිමිත උපේක්ඛා ගුණයකි.

පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතයන්ගෙන්ම සැදුම් ලත් විපරිනාමයට පත් වී, විනාශ වී ගෙවී යන දෙයක් තුලින් කිසිම සාරවත් බවක් අර්හතුන් වහන්සේ නොදකී.

ඉහාත්ම සුඛ විහරණයෙන් කල් ගෙවීමත් සතර බ්‍රහ්ම විහරණයෙහි යෙදී. අවශේෂ ලෝකයා වෙත මෙත්තා චිත්ත කිරණ පැතිරවීමත් අර්හතුන් වහන්සේගේ නියත සිරිතයි.

මෙයට අමතරව දේශනා ප්‍රාතිහාර්ය, ආදේශනා ප්‍රාතිහාර්ය, අනුශාසනා ප්‍රාතිහාර්ය ලැබූ අරහතුන් වහන්සේලා තමා අවබෝධ කරගත් උතුම් ධර්මය ලෝකයා වෙත දේශනා කර අවශේෂ ලෝකයාටද නිවන් මඟ විවෘත කර දීමේ ඒකායන පරමාර්ථයෙන්ම කටයුතු කරයි. දේශනා ප්‍රාතිහාර්ය හෝ ආදේශනා ප්‍රාතිහාර්ය හෝ නැති අරහතුන් වහන්සේලා නිහඬව සමවත් සුවයෙන් කල් ගෙවනු ලබයි.

රාගයෙන් තොර වූ, ද්වේශයෙන් තොර වූ, මෝහයෙන් තොර වූ උපේක්ඛා සහගත සිතෙන් යුත්ත වූ විවේක නිශ්‍රිත, විරාග නිශ්‍රිත, නිරෝධ නිශ්‍රිත වොස්සග්ග පරිනාමී සමවත් සුවයෙන් වාසය කරන අර්හතුන් වහන්සේ අවශේෂ ලෝකයා වෙත අනන්ත අප්‍රමාණ ශක්තියෙන් යුත් මෙත්තා සහගත චිත්ත කිරණ පතුරවමින් අපවත් වන තුරුම ඉහාත්ම සුඛ විහරණයෙන් කාලය ගෙවයි.

දැන් තමාගේ සිතෙහි මිනිස් ලොව පිළිබඳ හෝ දෙව්ලොව පිළිබඳ හෝ වෙනත් කාම ලෝක හෝ රූප, අරූප ලෝකයක් පිළිබඳව කිසිම බැඳීමක්, ඇලීමක්, උපාදානය කර ගැනීමේ කැමැත්තක් නැත.

කිසියම්ම ආකාරයක ප්‍රිය මධුර දෙයක් පරිහරණය කිරීමට හෝ එකතු කර අල්ලා ගැනීමට හෝ බලාපොරොත්තුවක් පවා අරමුණක් පවා

සිතෙහි මතු නොවේ. භව නිරෝධ කල අරහතුන් වහන්සේගේ සිතෙහි මතු ජීවත්වීමේ කිසිම අවශ්‍යතාවක් නොවෙයි. විශ්වයෙන් ණයට ගත්, උපාදානය කරගත් පංචඋපාදානස්කන්ධම අතහැර නිදහස් වූ නිසා දසබිම්බර මාර සේනාවෙන් නිදහස් විය. මාරයාට ගෙවා දමන්නට ඇති ණය කලින්ම ගෙවා අවසන් ව ඇති නිසා මරණ භයක්ද නැත. මරණය යනු කුමක්ද කියා අරිහතුන් වහන්සේ ඇත්ත ඇති සැටියෙන් දැකගෙන ඇත. ඒ නිසා මරණ වේදනාවක්ද නැත.

මරණය ලංවත්ම සංඥා වේදයිත නිරෝධ සමාපත්තියට, අරිහත් ඵල සමාපත්තියට පත් වීමෙන් වේදනා නිරෝධ කරගත් අරිහතුන් වහන්සේට අපවත් වීම නම් පැවැත්ම අවසන් කර ගැනීමද ස්වභාවික දෙයකි.

මේ ආකාරයෙන් අරහත් ධජය හෙවත් සඟ සිවුරු පැලඳීමට අවස්ථාව සැලසී ගිහි ජීවිත ගණුදෙනුවෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වී වර්ෂ 2007 අගෝස්තු 15 වෙනිදා රත්නපුර අමරපුර නිකායේ සංඝනායක පූජ්‍ය මඩලවල වජිරබුද්ධි ස්වාමීන්වහන්සේ අභිමුව උන්වහන්සේ මීවනපලානේ සිරිධම්මාලංකාර හිමි නමින් සසුන් ගත වී ඇත.

උන්වහන්සේ අරහත් ධජය පැලඳි ස්ථානයත්, අතීතයේ සමන රජතුමාගේ රජමාලිගාව තිබු ස්ථානයත් එකම ස්ථානයක් බවත්, එසේ වුයේ සමන රජතුමා සමඟ වූ අතීත සම්බන්ධතාවයක් මත බව මම උන්වහන්සේගෙන් අසා දැනගතිමි.

දිවා ගුහාව බුදුන් වහන්සේට පූජා කොට ඇත්තේ සමන රජ තුමාය සමනල කඳු මුදුනේ සිරි පාද ලාංඡනය පිහිටු වීමට කටයුතු කොට ඇත්තේද සමන රජ තුමාය

උන්වහන්සේ දිනක් දිවාගුහාවට වැඩි දවසක සිදුවු ආශ්චර්යමත් සිදුවීම දිවා ගුහාව සොයාගත් වැලිකල මහතා දැන සිටින්නේය.

උන්වහන්සේගේ මේ අතීත වර්තමාන හේතුඵල සම්බන්ධතාවය



තුලිනුත් අපට උගෙන ගත හැකි පාඩම් ගැබ්වී ඇත. හේතුඵල සම්බන්ධතාවය අනුව පින, පව විපාක දෙන අයුරුත්, ලෝකෝත්තර පුණ්‍ය ශක්තිය නිවන් අවබෝධ කරගැනීමට හේතුවන අයුරුත් සත්වයාගේ පුනරාගමනයත් ඒ අනුව ගති ස්වභාව උරුම වන අයුරුත් ආදී බොහෝ කරුණු අත්දැකීම්, උදාහරණ තුලින් අපට අවබෝධ කර ගැනීමට උන්වහන්සේගේ ජීවිත කථාව අපට පාඩම් පෙන්වා දෙන සේක.

## මනුෂ්‍යත්වය සහ බුද්ධත්වය

මනුෂ්‍යත්වය

මනුස්සත්ව පටිලාභෝ පරම දුර්ලභෝ ලෙස බුදුන් වහන්සේ දේශනා කොට ඇත. එම දේශනා පාඨයේ අර්ථය සත්‍යම බව ආදර්ශයෙන් අපට පෙන්වා දෙන්නේ අතිපූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර හිමිපාණෝයි.

මනුෂ්‍යත්වයේ අගය නොදන්නා වර්තමාන මනුෂ්‍යයෝ දෙවි, බ්‍රහ්ම ආත්ම පතාගෙන පින් දහම් කරමින් වටිනා මනුෂ්‍යත්වයට අවමන් වන බොහෝ කටයුතු කරමින් අනන්ත දුක් පොදියකට උරුම කම් කියනුයේ උතුම් බුද්ධ ධර්මය නොදන්නා කමිනි.

සියළුම මනුෂ්‍යයන්ට මනසක් හෙවත් මැන බලා තෝරා බේරා විමසීමකට ලක්කොට කැමති, අකමැති අනුව කටයුතු කිරීමේ හැකියාවක් ඇති ඥාණ විශේෂයක් උපතින්ම උරුම වී ඇත.

තවද මනස යනු සකස් කර, පුහුණු කර, පිරිසිදු කර දියුණු කර ගත හැකි ඥාණ විශේෂයක් ලෙස උන්වහන්සේ පෙන්වා දෙන සේක.

තවද සියලුම සත්ව ජාති අතරින් උතුම්ම උප්පත්තිය දේවත්ව,

බ්‍රහ්මත්ව නොව  මනුෂ්‍ය ජාතියම බව උන්වහන්සේ උතුම් බුද්ධ ධර්මය තුලින් පෙන්වා දෙන්නේ දේවත්ව පටිලාභෝ පරම දුල්ලභෝ හෝ බ්‍රහ්මත්ව පටිලාභෝ පරම දුල්ලභෝ ලෙස බුදුපියාණන් වහන්සේ කිසිදා දේශනා කොට නොමැති බව පෙන්වා දීමෙනි.

දෙවියන්ට මනුෂ්‍ය ලොවින් සිරිසද්ධර්මය ශ්‍රවණය කිරිමට නම් දිව කන් මනුෂ්‍ය කන් ස්වරූපයටත්, දිව්‍ය ඥාණය මනුෂ්‍ය මනස ස්වරූපයටත් පරිවර්තනය කර ගත යුතු අතර, එසේ කල හැක්කේද සියළුම දෙවියන් අතරින් සම්‍යක්දෘෂ්ඨික හෙවත් මගඵල ලාභී දෙවියන්ට පමණක් බවත් උන්වහන්සේ පෙන්වා දෙන සේක. දුක නොවැටහෙන දෙවියන්ට මනුෂ්‍යයන්ට මෙන් සිරිසද්ධර්මය ශ්‍රවණය කොට අවබෝධ කර ගැනීම ද අපහසු තත්වයකි. එනම් නිවන් අවබෝධ කර ගැනීමද අපහසු තත්වයකි.

මනුෂ්‍ය මනසක් අනන්ත අරමුණු හා අවශ්‍යතා ඔස්සේ පුහුණු කිරීමෙන් විශාල ශක්තියක් හා හැකියාවන් අත්පත් කරගෙන, බොහෝ නිර්මාණ බිහිකර ගෙන, ලෝක පැවැත්ම වඩ වඩා තණ්හා උපාදානයෙන් අල්ලා ගෙන, දිර්ඝ සංසාර පැවැත්මක් උරුම කර ගැනීමේ හැකියාවක් මනුෂ්‍ය මනසක් සතුය.

එහි විරුද්ධ පැත්තද එසේමයි. එනම් අනන්ත වූ අරමුණු හා අවශ්‍යතා වලට ඇතිවන කැමැත්ත අතහැර, විශාල ශක්තීන් හා හැකියාවන් අත්පත් කරගැනීමේ කැමැත්ත අත්හැර, ලෝක පැවැත්ම තණ්හා උපාදානයෙන් අල්ලා ගැනීමේ කැමැත්ත අත්හැර එවැනි සියළුම කැමති තමා තුල ඇති වනුයේ තමා රැවටීමකට අසු වීමෙන් බව අවබෝධ කරගෙන රැවටීමකට අසුවන සියළුම කැමති වලින් ඉවත් වීමට මනස පුහුණු කර, පිරිසිදු කර දිර්ඝ සංසාර පැවැත්මෙන් සදහටම මිදී නිදහස් විය හැක. මේ අනුව සංසාර දුකෙන් සදහටම මිදී නිදහස් විය හැක. මේ සඳහා අනුගමනය කල යුතු වැඩ පිළිවෙල උතුම් බුද්ධ ධර්මය තුලින් අසා දැනගත යුතු වේ.

මේ අනුව මේ සියළුම තත්වයන් උරුම වනුයේ මනුෂ්‍යයා තම තමාගේ කැමැත්ත අනුවම කටයුතු කිරීමෙන් මිස වෙනත් කිසිම



කෙනෙකුගේ පිහිට ආධාරයකින් හෝ නොපෙනෙන දේව බලවේගයකින් හෝ නොවන්නකි.

"අත්තාහි අත්ත නෝ නාථෝ කෝහි නාථෝ පරෝසියා" ලෙස බුදුන් වහන්සේද මේ බව විග්‍රහ කර ඇති බව අප අසා ඇත්තෙමු.

සියළුම සත්ව කොට්ඨාශ වලට කවදා හෝ මනුෂ්‍ය ජාතියක් උරුම වනුයේ දුක් උපදවන අනන්ත වූ සත්ව ජාති වල උප්පත්තිය ලබා අනන්ත දුක් විඳීමෙන් පසු තීරණයක් ගැනීමටය. එනම් තව දුරටත් දුක් උපදවන විවිධ සත්ව ආත්ම වල ඉපදී දුක් විඳිනවාද නැතහොත් සදහටම දුකින් මිදී නිදහස් වී සත්වයන් ලෙස  උප්පත්තිය ලබන වැඩ පිළිවෙලින් මිදී නිදහස් වෙනවාද යන්න තම කැමැත්තෙන් තීරණය කොට ඒ අනුව කටයුතු කර ගැනීමටය.

උන්වහන්සේ පෙන්වා දෙන්නේ බුදුන්වහන්සේ පෙන්වා දුන් මනුෂ්‍යත්වයේ වටිනාකමයි.

එසේ පෙන්වා දෙන මනුෂ්‍යත්වයේ වටිනාකම මෙසේය.

1. මිනිසෙකු ලෙස උපත ලැබීම පරම දුර්ලභ අවස්ථාවකි.
2. බුද්ධෝත්පාද කාලයක මිනිසෙකු ලෙස උපත ලැබීම පරම දුර්ලභ අවස්ථාවකි.
3. පරම පවිත්‍ර සිරි සද්ධර්මය ශ්‍රවණය කරන්නට ලැබීම පරම දුර්ලභ අවස්ථාවකි.
4. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලැබීම පරම දුර්ලභ අවස්ථාවකි.
5. ඛණ සම්පත්තිය ලැබීම පරම දුර්ලභ අවස්ථාවකි.

ඛණ සම්පත්තිය ලැබීම යනු මිනිසෙකු ලෙස උපත ලබා පරම පවිත්‍ර සිරිසද්ධර්මය ද ශ්‍රවණය කරන්නට ලැබ්, මනස මෙහෙයවා එය අවබෝධ කර, ප්‍රඥාව සත්‍යාවබෝධය ලැබීමෙන් සංසාර බැම් තුන කපා දැමීමට හැකියාවක් ලබා ගැනීමයි.

මනුෂ්‍යත්වයට හිමි වූ මේ පරම දුර්ලභ අවස්ථාවන් පැහැදිලිව හඳුනාගෙන එහි වටිනාකම අවබෝධ කරගෙන, ඒ අනුව කටයුතු කර බුද්ධ ශ්‍රාවකයෙකු ලෙස එයින් ලබාගත හැකි උතුම්ම තත්වයට පත් වූ උන්වහන්සේ අපටද එසේ කටයුතු කොට උසස්ම තත්වයට පත් විය හැකි බව උන්වහන්සේ පෙන්වා දෙන සේක.

උන්වහන්සේ ලියා දක්වා ඇති මනුෂ්‍යත්වය පිළිබඳ වූ විස්තරයකින් කොටසක් පහතින් ලියා දක්වයි.

“මිනිස් කයක් (ශරීරයක්) ලබා මිනිසෙකු ලෙස උපතක් ලැබීම එකකි. මිනිසත් බවට පත් වීම තවත් එකකි”

මිනිස් කයක් ලැබූ බොහෝ දෙනෙක් මිනිසත් බවට නොගැළපෙන, මිනිසත් බව කෙලෙසන පහත් කිලිටි වැඩ කරති. එවැනි මිනිස්සු මිනිස් කයෙන් ජීවත් වෙමින් තිරිසන් බවට, ප්‍රේත බවට, යක්‍ෂ බවට, අමනුෂ්‍ය බවට පත්ව සිටිති. කලාතුරකින් කෙනෙකු මිනිස් කයෙන්ම දෙවි බවට පත්ව ඇත.

මිනිසත් බවට පත්වීම යනු තම ගතිගුණ, ගති හඬ, ගති රුව, ගති බල, ගති බව මිනිසත් බවට සුදුසු ලෙස ගැළපෙන ලෙස පවත්වා ගෙන යෑමයි.

සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් කරන සියළුම ක්‍රියාවන් ගතිගුණ, ගති හඬ, ගති රුව අනුවම සකස් කරගත් ඒවාය.

කිලිටි පහත් තත්වයේ ගතිගුණ පැවැත්වීමෙන් මිනිසත් බව කෙලෙසෙයි. මිනිස් කයින් පෙනී සිටියත් තිරිසනෙකු, ප්‍රේතයකු, යක්‍ෂයකු, අමනුෂ්‍යයකු ගේ ගතිගුණ, ගති හඬ, ගති රුව විදහා පායි.

මිනිසත් ජීවිතයක උපත ලබා මිනිස් බවට නොගැළපෙන ගතිගුණ පුරුදු කිරීම, පුහුණු කිරීම මිනිසත් බව කෙලෙසීමක් වන අතර පුරුදුකළ, පුහුණු කළ ගතිගුණ අනුව, සංඛාර අනුව මේ ජීවිතයේදීම මිනිසත් බවෙන් තුරන් වන අතර මතු කල්ප කාලාන්තරයකට මිනිසෙකු ලෙසින් නැවත උපත



ලැබීමේ අවස්ථාවද තමන්ම අහිමි කර ගනී.

පින්පව් වලට වඩා හේතුඵල දහම මතු ජාතිය සකස් කර ගැනීමට උපකාර වන බුද්ධ දේශනාවයි. හේතු ඵල ධර්මතාවය ගැන අසා දැන යම් අවබෝධයක් ලබා මිනිස් කමට ගැළපෙන, මිනිස් බව රැකෙන ගති ලක්‍ෂණ පුරුදු කිරීම, පුහුණු කිරීම, පවත්වාගෙන යෑම මතු සුගතියක උපත ලැබීටමත්, නිවන් දැක දුකින් මිදීමටත් හේතු වේ.

මනසින් මැන සිතා බලා නිගමනය කිරීමත් කල්පනා කර තීරණයක් ගැනීමත් මිනිසාට උරුම වූ ගති ලක්‍ෂණයකි. ශක්තියකි.

තමන්වම හෝ වෙනත් සත්වයකු හෝ වැනසීමට, පීඩාවට පත් කිරීමට, පහත් කොට සැලකීමට, අවමානයට පත් කිරීමට, වෛර කිරීමට හේතුවන කිසිම සිතිවිල්ලක්, කථාවක්, ක්‍රියාවක්, මිනිස් බවට නොගැලපෙයි.

පෙරකල පින් බලයෙන් අද මිනිස් කයක් දැරුවත් බල්ලෙකුගේ ගතිගුණ ප්‍රදර්ශනය කලොත්, පුරුදු පුහුණු කලොත් ඔහු මිනිස් කයෙන්ම සිට බලු බවට පත් වූවෙකි.

බල්ලන්, හරකුන්, කුරුල්ලන්, කොටි වැනි සතුන්ද, කුහුඹුවන්, වේයන්, ක්‍ෂුද්‍ර ජීවීන් වැනි කුඩා සතුන්ද ලෙස උපත ලබන්නේ තම තමන් සංසාරයේ පුරුදු පුහුණු කල ගතිගුණ ඵල විපාක ලෙස තමන්ටම උරුම වීමෙනි. මෙය හේතුඵල දහමයි, හේතුඵල දහම ලොව පැවැත්මට, විපරිනාමයට වෙනස් වීමට, බිහිකිරීමට මෙන්ම විනාශයටද බලපාන එකම ශක්තියයි, යන්න කවදාවත් කාටවත් වෙනස් කල නොහැකි සිද්ධාන්තයකි. මේ ධම්ම නියාමයයි. මේ බව තේරුම් ගෙන මිනිසෙකු ලෙස උපත ලත් මේ ජීවිතයේදී හැම කෙනෙකුම කල්පනා කල යුත්තේ, මනස මෙහෙයවා නිගමනය කල යුත්තේ, ලැබූ මිනිසත් බවට ගැළපෙන ගුණ ධර්ම ගති ලක්‍ෂණ, සුචරිතය, සංවරත්වය පුරුදු පුහුණු කර මතු මතුත් මෙවන් උතුම් මිනිසක් බවක් හෝ ලැබීමට සුදුසු සිතුවිලි ක්‍රියා, වදන් ප්‍රගුණ කළයුතු බවයි.

මිනිසෙකුව උපන් හැම කෙනෙකුටම යම් පමණකට ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා යන සම්පත් ලැබී ඇත. වෙන කිසිම සත්වයකු, දෙවියකු මේ සියලු සම්පත් ලබා උපත නොලබයි.

පින් පව්, කුසල් අකුසල් වෙන් කොට දැන හඳුනා ගත හැක්කේ, අසා දැන අවබෝධ කරගත හැක්කේ මිනිසෙකුට පමණි. ලෞකික ලෝකෝත්තර දෙකෙහි වෙනස අවබෝධ කරගත හැක්කේද මිනිසෙකුට පමණි.

සම්මතය හා පරමාර්ථ ධර්ම අතර ඇති වෙනස ද, භක්තිය හා ශ්‍රද්ධාව අතර ඇති වෙනස්කම්ද දැන හඳුනා ගත හැකි වන්නේ මිනිසෙකුටමයි.

පෘථග්ජන පුද්ගලයා සහ අරිය උත්තමයා, අරිය, අනරිය වෙනස්කම් මෙන්ම ධ්‍යාන හා මාර්ග ඵල ආදී කරුණු අවබෝධ කොට දැකගත හැක්කේ මිනිසෙකුටමය.

උත්තමයකු දේශනා කරන ධර්මය ශ්‍රවණය කිරීමෙන් හෝ පොත පතක ලියැවී ඇති ධර්මය තෝරා බේරා ගෙන සත්‍ය අවබෝධ කර ගැනීමට හෝ හැකිවන්නේ විපස්සනා, අනුපස්සනා කර ප්‍රඥාව වඩාගත හැකි වන්නේ, ඇසූ ධර්මය ධාරණය කර සත්‍ය සමග සම්බන්ධ විය හැකි වන්නේ චිත්ත පාරිශුද්ධිය ලබා ධ්‍යාන උපදවා ගත හැකි වන්නේ යථාවබෝධයෙන් මගඵල ලබාගත හැකි වන්නේ මිනිසෙකුටම පමණි.

බුදු බව ප්‍රර්ථනා කිරීම, බුද්ධත්වයට පත් වීම, පසේ බුදු බවට පත්වීම, මහ අරහතුන් වහන්සේලා වීම, මෙන්ම අරිය තත්වයට පත්වීම මිනිසෙකුට පමණක් කල හැකි දේවල්ය.

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයෙහි යෙදි අප්‍රමාණවූ ලෝක සත්වයා වෙත අප්‍රමාණ ලෙසින් සම මෙත පැතිරවිය හැක්කේ මිනිසෙකුට පමණි.

අනන්ත දුක් විඳින ලෝක සත්වයා වෙත මනුස්ස, අමනුස්ස, දේව,



බ්‍රහ්ම යන සතර කොට්ඨාසයටම අයත් සත්වයා වෙත සරණ විය හැක්කේ මිනිසෙකුට පමණි.

සරණ වීම යන අර්ථය තුලින් පෙන්වන්නේ ඉතා උසස් මග පෙන්වීමක් මිස පිහිට වීමක් නොවන්නකි.

එනම් සර + ණ යනු සංසාර ගමන පැවැත්වීම (සර) නැවැත්වීමට (ණ) මග පෙන්වීමයි. සංසාර ගමන නවත්වා විඳින දුක් කන්දරාවෙන් මුදවා ගැනීමට උපකාර වීමයි.

මේ අනුව සත්‍ය අවබෝධ කරගත් සියළුම උත්තමයින් මෙන් උන්වහන්සේද දුක් විඳින අනන්ත අප්‍රමාණ සත්වයන්ගේ අනාථ බව දැක, ඒ දුකින් සත්වයා මුදවා ගැනීමේ පරම අධ්‍යාසයෙන්ම සත්වයන්ට සරණ වන සේක.

අවංක පිරිසිදු පහන් සිතින්ම සම මෙත පතුරා කරන පැතුම සියළු සත්වයාට සරණ වීමකි. එනම් සත්වයාට සංසාර ගමන නවතා දුකින් මිදීමට උපකාරීවන පිරිසිදු ශක්තියක් විහිද වීමයි.

එසේ සම මෙත පතුරුවා සත්වයාට සරණ විය හැකි පරම මෛත්‍රී භාවනාව උන්වහන්සේ පෙන්වා දෙන්නේ මෙසේය.

මමද සියළු ලෝක සියළු සත්වයෝද,
සතර අපා දුක දක්වා සියළු දුකින් මිදී
සෝවාන් ඵලයෙන් නිදුක් වෙත්වා !

කාමරාග පටිඝ ආදි රෝගයන්ට මුල්වන සියළු කරුණු වලින් මිදී,
සකෘදාගාමී ඵලයෙන් නීරෝගී වෙත්වා !

නිරාමිස සුවයෙන් අනාගාමී ඵලයට පත්වී,
අනාගාමී ඵලයෙන් සුවපත් වෙත්වා !

සදහටම සංසාර දුකින් මිදී නිදහස් වන,
අරහත් ඵලයෙන් දුකින් මිදෙත්වා !

නිවන් සුවයෙන් සුවපත් වෙත්වා ! .////

සෝවාන් ඵලයට පත්වූ කෙනෙකු නැවත කිසිදා සතර අපායේ නූපදිමෙන් එක්තරා ප්‍රමාණයකට දුකෙන් මිදෙයි. තවද ජීවිත පැවැත්ම තුල කටයුතු සැලසෙනුයේ නිවන් අවබෝධ කර ගැනිමට උපකාර වන ලෙසයි.

සකෘදාගාමී ඵලයට පත්වීමෙන් කිසිදා සැහීමකට පත නොවන ඉන්ද්‍රියන් හය පිනවීමේ කැමැත්ත නිසා බිහිවන ආස්වාද රෝගයන් සදහටම මිදීමෙන් නිරෝගී වේවා ලෙසින් නිවනට යොමු කිරීමක් කෙරේ.

ආමිස සුවයෙන් මිදී උතුම් නිරාමිස සුවය අත්විඳ ගන්නේ අනාගාමී ඵලයට පත් වීමෙනුයි. ඒ අනුව නිවනට උපකාරී ශක්තියක් විහිදුවයි.

කෙලෙස් බැමි වලින් සහමුලින්ම මිදී අරිහත් ඵලයට පත්වීමෙන් දුකෙන් සදහටම මිදෙන ලෙසින් චිත්ත ශක්තියක් විහිදවයි.

අරිහත් ඵලයට පත්වී ලබන නිවන් සුවයෙන් සුවපත්වන ලෙසද චිත්ත ශක්තියක් විහිදවයි.

තමන්ගේ ඥාති මිත්‍රයන් ආදී කිසිවෙක් උපාදානය කර නොගෙන, සියළුම දෙනාට වූ සම මෛත්‍රීයක් මෙහි ගැබ්වී ඇති බැවින් පරම මෛත්‍රී භාවනාව මෙලෙස උන් වහන්සේ අපට පහදා දෙන සේක.

මෙලෙස මෙත් වැඩීමෙන් ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, ව්‍යාපාදය පහව යයි. කල වරදට අනෙකාට නිතරම සමාව දෙයි. අනෙකෙකු වරදක් කලත් ඒ පෘතග්ජන පුද්ගලයෙකුගේ නොදැනුවත්කම නිසාම සිදුකල දෙයක් බව අවබෝධ කර ගෙන කවදා හෝ ඔහුටත් මෙය වරදක් බව අවබෝධ වේවා ! ඒ වරදින් කවදා හෝ ඔහුටද මිදීමට හැකිවේවා ! යන සිතිවිල්ල ඇතිවේ.

එයින් පිරිසිදු වන්නේ තමාගේ සිතය. නිවනට උපකාරක ලෝකෝත්තර කුසලය වැඩෙන අයුරු උන්වහන්සේ මෙලෙස පෙන්වා දෙන සේක.



එලෙසම රාගයෙන් තොර, ද්වේශයෙන් තොර, මෝහයෙන් තොර මනුෂ්‍යයින්ගේ පිරිසිදු සිත්වලින් බිහිවන චිත්ත ශක්තියේ බලය ගැන උන්වහන්සේ ලියා දක්වා ඇති විග්‍රහයක් පහතින් ලියා දක්වමි.

චිත්ත ශක්තිය ලොව පවතින එකම ශක්ති ප්‍රභවයයි. බලවත්ම ශක්තියයි. පිරිසිදු චිත්ත ශක්තියෙහි අනන්ත අප්‍රමාණ අසීමිත බලයක් ගැබ්වී ඇත. එවැනි උත්තමයෙකු කරන මෙවැනි මෙත්තා සහගත, කරුණා සහගත, මෘදු ගුණයෙන් යුතු, උපේක්ඛා සහගත පැතුමෙන් විශ්වයට නිකුත් කරන චිත්ත ශක්තීන්, චිත්ත කිරණ සාමාන්‍ය පෘතග්ජන පුද්ගලයින් ලක්ෂයක්, කෝටියක් නිකුත් කරන පැතුමකට වඩා ශක්තිමත්ය බලවත්ය ඒ යථාවබෝධයෙන්ම අවංකවම, පිරිසිදු සිතින්ම කරන පැතුමක් නිසාය. මෙලෙස බුදුපියාණන් වහන්සේලා, මහා අරහතුන් වහන්සේලා, අරිය උත්තමයින් වහන්සේලා ලෝකයාට, විශ්වයට නිකුත් කරන ලද අප්‍රමාණ චිත්ත කිරණ නිසා බිහිවූ බලවත් ශක්තියක් ලොව පවතින්නේය. ඒ චිත්ත කිරණ ශක්තීන් නිසාම, ඒවායේ බලය, ශක්තිය, ශාන්තිය නිසාම මේ ලෝකය, විශ්වය සමස්ත සත්ව වර්ගයාටම වාසය කිරීමට, ජීවත් වීමට සුදුසු සෞම්‍ය පරිසරයක් සහිත ස්ථානයක් බවට පත්වී ඇත.

රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් තොරවී උපේක්ඛා සිතක් පහදා ගැනිමට උතුම් බුද්ධ ධර්මය අසා දැන අවබෝධයක් ඇති කර ගත යුතුම වේ.

එසේ ඇති කරගත් උපේක්ඛා සිතකින්, ප්‍රබල සත්‍යක් ක්‍රියා බලයකින්, ලොව මවිත කරවන තරම් යහපත් ක්‍රියා සිදුකල හැකි බව උන්වහන්සේ පෙන්වා දෙන සත්‍යක්‍රියා බලය පතුරුවන හැටි පහතින් ලියා දක්වමි.

රාගයෙන් තොර, ද්වේශයෙන් තොර, මෝහයෙන් තොර මාගේ මේ පිරිසිදු සිතින් මුළු විශ්වයටම දස දහසක් සක්වල පුරාවට පිරිසිදු චිත්ත කිරණ විහිදේවා ! පැතිරේවා !.. ///

පඨවි, අපෝ, තේජෝ, වායෝ වලින් සැදුම් ලත් ගහ කොල,
කඳු හෙල්, ගංගා, මහ සයුර, ඇතුළු මුළු පරිසරයමත්,
සියළුම සත්වයෝත් යන මුළු විශ්ව ශක්තියම යහපත් වේවා ! ... ///

විශ්ව ශක්තිය පිරිසිදු වේවා ! .../// 

සියළුම දෙනාට යහපතක් වේවා! සෙතක්ම වේවා !
ශාන්තියක්ම වේවා ! සැනසිමක්ම වේවා !

සියළුම දෙනාගේ රාගය දුරු වේවා ! ද්වේශය දුරු වේවා !
මෝහය දුරුවේවා ! අවිද්‍යාව දුරුවේවා !
සියළුම දෙනාගේ සිත් තුල මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණ ඇතිවේවා! සියළුම දෙනා සංසාර දුකින් අත මිදී නිවන් සුවයෙන් සුවපත් වේවා!

මෙවන් වූ සත්‍යක්‍රියා බලයකින් තම තමන්ටත් අන් සියළු දෙනාටත් සිදුවන සෙත තම තමා විසින් අත් දැක ගත යුතු වේ.

ලොව මවිත කරවන, තරම්, සියළුම දෙනාට සෙත සලසන සියළුම බලය පවතින්නේ සියළුම මනුෂ්‍යයා සතු පිරිසිදු සිතෙහිය.

එහෙත් වර්තමාන මනුෂ්‍යයා තමන්ට හෝ අනුන්ට හෝ සෙත සලසා ගැනීමට නොපෙනෙන දෙවියන්, නොපෙනෙන භූත ආත්ම, ගස් වැල්, පිලිම ආදි නොයෙකුත් සජීව, අජීව දේ තුලින් ශක්තියක්, බලයක්, හැකියාවක් ඉල්ලා වැඳ වැටෙමින්, යාඥා කරමින්, යාග හෝම පූජා පවත්වමින් කටයුතු කරනුයේ නොදන්නා කමිනි. එනම් තමාට ඕනෑම වෙලාවක යම් කිසි සෙතක් සැලසෙන්නේ නම් එසේ සිදුවනුයේ තමාම බිහි කර ගත්, තමා තුලම සැඟවී ඇති පිරිසිදු ශක්තියක හෝ පුණ්‍ය ශක්තියක බලයකින් පමණි. මනුෂ්‍යයාට යහපතක්, සෙතක්, ශාන්තියක්, වාසනාවක් ආදී කුමන හෝ කැමති වූ ඵලයක් ලැබුණි නම්, එසේ වූයේ කිසිම බාහිර බල වේගයකින් නොවන්නේය, යන්න උතුම් බුදු බණ තුලින් මනුෂ්‍යයා අවබෝධ කර ගන්නේ නම් මනුෂ්‍යයා අන්ධ භක්තියෙන් කරන සියළුම අඥාණ වැඩ පිළිවෙලවල් වලින් මිදෙනු ඇත.



සියළුම පරිසරයත්, දෙවියන්, භූතයන් ඇතුළු සියළුම සත්වයෝත් සැනසෙන එකම දෙය පිරිසිදු සිත් ඇති මනුෂ්‍යයන්ගේ සිතෙන් විහිදෙන පිරිසිදු චිත්ත කිරණ ශක්තියයි. ඒ සියළුම සත්වයාට ජීවත් වීමට සුදුසු යහපත් පරිසරයක් නිර්මාණය වන්නේත් එම පිරිසිදු චිත්ත ශක්තියට අනුරූපය.

මනුෂ්‍යයාගේ පිරිසිදු සිත පෑදෙන්නේ උතුම් බුදු බණ අසා අනුගමනය කිරීමෙන්ය. මෙහි විරුද්ධ පැත්ත අවබෝධ කර ගැනීමද වැදගත් වේ. එනම් පිරිසිදු බුද්ධ ධර්මයක් නොමැති කල මනුෂ්‍යයා මනුෂ්‍යයාගේ අගය වටහා නොගනී. මෙතරම් බලගතු පිරිසිදු ශක්තියක් තම තමාගේ සිත තුලම සැඟවී ඇති බව මනුෂ්‍යයා හඳුනා නොගනි. තමාගේ පිරිසිදු චිත්ත ශක්තියට නිගා දෙන ලෙස තමා තුලම ඇති ශක්තිය අනුන් ළඟ ඇතැයි සිතා යාචකයන් සේ තමාගේ පිරිසිදු යහපත් ශක්තිය අනුන්ගෙන් යැද යැද මනුෂ්‍ය සංහතියටම අපහාස වනසේ කටයුතු කරති.

රාගය, ද්වේශය, මෝහය යන කිලිටි විඤ්ඤාණ ශක්තියෙන් කටයුතු කරමින් තම තමාගේ පිරිසිදු සිත මෝහය නැමැති අඳුරු පටලයකින් ආවරණයට කර ගෙන පිරිසිදු සත්‍යක්‍රියා බලයේ විරුද්ධ ශක්තිය හෙවත් තමනුත් අන් සියළු සත්වයෝත්, මුළු පරිසරයමත් විපතෙහි පැටලෙන ශක්තිය පතුරවමින් මනුෂ්‍යයෝ කටයුතු කරන්නේ උන්වහන්සේ පහදා දෙන උතුම් බුදු බණ නොදන්නා කමින්ය.

මේ අනුව මේ මනුෂ්‍යය ආත්මය අතීතයේ අප ඉපදී තිබූ සියළුම මනුෂ්‍යය ආත්ම වලට වඩා ඉහලම වටිනාකමක් අත් කර ගත හැකි අවස්ථාවක් බව සියළුම මනුෂ්‍යයන්ට වැටහේවා !

## බුද්ධත්වය

බුද්ධ = බව + උද්ධ

බව යනු රාග බව, ද්වේෂ බව, මෝහ බව යන කෙලෙස් බවයි. උද්ධ

යනු උදුරා ගලවා ඉවත් කර සදහටම මිදී නිදහස් වීමය.

රාග බව, ද්වේශ බව, මෝහ බව යන කෙලෙස් බව සිතකින් සහමූලින්ම උදුරා දමා බිහි කිරීමේ ශක්තිය සදහටම නවතා දමා ප්‍රඥා යන පිරිසිදුව මනුෂ්‍ය සිත පාදාගත් තත්වය බුද්ධත්වය නම් වේ.

එනම් සසරට බැදෙන බානෙත් නිදහස් වීමයි. (නිබ් + බාන)

සසරට බැදෙන රාග බැම්මෙන්, ද්වේශ බැම්මෙන්, මෝහ බැම්මෙන් සදහටම මිදී නිදහස් වීමයි.

| | |
|---|---|
| රාගක්ඛයෝ | නිබ්බානං |
| ද්වේෂක්ඛයෝ | නිබ්බානං |
| මෝහක්ඛයෝ | නිබ්බානං |

ලෙස බුදුපියාණන් වහන්සේ දේශනා කොට ඇත.

උන්වහන්සේ බුද්ධත්වය ගැන ලියා දක්වා ඇති විග්‍රහයක් පහතින් උපුටා දක්වමි.

### "සම්බුද්ධත්වයට පත්වීම" යන්නෙහි අර්ථය කුමක්ද ?

බුද්ධ, සම්බුද්ධ, අභිසම්බුද්ධ, සම්මාසම්බුද්ධ යන ගෞරවණීය පද සියල්ලෙහිම එන "බුද්ධ" යන පදයේ ධර්ම අර්ථය පළමුකොටම තේරුම් කර ගත යුතුය. තුන්තරා බෝධියකින් එක්තරා බෝධියකට පැමිණ, "බුද්ධ" තත්වයට පත් වූ සියලු උතුමන් වහන්සේලා බුදුවරයින් වහන්සේලා ලෙසින් ධර්මයේ හඳුන්වයි. මෙහිදී ලොව්තුරා බුද්ධත්වයට පත්වීම, පච්චේක බුද්ධ තත්වයට පත්වීම සහ අරහත් බුද්ධත්වයට පත්වීම යනුවෙන් තුන්තරා බෝධිය හඳුන්වනු ලබයි. බුද්ධ, සම්බුද්ධ, අභිසම්බුද්ධ, සම්මා සම්බුද්ධ යනාදී වශයෙන් අද භාවිතයේ පවතින පදයන් එක පුද්ගලයෙකුට හෝ එක චරිතයකට හෝ විශේෂණයක් වශයෙන් ආරෝපනය කරමින් වැරදි



ආකාරයට භාවිතා කරන්නට පටන් ගත්තේ බෞද්ධ සාහිත්‍යය ලියූ පෘතග්ජන සාහිත්‍යයකරුවන් විසිනි. එමෙන්ම බෞද්ධ ඉතිහාසය ලියූ පෘතග්ජන මිනිසුන් විසිනි. ඒ ඔවුන් බුදුන්වහන්සේ හෝ බුද්ධත්වය හෝ පරමාර්ථ වශයෙන් දැක හඳුනා නොගත් හෙයිනි. නිවන් අවබෝධ කරගත්, සසර දුකෙන් සදහටම මිදී නිදහස් වූ සියලුම උත්තමයින් වහන්සේලා බුද්ධත්වයට පත්වූ සේක."ලොව්තුරා සම්මා සම්බුද්ධත්වය" මෙයින් අග්‍ර වනසේක. එයටද හේතුවක් ඇත. ලෝකය බුදුවරයින් වහන්සේලාගෙන් හිස් වූ යුගයක, අවස්ථාවක, ස්වයං භූ ඥාණයෙන්ම, ගුරු උපදේශ රහිතවම, තමාගේම මනසේ ශක්තියම මතු කරමින් සියලු කෙලෙස් මුල් සහමූලින්ම ගලවා උදුරා දමා උතුම් බුද්ධත්වයට පත්වීම වැදගත්ම සිදුවීමයි. මේ සඳහා තවත් බාහිර ගුරුවරයෙකුගේ ගුරු උපදේශයන් නොලබාම රාග බව, ද්වේෂ බව, මෝහ බව සහමූලින්ම උදුරා ගලවා දමා තමන්ගේ සිත කෙලෙස් වලින් නිදහස් කරගන්නටත්, කෙලෙස් උදුරා ගලවා දමා සසර දුකෙන් සදහටම මිදී නිදහස් වන නිවැරදි මාර්ගය අවශේෂ ලෝකයාට ද ප්‍රකාශ කර කියා දෙන්නටත් හැකි ශක්තියක් සහිත වූ උත්තමයා ලොව්තුරා සම්මා සම්බුද්ධ නමින් හඳුන්වයි.

පච්චේක බුද්ධ හෙවත් පසේ බුද්ධත්වයට පත්වන උත්තමයා ද අනුන්ගේ ගුරු උපදේශයක් නැතිවම ස්වයං භූ ඥාණයෙන්ම රාගබව, ද්වේෂ බව හා මෝහ බව උදුරා ගලවා දමා බුද්ධ තත්ත්වයට පත්වෙයි. නමුත් මෙවන් යුගයක, එනම් අබුද්ධෝත්පාද කාලයක "භව" උදුරා දමන මෙම ක්‍රමවේදය තවත් කෙනෙකුට ප්‍රකාශ කර පැහැදිලි කර කියා දෙන්නට නොහැකිවීම නිසා තමන් ස්වයං භූ ඥාණයෙන්ම අවබෝධ කරගත් ධර්මය තමාටම පමණක්ම සීමා වීම නිසා පච්ඡේක බුද්ධ යනුවෙන් මෙම බුද්ධ බව නම් කළහ. අරහත් බුද්ධ, තත්ත්වයට පත්වන උතුමන්වහන්සේලා ලොව්තුරා බුදුපියාණන් වහන්සේ විසින් ලෝකයාට දේශණාකර පෙන්වා වදාල මාර්ගයම අසාදැන, ඒ මග අනුගමනය කරමින්, ඒ ගුරු උපදේශවලට අනුකූලවම ක්‍රියාකරමින්, ශාස්තෘන්වහන්සේ ගිය මග යමින් ක්‍රියාකර රාග බව, ද්වේෂ බව, මෝහ බව සහමූලින්ම උදුරා ගලවා දැමීම කළ නිසා අරහත් බුද්ධ නමින් හඳුන්වයි.

මෙහිදී තුන්තරා බෝධියටම පොදු ලක්ෂණය වන්නේ "හව"උදුරා දැමීමයි. එනම් රාග බව, ද්වේෂ බව, මෝහ බව යළි සිතෙහි නොඋපදින ලෙසින්ම රාගක්ඛය කිරීමයි. ද්වේෂක්ඛය කිරීමයි. මෝහක්ඛය කිරීමයි. එනම් මෙතුවක් කාලයක් සසරට බද්ද වන්නට හේතු වූ සසර බැමි තුනම සොයා දැන සහමුලින්ම බැමි කපා දමා බැමිවලින් නිදහස් වීමයි. මේ අනුව බුද්ධත්වයට පත්වීම යනු සසරට බැඳෙන බානෙන් මිදී නිදහස්වීමයි. එයම"නිබ්බාන සච්ච කිරියා" යනුවෙන් ද හැඳින්වීය.

බුද්ධ (හව + උද්ධ) යන මාගධී පදයෙන් අර්ථ ගැන්වූයේ මේ ජීවිත පැවැත්ම යලි යලිත් මතු මතුවටත් බිහිකරගන්නට හේතුවන ශක්තිය (හව) හෝ (බව) උදුරා ගලවා ඉවත්කර (උද්ධ) ඉන් සදහටම මිදී නිදහස්වීම යන්නයි. බෞද්ධයා යනු බව උදුරා දමන්නට කැපවී ක්‍රියා කරන කෙනෙකු යන අදහසයි. මෙසේ උදුරා, ගලවා ඉවත් කර දැමිය යුතු (හව) වන්නේ රාග බව, ද්වේෂ බව හා මෝහ බව යන තුන් කෙලෙස් හවයි.

චිත්ත සංථානය තුළ රාග ගති පැවැතීම නිසා රාග බව අලුතින් උපදී. ද්වේෂ ගති පැවැතීම නිසා ද්වේෂ බව අලුතින් උපදී. මෝහ ගති පැවැතීම නිසා මෝහ බව අලුතින් උපදී. රාග අනුසයං අනුසේති, පටිඝඅනුසයං අනුසේති අවිජ්ජා අනුසයං අනුසේති'', යනුවෙන් ඡඡක්ක සූත්‍රයේදී විග්‍රහ කලේ මෙසේ අලුතින් අනුසය උපත ලැබීම (බව) යන්නයි. මෙලෙස රාග බව, ද්වේෂ බව, මෝහ බව අලුතින් උපදවා ගනිමින්, ඒවා සාරයි, වටිනවා යනුවෙන් තීරණය කළේ ඒ පිළිබඳව ඇත්ත ඇති සැටියෙන් නොදැනීම නිසාමය. එසේ ඇත්ත නොදන්නා අවධියකදී මේ ගති හොඳයි. වටිනවා, සාරයි කියා නිච්චසේ, සුඛ සේ සුව සේ සුඛ සේ දැක අත්ත සේ ගැනීම කළත් දැන් මේ ගති වල ඇති භයානක කම නිසරු බව, අනාථ වීමට හේතුවන බව යථා පරිදි දැක ගත් අරිය ශ්‍රාවකයා ඒ කෙලෙස් ගති සහමුලින්ම උදුරා අස්කර දැමීමට කැමැත්තෙන්ම ක්‍රියා කරන්නෙකු බවට පත්වෙයි.

ගෞතම බෝසත්තුමන් ඇසතු වෘක්ෂය පාමුලදී බුද්ධ තත්ත්වයට පත් වූ බව ගිහි පැවිදි සෑම කෙනෙක්ම දන්නා, විශ්වාස කරන කරුණකි.



නමුත් මෙතැනදි සිදු වු නියම, නිවැරදි සංසිද්ධිය කුමක්දැයි පරමාර්ථ වශයෙන් තේරුම් නොගැනීම බුද්ධත්වය පිළිබඳව ද තේරුම් නොගැනීමයි. ගෞතම බෝසත්තුමා මේ අවස්ථාවේ මාරයා සමග සටන්කොට මාරයා පරදවා, පසුව පැමිණි තණ්හා, රතී, රඟා යන මාර දුවනියන් ද පරාජය කර බුද්ධත්වයට පත් වූ බව බෞද්ධ සාහිත්‍යයේ හා බෞද්ධ ඉතිහාසයේ පෙන්වා දෙන සාමාන්‍ය පිළිගත් ප්‍රකාශනයයි. මෙය සම්මත විග්‍රහයක්ම පමණි.

බෞද්ධයින් යැයි කියා ගන්නා භක්තියෙන් බුදුන් අදහන බොහොමයක් පෘතග්ජන මිනිසුන් තවමත් දන්නේත්, අදහන්නේත්, අසා දැනගෙන ඇත්තේත්, එමෙන්ම සිතේ ධාරණය කරගෙන ඇත්තේත්, විහාර ස්ථානවල හා වෙනත් පූජනීය ස්ථානවල ඇඳ ඇති සිතුවම් ආශ්‍රයෙන් කලාකරුවෙකු, සාහිත්‍යකරුවෙකු මතුකර පෙන්වා දුන් පරිදි, බුදුන් වහන්සේ මාර පරාජය කිරීමේ කථාව මිස නියම නිවැරදි බුද්ධත්වයට පත්වීම පිළිබඳව නොවේ. හුදී ජන පහන් සංවේගය ඇති කිරීම සඳහා කලාකරුවා සාහිත්‍ය කරුවා විසින් කරන ලද මෙවන් නිර්මාණයන් මොන්ටිසෝරි පන්තියේ මට්ටමට දැනුමක් ඇති බාලයන් හට ගැලපෙතත් නිවන් මාර්ගයට අනුගත වන්නට උත්සාහ දරණ බුද්ධ ශ්‍රාවකයින්ට මෙය නොගැලපෙයි.

මාරයා, වසවර්ති මාර පුත්‍රයා, නමැති සැඩ පරුෂ, රෞද්‍ර පුද්ගලයෙකු සමග බෝසත්තුමා යුද වැදුණු බවත්, බෝසත්තුමන්ට අනේකාකාර වූ බාධා පැමිණ වූ බවත්, වද දුන් බවත්, මේ රුදුරු සටන දුටු දෙවියන් බ්‍රහ්මයින් පවා බයේ පලා ගිය බවත් චිත්‍රයකට මවා පෙන්වන්නේ බෞද්ධ සාහිත්‍ය කරුවාය. කළාකරුවාය. එමෙන්ම තරුණ රූමත් තරුණියන් තුන්දෙනෙකු පැමිණ බෝසත්තුමන් ඉදිරියේ රඟපෑමක් කළ බව පවසන්නේත් සාහිත්‍යකරුවා සහ කලා කරුවාය.

බෞද්ධ සාහිත්‍යකරුවා, කලා කරුවා මෙන්ම චිත්‍ර ශිල්පියා ද බෞද්ධ ඉතිහාසය ලියු බොහෝ ගත්කතුවරුන් ද බුද්ධ චරිතයක් ගොඩ නගන්නට උත්සාහ කළ බව පැහැදිලිවම පෙන්වා දිය යුතුය. නමුත්

පරමාර්ථ වශයෙන් බුද්ධ ධර්මයේ හරය ලෙස පෙන්වා දුන් බුද්ධත්වයට පත්වීම යනු මීට හාත්පසින්ම වෙනස් සිද්ධියකි. මෙය අධ්‍යාත්මික විපර්යාසයකි. සිත හා මනස මුල්කරගෙන චේතෝ විමුක්තිය හා ප්‍රඥා විමුක්තියට පත්වීමකි. මෙවන් අධ්‍යාත්මිකව සිදුකරගත් විශුද්ධියක්, විමුක්තියක් පෙන්වා දෙන්නට අපොහොසත් වූ කලාකරුවා බාහිර වශයෙන් යුද්ධයක් කරමින් මාරයා පරාජය කළ බව බුද්ධාගම් පොත්පත් වල ලියා තබා කුඩා දරුවන්ට උගන්වන ආකාරය නොමග යවන සුළු දර්ශනයකි. මෙම සාහිත්‍ය කරුවාගේ හා කලාකරුවාගේ සංකල්ප වලින් මිදී නිදහස්ව සිතා බුද්ධත්වයට පත්වීම යන්න පිළිබඳව යථාභූතඥාණ දර්ශනයක් ලබාගන්නට බෞද්ධයින් හැටියට අප උත්සාහ දැරිය යුතුය. කුඩා කාලයේ ඉගෙනගත් මේ අද්භූත අභව්‍ය දේ මිය යනතුරුම සිතෙහි දරාගෙන සිටින බොහෝ පෘතග්ජන පුද්ගලයින් අදටත් අප අතරම ජීවත් වෙයි.

චිත්‍ර ශිල්පියා, කලාකරුවා, සාහිත්‍යකරුවා මෙන්ම ඉතිහාසඥයා ද බුද්ධත්වය" පිළිබඳව ආගම් අදහන්නන්ට, භක්තිවන්තයින්ට, ගැලපෙන ආකල්පයකින් බුද්ධ චරිතය දෙස බලන්නට මිනිසුන්ව පුරුදු කරන නමුත්, යථාවාදී තථාකාරී ලෙසින් පටු ආකල්ප වලින් ඔබ්බට ගොස්, පදපරම සම්මතයෙන් මිදී, පරමාර්ථ වශයෙන් බුදුන් දැක ගන්නට උත්සාහ නොකිරීම බලවත් වරදකි. අප බෞද්ධයින් හැටියට, නිවන් මාර්ගය සොයා යන්නන් හැටියට, හැම විටම අලුත් විධියකට සිතා බලා පරමාර්ථ ධර්මයම අවබෝධ කරගන්නට උත්සාහ දැරිය යුතුය.

"යෝ පටිච්ච සමුප්පාදං පස්සති
සෝ ධම්මං පස්සති
යෝ ධම්මං පස්සති
සෝ මං පස්සති"

යන බුද්ධ භාෂිතයෙන් මෙය මොනවට පැහැදිළි කරදෙයි. මෙහි තේරුම යමෙක් බුදුන් දකින්නට නම් පටිච්ච සමුප්පාද ධර්මය නමැති හේතුපල ධර්මය පසක් කොට දැකගත යුතුය. මේ පදවැල් කියවීම හෝ පදපරම ලෙසින් එය දැන ගැනීම හෝ පමණක්ද මේ සඳහා ප්‍රමාණවත්



නොවේ.

"බුද්ධ" යන මාගධී පදයේ අර්ථය විග්‍රහ කර පෙන්වන්නට උත්සාහ කරන බොහෝමයක් සිංහල භාෂාව උගත් උගතුන් මේ බුද්ධ බල බුද්ධ ශක්ති බුද්ධ ඥාණ විග්‍රහය සඳහා අවබෝධය (බුද්ධ = අවබෝධය) යන පදය යොදා ගෙන ඇත. තවත් තැනකදී බුද්ධිය - බුද්ධිමත් යන පදය ද මේ සඳහා යොදාගෙන ඇත. බුද්ධ (භව + උද්ධ) (භූ + උද්ධ)යන පදවල ධර්ම අර්ථය වන්නේ උගත්කම, බුද්ධිමත්කම හෝ අවබෝධය යන සිංහල පදවලින් විග්‍රහ වන අර්ථය නම් නොවේ. එය වැරදි විග්‍රහයකි. බුද්ධ, බුද්ධං, බුද්ධෝ යනාදී මාගධී පදවලින් විග්‍රහ වන්නේ "භව උදුරා දැමූ" යන අර්ථයයි. එනම් රාග බව, ද්වේෂ බව, මෝහ බව (කෙලෙස් භව) උදුරා දැමූ යන අර්ථය එහි ඇත.

බුද්ධිමත් යන පදයෙහි අර්ථය වන්නේ භව+වෘර්ධිය යන්නයි. ලෝකය සකස්කර දිගටම පවත්වාගෙන යන්නට නම් රාග බව, ද්වේෂ බව හා මෝහ බව වර්ධනය කරගත යුතුයි. භව වෘධිය (බුද්ධිය) නිසා මිනිසුන් බුද්ධිමත් යන තත්වයට පත්වෙයි. එනම් මත්වීමේ ස්වභාවයකි. භව (බව) යන පදයෙහි බිහිකිරීමට උපකාර වන, යන අර්ථයක් ඇත. එමෙන්ම භව යනු බීජ අවස්ථාව ලෙසින් ද පෙන්වාදිය හැකිය. උප්පජ්ජති යන අවස්ථාවට පෙර අවස්ථාව "භව"අවස්ථාවයි. බීජ අවස්ථාවයි.

පුද්ගලයෙකුගේ සත්වයෙකුගේ ඉපදීම පැවැත්ම, ජීවත්වීම මෙන්ම පංචස්කන්දයන් උපාදානය කරගැනීම යලි යලිත් මතුමතුවටත් සිද්ධ කරන්නේම, නිර්මාණය කරන්නේම ප්‍රිය දේට ඇලෙන රාගබව, අප්‍රිය දේට ගැටෙන ද්වේෂ බව හා ප්‍රිය අප්‍රිය අතර මනින(මානය) මුලා බව (මෝහබව) යන මූලික ගති ලක්‍ෂණයන් තුනම තම තමන් තුළම ක්‍රියාත්මක වන හෙයිනි. මේ ගති ලක්‍ෂණයන් තුනම පෘතග්ජන පුද්ගලයෙකුගේ සිතක් තුළ නිරන්තරවම උපත ලබන, නිර්මාණය වන, සමුදය වන ගති නිසාම මේවා "භව" යන පදයෙන් ද විග්‍රහ කර පෙන්වා දුන්හ. "උපාදාන පච්චයා භව, භව පච්චයා ජාති" යනුවෙන් පටිච්ච සමුප්පාද විග්‍රහයේදී මෙය පැහැදිලි කර පෙන්වා දී ඇත.

රාග ගතිය පවතිනා තුරාවට සිතක යලි යලිත් "රාග බව" උපදින බවත්, ද්වේෂ ගතිය පවතින තුරාවට සිතක යලි යලිත් "ද්වේෂ බව" උපදින බවත්, මෝහ ගතිය සිතක පවතින තුරාවට යලි යලිත් "මෝහ බව" උපදින බවත්, ධර්මයේ පෙන්වා දී ඇත. මේ අනුව රාග ගති හා රාග බව යනු එකක්ම නොවේ. ගති හා භව යනු අවස්ථා දෙකකි. රාග ගතිය සිතක් තුළ තැන්පත් වූ ඇතුළට ගත් දෙයකි. "ගති" යනු ගන්නවා, ගත්තා, තැන්පත් කරගත්තා යන අර්ථයයි. "බව" යනු අලුතින් බිහිකර, නිර්මාණය කර ගන්නවා යනුයි. යලි යලිත් අලුතින් නිර්මාණය කර නොගත්තේ නම් "භව" අනුත්පාද නිරෝධ වෙයි. යලි නොඋපදියි. මේ අනුවම ද්වේෂ බව හා මෝහ බව යන පදවලින් ද අර්ථ ගැන්වෙන්නේ අලුතින් බිහිකර නිර්මාණය කර ගත්තා යනුයි. ''පුනබ්බවෝ'' ''යායං තණ්හා පුනබ්බවෝ'' ''නත්ථි දානි පුනබ්බවෝ'' යනාදි වශයෙන් පෙන්වා දුන්නේ මෙසේ අලුතින් නිර්මාණය කිරීම හා නිර්මාණය කිරීම නැවැත්වීම පිළිබඳවයි. මේ නිසා භව, සංභව, පුනබ්බව ආදී සියලුම පදවල අර්ථය අලුතින් බිහිකර නිර්මාණය කර ගැනීමයි. මෙසේ අලුතින් නිර්මාණය කර ගන්නා දේ රාග අනුසය, පටිඝ අනුසය, අවිජ්ජා අනුසය ලෙසින් ද ධර්මයේ පැහැදිලි කර දී ඇත.

ජීවත්වීම, පැවැත්ම දිගටම පවත්වාගෙන යාම, පිළිබඳව යම් අවබෝධයක් පමණක් ලැබූ පුද්ගලයා පෘතග්ජන පුද්ගලයෙකි. චතු අරිය සච්චයන් පිළිබඳව සත්‍යාවබෝධය (සච්චිකිරියාය) ලබා ''බව උදුරා දැමූ'' පුද්ගලයා බුද්ධත්වයට පත් වූ උත්තමයායි. අවබෝධය හා සත්‍යාවබෝධය යන පද   දකෙහි අර්ථයන් ද වෙනස්ය. අවබෝධය යන්න ලෝකය පිළිබඳව යම් විෂයානුබද්ධ දැනුමක් ලැබ ගැනීමයි. සත්‍යාවබෝධය යනු ලෝකය විද බලා ලෝකයෙන් එතෙර වන්නට හැකි ශක්තිය ලබා ගැනීමයි. මේ අනුව අවබෝධය යන්න ලෞකික වුත් නිවනට ප්‍රමාණවත් නොවුත් දැනුමකි. මහාචාර්යවරයෙකුගේ දැනුම අවබෝධයයි. සෝතාපත්ති ඵලයට පත්වුවෙකුගේ දැක්ම සත්‍යාවබෝධයයි. මේ දෙක සමාන කළ නොහැකිමය.

මේ අනුව රාග බව, ද්වේෂ බව, මෝහ බව සිතින් උදුරා ඉවත් කර දැමීමේ ඥාණයන්ම බුද්ධ ඥාණයන් වේ. රාග බව, මෝහ බව, ද්වේෂ බව උදුරා දමන බලයම බුද්ධ බලය වෙයි. රාග බව, ද්වේෂ බව, මෝහ බව



සහමුලින් උදුරා දමා ලබන විමුක්තියම ප්‍රඥා විමුක්තිය වේ. පටිච්චසමුප්පාද ධර්මය නොදැන යථාපරිදි පටිච්චසමුප්පාද විග්‍රහයේ තිපරිවට්ටයම තේරුම් නොගෙන, චතුරාර්ය සත්‍යයන් අවබෝධ කර ගත නොහැකිය. භව නිරෝධ කර, ජාති නිරෝධ කළ නොහැකිය. සම්මා අංගයන් තේරුම් ගත නොහැකිය. සම්මා දිට්ඨියට පත්වීම හෝ සම්මා සමාධියට පත්වීම හෝ සම්මා ඥාණ ලැබීම හෝ සම්මා විමුක්තියට පත්වීමට හෝ හැකිවන්නේ පටිච්ච සමුප්පාද විග්‍රහයේ කුසලමූල උද්දේසය නිවැරදිවම දැන අනුගමනය කිරීමෙන්ම පමණි.

"පුබ්බේච මේ සම්බෝධා" යනුවෙන් ප්‍රකාශ කලේ සම්බුද්ධත්වට පත්වන්නට පෙර තමන්වහන්සේ අසම්බුද්ධ විය. අනභිසම්බුද්ධ විය. බෝධි සත්තස්ස විය. එනම් භව උදුරා නොදැමූ, භව උදුරා දමන්නට නොදත්, භව උදුරා දමන මග සොයමින් ගිය කෙනෙකු පමණක් විය යන්න මෙහි තේරුමයි. හේතුඵල ධර්මය ගැන පූර්ණ අවබෝධයක් නොතිබූ බවත් (නප්පජානාති) උපත, ජීවත් වීම, පැවැත්ම, මියයාම වැනි දේ හේතුවක් නිසාම සිදුවන හේතුඵල දහමටම අදාල බව යථාභූත ඥාණයෙන් අවබෝධ කර ගන්නට අසමත් වූ බවත් ප්‍රකාශ කළහ. සියලුම ලෝකසත්වයා මේ ජීවිත පැවැත්මෙන් මිදී නිදහස්වන්නට නොදැන, ඉන් මිදිය නොහැකි ආකාරයෙන්ම, උගුලකට අසුවී සිටී. යලි යලිත් උගුලටම අසුවීම මිස ඉන් මිදී නිදහස්වීමට මගක් නොදනී (නප්පජානාති) උපතක් ලබයි. ජීවත්වෙයි. දුක් විඳියි. මිය පරලොව යයි. සැප හඹාගොස් දුකම උරුම කරගැනීමක් විනා වෙනත් කිසිදු හරයක් මේ ජීවිත පැවැත්ම පවත්වාගෙන යාමේ නැති බව තේරුම් ගන්නට බැරිවීමම මේ උගුලෙන්ද මිදී නිදහස් වන්නට බැරි වීමයි.

මෙවන් සියළුම ප්‍රශ්න වලට, ගැටලු වලට මුල් වූ හේතුව වන්නේ ඇස, කණ, නාසය, දිව, කය, හා මන යන ආයතනයන් හයෙන්ම ප්‍රියමනාප දේවලට සම්බන්ධවීමයි. බැඳීමයි. ආලය, ආදරය, ඇලීම, තණ්හාවීම, උපාදානය කර ගැනීම ආශාව, ලෝභකම යනාදී පද වලින් විග්‍රහ කර පෙන්වා දෙන ලද්දේ ප්‍රිය වින්දනය, ආස්වාදය යලි යලිත් විඳවීමේ, පිනවීමේ අවශ්‍යතාවයයි. කැමැත්තයි. මනාපයයි. එයම රාගී බවට

පත්වීමට හේතුව ද වෙයි. ලෝභ බව, තණ්හා බව මේ නිසාම සිතක උපත ලබයි. මෙවන් වූ රාග බව, ලෝභ බව, තණ්හා බව සිතින් උදුරා ගලවා දමා උපේක්ඛා සිතක් ඇති කර ගැනීම දුක නැති කර ගැනීමේ නිවැරදි මාර්ගයයි. එයමම බව උදුරා දමා බුද්ධ බවට පත්වීමයි. මෙසේ සසරට බැඳ තබන බැමි නිර්මාණය කරන රාග බව, ලෝභ බව, ද්වේෂ බව, මෝහ බව මිනිසෙකුට මනස මෙහෙයවා තම සිතින්ම උදුරා ඉවත්කර දමා නිදහස්වීමේ මාර්ගයක් ක්‍රමවේදයක් නැත්නම් බුද්ධත්වයට පත් වූ බුදු කෙනෙක් ලෝකයාට මෙවන් බුද්ධ ධර්මයක් දේශනා කරන්නේ ද නැත. මේ රාග බව, ද්වේෂ බව, මෝහ බව ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමෙන්ම සිතින් ගලවා උදුරා දමා ඉන් නිදහස් විය හැකි නිසාම බුද්ධ ධර්මය දේශනා කර ලෝකයාට නිවැරදි මග පෙන් වූ සේක.

පෘතග්ජන ලෝකයා රාගයෙන් මත් වී, ද්වේෂයෙන් මත් වී, මෝහයෙන් මත් වී මානයෙන් මත්වී ක්‍රියාකරන ධර්මතාවයක් ලොව පවතී. ප්‍රිය, අප්‍රිය දේවල් වලට මෙසේ මත්වී ක්‍රියා කරන පෘතග්ජන ලෝකයාට සංසාර දුකෙන් මිදී නිදහස් වන නිවැරදි මාර්ගයක් ගැන හිතා ගන්නට වත්, කල්පනා කරන්නටවත් ශක්තියක් හෝ හැකියාවක් නැති වන්නේ ඔවුන් රාග ද්වේෂ මෝහ ගති නිසා මත්වී, උන්මත්තකයින් ලෙසින් ක්‍රියා කරන්නට වීම නිසාය. ''සබ්බේ ප්‍රථුග්ජනා උන්මත්තකා'' යැයි පැවසුවේ ඒ නිසාය. මේ අනුව පෘතග්ජන ලෝකයා සැප හඹායන නමුත් එසේ සැප සොයා හඹායන්නේ තමන්ම මත්වීමේ ප්‍රතිඵලයක් නිසාම බව ඔවුන්ට තේරුම් ගත නොහැකිය. මේ අනුව ප්‍රශ්නයෙන් මිදී දුකෙන් නිදහස් වන්නට කල්පනා කරන හැම විටකම පෘතග්ජන ලෝකයා යළිත් කරන්නේම තව තවත් පංචස්කන්ද ලෝකයම උපාදානය කරගෙන අලුතින් තව තවත් ප්‍රශ්න හා ගැටලු වලට පටලැවීමයි. මෙය අවිද්‍යාවයි. නොදන්නා කමයි. දුකෙන් මිදී නිදහස් වන්නට තාවකාලිකව යොදන සියලුම පිළියම් යලි යලිත් බහුල ලෙසම දුකටමපත් කරවන ආකාරයේ ඒවාමය. මේ නිසා දුකට මුල්වූ හේතුවම සොයා දැන "භව" උදුරා දැමීම මගින්ම නිබ්බාන ගාමී විය යුතුය.

රාග බව, මෝහ බව, ද්වේෂ බව උපදින්නේම සිතකය. අලුතින් මෙසේ උපත ලබන "භව" උදුරා ඉවත් කරන්නට ක්‍රියා කිරීම බෝධි පාක්ෂික



ධර්මයන් සම්පූර්ණ කිරීමට ක්‍රියා කිරීමයි. බෝධිසත්ව තත්වය එයයි.

2. භව නිරෝධෝ ජාති නිරෝධෝ

මාගධී බුද්ධ භාෂිතයේ පෙන්වා වදාල භව (සංභවං, සමුදය, සංභූතං) යන පදයන් හා ජාති (උප්පජ්ජති, උදය, උත්පත්ති) යන පදවල අර්ථය නිවැරදිව තේරුම් ගත යුතුය. නූතන ගිහි පැවිදි බොහෝ උගතුන් ලියු හා පරිවර්තනය කළ බොහොමයක් සිංහල පොත් පත් වල භවය ( බවය) යනුවෙන් වැරදියට පදයක් ලියා දක්වා භාවිතා කරන අතර මාගධී භාෂාවේ භවය (බවය) යනුවෙන් ලියා පදයක් භාවිතා කර නැති බව පෙන්වා දිය යුතුය. "උපාදාන පච්චයා භව, භව පච්චයා ජාති" යනුවෙන් පෙන්වූ තැනට 'ය' යන්නක් එකතුකර ලිවීම හෝ කියවීම ද වැරදිය. එය බුද්ධ ධර්මය විකෘති කිරීමකි.

බුද්ධ දේශනාවේ භව, සංභව (බීජ) යන පදවලින් පෙන්වූයේ හෝ අදහස් කලේ උපත හෝ ජාති හෝ නොවේ. මේ පදයෙන් (භව) විග්‍රහ කළේ කර්ම බීජ අවස්ථාවයි. එනම් උපතට පෙර අවස්ථාවයි. බීජයක් සකස් නොවුන හොත් පැලයක් උපද්දවිය නොහැකිය. පටිච්ච සමුප්පාද විග්‍රහයේ එන "උපාදාන පච්චයා භව, භව පච්චයා ජාති" යනුවෙන් පෙන්වා වදාල ආකාරය ඉතාම පිරිසිදුව තේරුම් ගත හැකිය.

"යායං තන්හා පොනොභවිකා, පුනබ්බවෝති" මේ ආදි පදවලින් ද පෙන්වා දුන්නේ "භව" (බීජ) අවස්ථාවයි. මෙහි අර්ථය නම් යමක් යලි යලි උපත ලබන්නේම බීජ නිපදවන නිසාමය යන්නයි. බීජ බිහි නොකරන අවස්ථාවක උපතක් සිද්ධ විය නොහැකිය. (නත්ථි දානිපුනබ්බවෝ) මේ අනුව පුනරුත්පත්ති කථාවක් බුද්ධ ධර්මයට නොගැලපේ. පුන පුනා 'භව' බිහිවීම පුනබ්බවෝති යන්නයි. එය බුදු දහමට ගැලපෙයි.

කර්ම බීජ සිතක් තුළ උපත ලැබීමේ ක්‍රමය තමන් තුළින්ම තේරුම් ගෙන, කර්ම බීජ සහමුලින්ම උදුරා ගලවා දමා යලි කර්ම බීජ නොඋපදින ලෙසින්ම (අනුප්පාද ලෙසින්)සිත පිරිසිදු කරගැනීම සඳහා භව උදුරා දැමිය යුතුය. මෙසේ භව උදුරා දැමූ බුදුපියාණන් වහන්සේම මෙවන් ප්‍රකාශයක් කර වදාලහ.

ඥාණංච පනමේ දස්සනං උදපාදි, අකුප්පා මේ චේතෝ විමුක්ති
අයමන්ති මා ජාති, නත්ථිදානි පුනබ්භවෝ''

තමන් තුළ මතු මතුත් ජාති උපදවා ගන්නා බීජ ශක්තිය දැන් නැති බවත්, බිහි කිරීමේ ශක්තිය වූ 'භව' මුලින්ම උදුරා අස්කර දැමූ බවත්, ඒ අනුව යලි උපතක් නොලබන අතර මේ තමන්ගේ අවසන් උපතයි යන්න ද මෙහි දී ප්‍රකාශ කළ සේක.

මේ අනුව සංසාර දුකෙන් මිදී නිදහස්වන්නට නම් මතු උපතක් (ජාති) ලැබීම, අවසන් කළ යුතුය. උපතට මුල් වූ හේතුව වන්නේ 'භව' සක්‍රියව පැවතීමයි. භව යලිත් බිහි කිරීම (බීජ සකස් කිරීම) නවතා දැමූ පසුව, භව උදුරා දැමූ පසුව, යලි සසරට බැඳෙන බැමි ද සකස් නොවේ. මෙය බුද්ධ තත්ත්වයට පත්වීමයි.

භව උදුරා දමන්නට උපකාර වන ක්‍රියාකාරකම්, කරණීය ධර්ම - තේරුම් ගෙන එය ක්‍රියාත්මක කිරීම භව + උද්ද වශයෙන් පෙන්වා දුනි. බෞද්ධ යනුවෙන් මෙය සම්මත භාෂාවේ සඳහන් වෙයි. කරණීය ධර්ම කරන, අකරණීය ධර්ම නොකරන පුද්ගලයා බෞද්ධයෙකි.

භව උදුරා දැමූ පසුව එය අතීතයට ගිය අතීත දෙයක් වේ. භූ + උද්ද බුද්ධ යන මෙම අතීතකාල පදය භාවිතා වන්නේ භව උදුරා දැමූ උත්තමයින් සඳහාම පමණි.

ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් උපායාස ආදී සියල්ලම උපතක් සිද්ධවීමත් සමගම උරුම වන පලවිපාකයන්ය. මේ සියලු ආකාර වූ දුක් කන්දරාවෙන්ම නිදහස් වන්නට නම් උපත නම් වූ හේතුවෙන්ම නිදහස් විය යුතුමය. උපත සිදුවන හැම විටකම ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් ඒ සමගම උරුම වෙයි. උපතට ද නියත වූ, මුල් වු හේතුවක් ඇත. උපතට හේතුව කර්ම බීජ නිපදවීම හා නිපද වූ බීජ සක්‍රියව පැවැතීමයි. කර්මබීජ යනුවෙන් අදහස් කලේ කෙලෙස් ගතීන්ය. කෙලෙස් ගති රඳා පවතින්නේ බඹයක් පමණ වූ ශරීර කූඩුව තුළම ඇති මනෝමය කය තුළය. මේ අනුව තමන්ගේම මනෝමය කය තුළ ගබඩා වී පවතින



කෙලෙස් ගති නිවැරදිවම දැන හඳුනාගෙන ඒ කෙලෙස් ගතීන් උදුරා දමා යලි කෙලෙස් බව නොඋපදවන්නටම උපකාර වන ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් භව උදුරා දැමීම ද සිද්ධ වෙයි. මෙසේ කෙලෙස් ගති සහමුලින්ම උදුරා දමා යලි කෙලෙස් නොඋපදින තත්ත්වයට පාරිශුද්ධ වූ උත්තමයා බුද්ධත්වයට පත් වූ උත්තමයෙකි. ලොව්තුරා බුද්ධ, පච්චේක බුද්ධ, අරහත් බුද්ධ යන කුමන තත්ත්වයකින් බුද්ධත්වයට පත්වුවත් ''භව උදුරා දැමීම අනිවාර්යයෙන්ම සිදුකරගත යුතුමය. භව උදුරාදමා ඉන් නිදහස් වූ සියලුදෙනාම අරහතුන් වහන්සේලාය. ප්‍රඥා විමුක්තියට පත් වූ අයය. චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත් ආර්යයන්වහන්සේලාය. සංසාර රිය ගමන ඉදිරියටත් පැවැත්වීම නවතා දැමුවන්ය.

“චර” බව අවසන් කළ නිසා කාමාවචර ලෝකවල හෝ රූපාවචර ලෝකවල හෝ අරූපාවචර ලෝකවල හෝ යලි නොඋපදියි. මේ නිසාම “විජ්ජාචරණ සම්පන්න” නමින් ද හඳුන්වයි. කාමාවචර යනු කාම ලෝකවල සැරි සැරීමයි. රූපාවචර යනු රූප ලෝකවල සැරි සැරීමයි. අරූපාවචර යනු අරූපී ලෝකවල සැරි සැරීමයි. මෙහිදී රාග විරාග කර, අවිජ්ජා විහතා කර, තමෝ විහතා කර, විජ්ජා අධිගතා, විජ්ජා උදපාදි, අලෝකෝ උදපාදි යන ශුද්ධ වූ තත්ත්වයට ද පත්වෙයි. චර බව නවතා දැමීම “චරණ” යන්නෙහි තේරුමයි. භව උදුරා දමා බුද්ධත්වයට පත්වූ උතුමන් ''විරජං වීතමලං'' යනුවෙන් ද බුද්ධ දේශනාවේ හඳුන්වයි. මෙහිදී විරජං යනු භය ආකාර වූ රජස් උදුරා ගලවා ඉවත් කිරීමයි. රාගය උපදින්නේම රජස් උපදින නිසාමය. මලං යනු මලකඩ කා මොට්ට වීමයි. මෝහයයි. වීතමලං යනු කෙලෙස් කපා බැමි සිඳ දමන්නට උපකාර වන ආකාරයෙන් මනීන්ද්‍රිය පන පෙවීමයි.

බුද්ධත්වයට පත්වූ ගෞතම බුදුපියාණන්වහන්සේ එදා පස්වග මහනුත් ඇතුළු පිරිසට ධම්මචක්කපවත්වන සූත්‍රය දේශණා කරන අවස්ථාවේදී එය ශ්‍රවණය කළ කොණ්ඩඤ්ඤ හාමුදුරුවෝ චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරගෙන, පටිච්චසමුප්පාද ධර්මයද අවබෝධ කරගෙන, දහම් ඇස පහදාගෙන සම්මා දිට්ඨියටම පත්වූහ. මෙසේ දහම් ඇස පහදා, දස්සනේන සංපන්නවීමට උපකාර වූ දැක්ම - සම්මා දිට්ඨිය -

ලෝකෝත්තර සම්මා දිට්ඨියයි. ධම්මෝ සංදිට්ඨිකෝ, සම්මදක්ඛාතා යන තත්ත්වයන්ට පත්ව - ''යං කිංචි සමුදය ධම්මං, සබ්බත්තං නිරෝධ ධම්මං'' යන්න ද යථාපරිදි දැකගත්හ. එනම් සමුදය යන්න තේරුම් ගෙන - 'සං' දැක සමුදය නිරෝධ කළ යුතුය යන ලෝකෝත්තර සම්මා දිට්ඨියට පත්ව සම්මා අංගයන් අටම යථා පරිදි තේරුම් ගත්හ.

බඹයක් පමණ වූ මේ ශරීර කූඩුව ආශ්‍රයෙන්ම තුන්ලෝකයම පවතින බවත්, ඒ කාමලෝක, රූපලෝක, අරූපලෝක නමැති තුන්ලෝකයම උපද්දවා ගන්නේ රාග අඳුර, ද්වේෂ අඳුර හා මෝහ අඳුර නිසාම බවත් බුදුපියාණන් වහන්සේ පැහැදිලිව පෙන්වා වදාලහ.

රාග විරාග කර, අඳුර විහතා කර, (තමෝ විහතා) විජ්ජා අධිගතා යන තත්ත්වයට පත්වීමේදී මෙවන් වූ ලෝක අඳුර දුරුවී අලෝකෝ උදපාදි වෙයි. විජ්ජා උදපාදි වෙයි. පඤ්ඤා උදපාදි වෙයි. අලෝකෝ උදපාදි යනු තුන්ලෝක අඳුරම දැක, තේරුම් ගෙන කෙලෙස් අඳුර දුරු කිරීමයි. භෞතිකවුත්, ලෞකිකවුත් මේ තුන්ලෝකයම නිර්මාණය කරගත්තේ තන්හාව හා අවිද්‍යාව පවතින නිසාය. අඳුර නිර්මාණය කරගන්නේ කෙලෙස් ගති (ආසව, අනුසය) උපදින තාක්කල් පමණි. රාගය, ද්වේෂය, මෝහය යන ගති තුනම තම සිත තුළම මුල්බැස ගෙන පවතින බව තේරුම් ගෙන මේ ගතිතුනම සහමුලින්ම උදුරා ඉවත්කර දැමීම ''භව'' උදුරා බුද්ධ බවට පත්වීම. තම චිත්තසංථානය තුළ උපදින, ක්‍රියාත්මක වන, පැලපදියම් වන මේ වැරදි සහගත වූ කෙලෙස් ගති තුන වෙනත් බාහිර කිසිවෙකුට වත් උදුරා ඉවත් කර දමන්නට නොහැකි බවත්, තමන්ටම එය උදුරා ඉවත්කර දමන්නට හැකි බවත්, මනා කොට තේරුම් ගත් පුද්ගලයා අරිය ශ්‍රාවකයෙකු, සද්ධස්ස කුලපුත්‍රයෙකු බවට ද පත්වෙයි.



## බුද්ධ දේශය

බුදුන් උපන් රට බුද්ධ දේශයයි

බුදුන් උපන් යනු මනුෂ්‍යයෙකු රාග බව, ද්වේශ බව,මෝහ බව සිතකින් සහමුලින් ම උදුරා දමා බුද්ධත්වයට පත් වීමයි.

එනම් මනුෂ්‍යයෙකු සම්පූර්ණයෙන්ම නික්ලේශී තත්වයට පත්වීමයි. එනම් සම්මා සම්බුද්ධත්වයෙන් හෝ පච්චේක බුද්ධත්වයෙන් හෝ අරහත් බුද්ධත්වයෙන් පූර්ණ චිත්ත පාරිශුද්ධත්වයට පත් වීමයි.

මනුෂයයෙකුට ස්වයංභූ ගුණයෙන්ම මේ භව උදුරා දමන ප්‍රතිපදාව සොයා දැන සම්මා සම්බුද්ධත්වයට පත් විය හැක්කේ ජන්බුද්වීපයේ මධ්‍ය දේශයේ පමණි. (පතිරූප දේසයක)

ගෞතම බුදුන් වහන්සේ බෝධිසත්වයන්ව ඉපදීමට පෙර පස්මහ බැලුම් බලා ඇති බව අප අසා ඇත්තේමු. එනම් කාලය, ද්වීපය, දේශය, කුලය, මව ලෙසයි. මෙහිදි ද්වීපයක් හෙවත් දිවයිනක් තෝරාගෙන දේශයක් හෙවත් මධ්‍ය දේශය තෝරා ගෙන ඇත. එනම් ජන්බුද්වීපයේ හෙවත් හෙල ද්විපයේ මධ්‍ය දේශය හෙවත් ඡන්බුද්වීපයේ හරි මැද පිහිටා ඇති සියළුම සම්මා සම්බුදුවරයාණන් වහන්සේලා බුද්ධත්වයට පත්වන එකම ස්ථානයයි.

මේ අනුව රාග බව, ද්වේශ බව, මෝහ බව සහමූලින්ම උදුරා දමා මනුෂ්‍යයන් බුද්ධත්වයට පත්වන එකම රට ජන්බුද්විපය හෙවත් අප උපන් මේ හෙල බිම ලෙස උන්වහන්සේ සොයා දැන අපට පෙන්වා දෙන සේක.

උන්වහන්සේ පෙන්වා දෙන පරිදි
ජන් + බුද් + ද්වීපය
ජන් යනු ඉපදීමයි, බිහිවීමයි
බුද් යනු බුදුන් හෙවත් බුද්ධත්වයයි
ද්වීපය යනු දිවයිනයි.
දිවයින යනු මුහුදින් වට වූ ගොඩබිමක් මිස අර්ධද්විපයක් හෝ

මහාද්වීපයක් නොවන්නකි.

මේ අනුව ජන්බුද්වීපය යන වචනය තුලම පින් ඇති පිරිසට බුද්ධ දේශය හඳුනා ගැනීමට හැකි වන සේ සත්‍ය ලියැවී ඇත.

මේ අනුව රාග බව, ද්වේශ බව, මෝහ බව, සිතෙන් සහ මුලින්ම උදුරා දමා අරහත් බුද්ධ යන තත්වයට මේ හෙලබිමේම පහල වූ උන්වහන්සේ ඉතිහාසයේ කුමක් ලියවී තිබුණත් සාවද්‍ය ඉතිහාසය තුළ අතරමං වී සිටින සියළුම දෙනාට බුද්ධ දේශය මේ හෙලබිමට බව සක්සුදක් සේ ඔප්පු කර පෙන්වා දෙද්දී අපරට මනුෂ්‍යයන්ට එය නොවැටහෙනුයේ උන්වහන්සේ ගැනත්, උන්වහන්සේ දේශනා කරන සත්‍ය බුදු බණක් ගැන තවම නිවැරදිව නොදන්නා බැවිනි.

අතීතයේදී ද බොහෝ අරිහතුන් වහන්සේලා හෙවත් අරිහත් බුද්ධත්වයට පත් වූ උතුමන් වහන්සේලා මේ හෙල බිමේම බිහි වී ඇති බව අප උගෙන ගෙන ඇත්තෙමු එසේ නම් මනුෂ්‍යයන් බුද්ධත්වයට පත්වන එකම රට මේ හෙල බිම බව දැන දැනත් අපගේ ගාම්භිරත්වය, පිටරටකට පවරා දෙමින්, බලෙන් වියරුවෙන් අපගේ ගාම්භිරත්වය, අජේම උතුම් බව ප්‍රතික්ෂේප කරමින් කටයුතු කරන සියළුම දෙනා තම තමා සතු දේශ ද්‍රෝහී ස්වභාවය සහ අකුසලයේ භයානකකම අවබෝධ කරගත යුතු වේ.

තමා උපන් බුද්ධ දේශය ප්‍රතික්ෂේප කරමින්, තමාට ඇසෙන පරම පවිත්‍ර සිරි සද්ධර්මය බැහැර කරමින් කටයුතු කරන සියළුම මනුෂ්‍යයන් එසේ කරනුයේ තමාගේ නිවන ආවරණය වන සේ තම තමා විසින් සිදු කර ඇති අකුසල කර්මයක හේතුවෙන් බවත් උන්වහන්සේ පහදා දෙන සේක. තවද ඔහුන් සියළු දෙනාටම අනාගතයේ ගෙවීමට ඇති විපාක උරුම වී ඇත. ඔහුන්ට නිවන ආවරණය වී ඇති අකුසල කර්මයෙන් බැහැර වී උතුම් නිවන් මග කුමක් දැයි අවබෝධ කරගැනිමට වර්තමානයේ සිදුකරන ලෝකෝත්තර පුණ්‍ය ශක්තියකිනුත්, කුසල් බලයකිනුත්, කර ඇති වරදට සමාව ගැනීමෙනුත් හැකි වන බව උන්වහන්සේගේ දේශනා අසා අවබෝධ කරගත හැක.



සියළුම සම්මා සම්බුදුවරයානන් වහන්සේලාගේ ඉපදීම, බුදුවීම, පිරිනිවන් පෑම, ප්‍රථම ධර්ම දේශනය පැවැත්වීම යන සියළු සිදුවීම් සිදුවන්නේ. ජන්බුද්වීපයේ හෙවත් අප උපන් මේ හෙලබිමේ පමණි.

ගෞතම බුදුන්වහන්සේගේ ප්‍රඥා බුද්ධ ශාසනය පන දහසක් කල් හෙවත් බොහෝ කාලයක් උතුම් බුද්ධ ධර්මය සුරැකිව පවත්වා ගැනිමට අවුරුදු 80 කින් ගෞතම බුදුන් වහන්සේගේ ආයුෂ ගෙවී අවසන් වුවත් ධර්මතාවයෙන් නිවන් අවබෝධ කරගැනිමට අවශ්‍ය කටයුතු සැලසී ඇති බව උන්වහන්සේ පෙන්වා දෙන සේක.

ඒ අනුව මේ හෙලබිමේ කාලයෙන් කාලයට මහා ප්‍රාඥඅරහතුන් වහන්සේලා පහල වීමක් සිදු වීම එම ධර්මතාවයට අනුව සිදුවන්නකි.

තවද බුදුන් වහන්සේ ඉපදුන තැන බුදු වුනු තැන, ප්‍රථම ධර්ම දේශණය පැවැත් වූ තැන, පිරිනිවන් පෑම සිදු වූ තැන, යන ස්ථාන හතරෙහි නිවන් මග අනුගමනය කරන සද්ධස්ස කුලපුත්‍රයන්ට මග ඵලයනට පත් වීමට උපකාරී වන බුද්ධ ශක්තියක් ගැබ් වී ඇත යන මේ පනිවුඩය බුදුන් වහන්සේ පිරිනිවන් පෑමට ස්වල්ප මොහොතකට කලින් ආනන්ද ස්වාමින්වහන්සේ ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් දේශනා කොට ඇති ආකාරය මහා පරිනිබ්බාන සූත්‍රයෙන් උන්වහන්සේ පෙන්වා දෙන සේක.

මේ අනුව සෝවාන් මාර්ග අනු ගමනය කරන ඕනෑම කෙනෙකු මෙම සත්‍ය ස්ථාන හතරෙන් එක් ස්ථානයක් හෝ වැඳ පුදා ගන්නා තුරු කෙනෙකුට සෝවාන් ඵලයට පත්වීම කිසිදා නොලැබෙන බව උන්වහන්සේ පෙන්වා දෙන සේක.

මෙම සත්‍ය ස්ථාන හතරෙන් එක් ස්ථානයක් හෝ වැඳ පුදාගෙන බුද්ධ ශක්තියට අනුගත වීමෙන් සෝවාන් ඵලයට පත් වීමට අවශ්‍ය පරතෝඝෝසක ප්‍රත්‍ය සම්පූර්ණ කරගත හැකි බව උන්වහන්සේ පෙන්වා දෙන සේක.

මෙම සත්‍ය ස්ථාන හතරෙහි පිහිටීමත් එම ස්ථාන හතර සම්බන්ධ වූ සත්‍ය ඉතිහාස විස්තරයක් උන්වහන්සේ බොහෝ ධර්ම දේශනා තුලින් විස්තර කර දී ධර්ම පුස්තක වලද බොහෝ විස්තර ලියා දක්වා ඇත.

"ගෝතම බුදුන් වැඩ සිටි දඹදිව හෙලයා හඳුනා ගත යුත්තේ ඇයි" යන ග්‍රන්ථයේ සිරි ලංකාවේ බුද්ධ කාලයේ පටන් වු ඉතිහාස කථාවේ වැදගත් විස්තර ලියා දක්වා ඇත එම ග්‍රන්ථයේ හෙල ඉතිහාසයේ වැදගත් විස්තර වලින් නිවන් මග අනුගමනය කරන මනුෂ්‍යයින් විසින් දැන ගත යුතු කොටසක් ලියා දක්වා ඇත

ඉහත සඳහන් ග්‍රන්ථයේ උන්වහන්සේ ලියා දක්වා ඇති විස්තරයකින් කොටසක් පහතින් උපුටා දක්වමි.
උන්වහන්සේ පෙන්වා දෙන පරිදි සිරි විග්‍රහයක් පහතින් ලියා දක්වමි.

අතීතයේ මේ හෙලබිමේ විසූ සියළුම දෙනා ගෞතම බුදුපියාණන් වහන්සේ හැඳින්වීමට ''සිරි'' යන නාමය භාවිතා කොට ඇත.

මේ අනුව ගෞතම බුදුන්ට, ගෞතම බුද්ධ ධර්මයට, ගෞතම බුදුන්ගේ ශාරීරික ධාතූන්ට පාරිභෝගික හා උද්දේශික වස්තූන්ට මෙන්ම ගෞතම බුදුන් වැඩ සිටි මෙම ද්වීපය හඳුන්වන්නටද සිරි යන පදය යොදාගෙන ඇත.

මේ අනුව සිරි යෙදුම පෙන්වා දෙනුයේ මෙලෙස සිරි දළදා සමිඳු, සිරි දන්තධාතූන් වහන්සේ, සිරි දළදා, සිරි මහ බෝ සමිඳු, සිරි මා බෝ දක්ෂිණ ශාඛාව, බුදු සිරි පතුල, සිරි පා සමනොළ, සිරි පා, සිරි දෙසුම, සිරි සද්ධර්මය, සිරි වරුණ, සිරි මළුව, සිරි සඟගණ

සිරි ලක්බිම, සිරිලක් දේශය, සිරි දේශය, සිරි ලංකා, සිරි සඟ මොක්, සිරි නිවන්, සිරි සැප

මේ අනුවම සිරි වැඩ උන්න ගම ලෙසින් කටවහරට පුරුදු වී, හිරි වඩුන්න ලෙෂ අදත් භාවිතයේ පවතී. හිරි වඩුන්න ගමෙහි බුදුන් වහන්සේ බුද්ධත්වය පත් වූ ව්‍යාජාසනය සහිත සිරි මහ බෝ සමිඳු සහිත සුබෝධි මූලය සහිත බෝ සමිඳු වැඩ සිටින අයුරු අදත් දැකගත හැක. සෑම වෙසක් මාසයේදීම සුදු බෝ අංකුරයක් සිරිමහ බෝ සමිඳුන්ගෙන් බිහි වෙන බැවින් සුබෝධි මූලය වී ඇත. සියළුම බෝ සමිඳුන්ගෙන් හිරිවඩුන්න ගම පිහිටි සිරි මහ බෝ සමිඳුන් අග්‍ර වන බැවින් බෝධි රාජ මහා විහාරය ලෙස නම් ලැබ ඇත.



පසු කලෙක සිරියන උතුම් නාමය "ශ්‍රී" යන සංස්කෘතික පදය (වචනය) හා පටලවාගෙන සංස්කෘත ශෘන්ගාරාත්ම බලපෑම නිසාවෙන් සිරි ලංකා, සිරි දේශය යන්න ශ්‍රී ලංකා යැයි නම් කෙරුණි.

උන් වහන්සේ ඉතා වගකීමෙන් හා අවධාරණයෙන් පෙන්වා දෙන්නේ "සිරි" යනුවෙන් සිරි දේශය, සිරිලක් දෙරන, සිරි ලංකා යනුවෙන් මෙරට නම් කෙරුණේ ඉතා වැදගත් හේතුවක් අනුවම බවයි. එනම් ගෞතම බුදුන්ට සත් වරක් පූජාකල මේ ද්වීපය මේ දේශයේ ඇති සම්බන්ධය පෙන්වීම සඳහාම කල පැරණි අර්ථ ගැන්වීමක් නිසා මිස මෙය අහම්බෙන් ලැබුණු නාමයක් නොවන බවයි.

මුළු ලෝකෙන්ම උතුම්ම රට, බුද්ධ දේශය ලෙස මුළු ලෝකයේ සියළුම රටවලට පෙන්වා දෙමින් මුළු ලෝකෙන් උතුම් රට ලෙසින් ගෞරවාදරයට පත් වෙමින්, මුළු ලෝකයම අනන්ත වටිනා කමකින් රකින රට බවට පත් වෙමින්, සිරි සද්ධර්මය රකිමින්, ඒ අනුව මුළු ලෝකෙටම සෙත සැලසෙන මූලස්ථානය වෙමින් මේ හෙල බිමේ නාමයේම සඳහන් වී ඇත. මෑත ඉතිහාසයේ හෙලබිමේම බිහි වූ පාප කාරී, අඥාණ කෙලෙස් වලින් වැසී ගිය මනුෂ්‍යයන්ගේ සිත් වලින්ම මුළු රටටම වස් වදින ලෙස වෙනස් කරගෙන ඇති ශ්‍රී ලංකා යන නාමය යලි සිරි ලංකා ලෙස වෙනස් කර ගත යුතුව තිබේ. මුළු හෙලද්වීපයටත් මුළු මහත් ලෝකයත් මහත් සෙතක් ශාන්තියක් උදා කරලීමට සමත් ශක්තියක් සිරි ලංකා නාමයේම ගැබ් වී ඇත.

සිරි ලංකාවේ සිරි සඳහම් අවබෝධ නොවන කිසිම පාලකයෙකුට සිරි පැරකුම් පෑ නොහැකිය. එහෙත් මේ වර්තමාන යුගය නැවත සිරි ලංකාවක්, සිරි දේශයක් බිහිවන යුගයක් බැවින් සිරි දේශයේ සිටි අභීත සිරි ගුණයෙන් යුත් අතීත මනුෂ්‍ය රත්නයන් මේ හෙලබිමේ යළි බිහිවන බව අප සියළු දෙනා අමතක නොකල යුත්තකි.

මේ ධර්මතාවය අනුව සිරිධම්මාලංකාර යන අර්ථ ධම්ම සහිත වූ විශේෂණ නාමයෙන්ම බිහි වූ සිරි රත්නයක් වූ උන්වහන්සේ සිරි දේශයත්,

සිරි සද්ධර්මයත් මතුකර පෙන්වා දෙන සේක. සිරි සේන ලෙසින් ගිහි නම් ලැබීමද මේ අනුව සිදු වී සිරි ගුණයෙන් සිරි රත්නයක් වීමට හැකි වන බව පෙන්වා දී ඇත.

මේ හෙලබිමේ අගය තව දුරටත් පෙන්වා දෙන උන්වහන්සේ චක්‍රවර්තී හෙවත් සක්විති රජ පරපුර ගැන ද තොරතුරු හෙලිදරව් කරමින් වැදගත් බොහො කරුණු ලියා දක්වා ද ඇත.

උන් වහන්සේගේ විග්‍රහයකට අනුව අප උපන් මේ හෙලබිමේ හැර මේ මිහිතලය මත වෙනත් කිසිම රටක, වෙනත් කිසිම දීපයක සක්විති රජ කෙනෙකුගේ රජ වීම හෝ බුදු කෙනෙකුගේ බුද්ධත්වයට පත්වීම හෝ සිද්ධ වීමක් ද නොවන්නේය. මිහිතලයේ මධ්‍ය මණ්ඩලය එනම් පෘථිවියේ මධ්‍ය ලක්ෂයේ යහපත් කෙලවර පිහිටා ඇත්තේ මේ අප උපන් හෙලබිමේය. එහි අයහපත් අන්තය කෙලවර පිහිටා ඇත්තේ බර්මියුඩා ත්‍රිකෝණය නමින් අද ලෝකයා හදුන්වන අනෙක් කෙලවරේය.

සක්විති රජවරුන්ගේ ගති ලක්ෂණයන් හා බලයන් ගැන ත්‍රිපිටකයේ චක්ක වත්තී සීහනාද සූත්‍රයේ දක්වා ඇති කරුණු පෙන්වා දෙමින් බෞද්ධ ත්‍රිපිටක සාහිත්‍යයේ හැර ලෝකයේ වෙනත් කිසිම ඓතිහාසික පොතක පතක සාහිත්‍යයක හෝ චක්‍රවර්තී රජුන් ගැන සඳහන් වන්නේ නැති බවද පෙන්වා දෙන සේක.

ඒ අනුව සක්විති රජු යනු බුද්ධෝත්පාද කාලයක් නොවන අබුද්ධෝත්පාද කාලයකදී රජකම් කරන, දසරාජ ධර්මයම අනුගමනය කරන, අනාර්ය ධ්‍යානයන් හා අභිඥා බලයන් ලබාගත් ඇති උසස් මානසික ශක්තියකින් හා චක්‍ර රත්නය, හස්ථි රත්නය, අස්ස රත්නය, මනි රත්නය, ඉත්ථි රත්නය, ගෘහපති රත්නය හා පරිනායක රත්නය යන රත්න 7 ක් හිමි රජ කෙනෙකි. චක්‍ර වර්තී රජ යුගය හැම කෙනෙකුන්ම ලෞකික සුවයන් විඳිමින් පින්කම් කරමින් සුවසේ කාලය ගෙවන යුගයකි.

වර්තමානයේ ලෝකය තුල සිදුවන්නාක් මෙන් මිනිසුන් තලා පෙලා යුද්ධ කරමින්, දැඩි නීති රීති පනවා, වෛර සිතින් අධර්මයෙන් රටවල් යටත්



කර ගැනීමක් හෝ අධිරාජ්‍යයන් බිහි කිරීමක් හෝ චක්‍රවර්තී රාජ්‍යයක ගති ලක්ෂණ නොවේ. දසරාජ ධර්මයෙන් සියලුම රටවල් පාලනය කරන බැවින් සියළු සැප සම්පත් ලැබෙන්නේ ධර්මතාවයෙන්මයි. චක්‍ර රත්නය ක්‍රියාත්මක වීමෙන් ධර්මතාවයෙන්ම සියළු රටවල්, සියළු රජවරු චක්‍රවර්තී රජුගේ අනසකට අවනත වෙයි. කිසිවෙකු චක්‍රවර්තී රජ කෙනෙකුට විරුද්ධ වීමට පවා නොසිතති. මෙවැනි ධාර්මික, උතුම් සක්විති රජවරු අතීතයේ මේ හෙලබිමේ රජකම් කලහ.

ගෞතම බුදුන් බුද්ධත්වයට පත්වන්නට පෙර මේ හෙලබිමේ රාවණා, පරම්පරාවට අයත් වූ චක්‍රවර්තී රජවරු හත් දෙනෙක්ම දීර්ඝ කාලයක් රජකම් කර ඇත.

කාශ්‍යප බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ යුගයේදී මෙම ජන්බුද්වීපයම මණ්ඩද්වීපය නමින් හැඳින්වීය. මණ්ඩ දීපයේ කාශ්‍යප බුදුපියාණන් බුදුවීමට පෙර තාරක නමින් චක්‍රවර්ති රජවරු 14 දෙනෙක්ම අති දීර්ඝ කාලයක් රජකම් කර ඇත.

කෝණාගම බුදුපියාණන් බුද්ධත්වයට පත්වන්නට පෙර යුගයේදී බලි නමින් චක්‍රවර්තී රජ පරපුරක් මේ ජන්බුද්වීපය තුලම සක්විති රජකම් කලහ. එකල මේ දීපය ඕජ දීපය නමින් විය.

කකුසඳ බුදුන් බුද්ධත්වයට පත්වන්නට පෙර යුගයේදී මේ දීපය වර දීපය නමින් හැඳින්වීය. මන්දාතු නමින් සක්විති රජවරුන් 5 දෙනෙකු ඊට පෙර යුගයේදී රජකම් කර ඇත.

අනාගතයේදී මෛත්‍රී බුදුන් මතු බුද්ධත්වයට පත්වන්නට පෙර කේතු නම් චක්‍රවර්තී රජපරපුරක් මේ හෙල බිමේ රජකම් කරන්නේය. මෙලෙසින් උන්වහන්සේ මේ හෙලදීපයේ ශ්‍රී විභූතිය පෙන්වා දෙන සේක.

## මඟ අමඟ

මඟ

මනුෂ්‍යත්වයේ අගය පෙන්වා දී, දුක සැකසෙන සංසාර ගමනක ආදීනව, ආනිසංස පෙන්වා දී, දුකෙන් සදහටම මිදී නිදහස් වීමට මනුෂ්‍යයාට මේ මනුෂ්‍ය ජාතියේදීම හැකි බව පෙන්වා දී, ඒ සඳහා කල යුතු එකම දෙය උතුම් චතු අරිය සත්‍යයන් අවබෝධ කර ගැනීම බව පෙන්වා දී, ඒ සඳහා නිබ්බාන යන තත්වයට පත්වීමට, සංසාර බැමි කපා දැමීමට අප අනුගමනය කල යුතු වැඩපිළිවෙල හෙවත් නිවැරදි මග උන්වහන්සේ පෙන්වා දෙන අයුරු සැකෙවින් ලියා දක්වමි.

ඒ සඳහා උන්වහන්සේ සංදේශනාව දේශනා කරමින් යටපත්ව වැසී තිබූ සත්‍ය බුද්ධ දේශනාව එලි දක්වා පෙන්වා දෙන සේක.

ඒ තුලින් සත්‍ය පටිච්ච සුමුප්පාද ධර්මය දේශනා කරන සේක.

පටි + ඉච්ච + සං + උප්පන්න ලෙස වචනය තුලම ලියැවී ඇති සත්‍ය අර්ථය උන්වහන්සේ පෙන්වා දෙන සේක.

තම තමාගේ කැමැත්තට අනුව බැඳී රාග බවින්, ද්වේශ බවින්, මෝහ බවින් කටයුතු කර සංසාරයට බැඳෙන දස සංයෝජනම සකස් කරගෙන, රාගය, ද්වේශය, මෝහය යන සංසාර බැමි තුන සකස් වී සිදුවන වැඩපිළිවෙල ගැන සම්පූර්ණ අවබෝධයක් ලබාදීම පටිච්ච සමුප්පාද ධර්ම විග්‍රහය යන වචනයේ ලියවී ඇති අර්ථයයි.

අවිද්‍යා මූල පටිච්ච සමුප්පාද විග්‍රහය තුලින් දුක්ඛ අරිය සත්‍යයත්, දුක්ඛ සමුදය අරිය සත්‍යයත් උන්වහන්සේ පෙන්වා දෙන සේක.

අවිද්‍යා මූල පටිච්ච සමුප්පාද නිරෝධය තුලින් දුක්ඛ නිරෝධ අරිය සත්‍යය උන්වහන්සේ අපට විග්‍රහ කර දෙන සේක.

කුසල මූල පටිච්චසමුප්පාද ධර්මය තුලින් දුක්ඛ නිරෝධ ගාමිනී



පටිපදා අරිය සත්‍ය අවබෝධ කරගන්නා අයුරු උන්වහන්සේ අපට පෙන්වා දෙන සේක. ලෝකෝත්තර අරිය අෂ්ටාංගික මාර්ගය වැඩීම මෙමගින් පෙන්වා දෙයි.

මේ අනුව සත්‍ය නිවන් මග පෙන්වාදී සෝවාන් මග, සකෘදාගාමී මග, අනාගාමී මග අරිහත් මග යන සත්‍ය නිවන් මග අප විසින් අනිවාර්යෙන්ම අවංකව, ඇපකැප වී අනුගමනය කලයුතු බව පෙන්වා දී ඒ අනුව තමන්ට සතර ඵලයන්ට පත්විය හැකි බව උන්වහන්සේ පහදා දෙන සේක.

ඉහත සඳහන් සතර මග අනුගමනය කිරීමට පෙර ලබාගත යුතු දැනුම් සම්භාරය සෝතාවදානයේ පඤ්ඤා සූතමයේ ඥාණය සේ නිවරදි උතුම් බුද්ධ ධර්මය අසා දැනම ලබා ගත යුතු බව උන්වහන්සේ පෙන්වා දෙන සේක.

උන්වහන්සේ උතුම් බුද්ධ ධර්මය දේශනා කරමින් සංදේශනාව, පටිච්චසමුප්පාද ධර්මය, ද්වතාවය, තිපරිවට්ටය, ත්‍රිලක්ඛණය, පින හා කුසලය, ඉන්ද්‍රියයන් හා ආයතන, මනස, මනින්ද්‍රිය හා මනායතනය, විඤ්ඤාණ චිත්තය හා ප්‍රඥා සිත පංචස්කන්ධය, පංච උපාදානස්කන්ධය, කෙලෙස් ගති හෙවත් කර්ම බීජ, සංකාර හා විසංකාර, සංඥා, යෝනිසෝමණසිකරණ හා අයෝනිසෝමණසිකරණය, ණය හා විනය, සංසාර සම්බන්ධය, සන්ධි හා විසන්ධි වීම, මත් වීම, මුලා වීම, අසාර වීම, ආසය හා අනුසය, විපස්සනා, අනුපස්සනා, අස්ස පස්ස, ආන පාන, සේවිතබ්බා, අසේවිතබ්බා, සතර සතිපට්ඨානය ආදී තවත් බොහෝ දැන ගත යුතු සියළුම ධර්ම කාරණා පිළිබඳ සියලු දෑ පැහැදිලිව, සරලව දේශනා කරමින් සෝතාවදානයෙන් හෙවත් ශ්‍රවණයෙන් සියළුම ඥාණය අපට ලබාදෙන සේක.

මේ අනුව ධර්ම ශ්‍රවණයෙන් දැනුම ලබාගෙන සත්‍ය අවබෝධයේ පිහිටමින් යථාභූත ඥාණ දර්ශනයකින් යුතු වීම නිවන් මග අනුගමනය කිරීමට අත්‍යවශ්‍ය වේ.

උන්වහන්සේ පෙන්වා දෙන සත්‍ය අවබෝධයේ පිහිටීමට අනිච්ච, දුක්ඛ, අනත්ථ ලෙස විග්‍රහ වන ත්‍රිලක්ඛණය නිවැරදිව අවබෝධ කර ගැනීමද අත්‍යාවශ්‍ය කරුණකි.

සබ්බේ සංකාරා අනිච්චාති
සබ්බේ සංකාරා දුක්ඛාති
සබ්බේ ධම්මා අනත්ථාතී ලෙස බුදුපියාණන් වහන්සේ දේශනා කොට ඇත.

කෙනෙකුගේ සිත මත්වීමෙන්, මුලා වීමෙන් පසු සිතින්, කයින්, වචනයෙන් සියළුම ක්‍රියා සිදුවනුයේ රාග බවින්, ද්වේශ බවින් හා මෝහ බවින්ය. තමන් කැමැත්තෙන් කරන එවැනි ක්‍රියා සිදුකරනුයේ තමන් කැමති පරිදි පවතී ලෙස සිතන බැවිනි (නිච්ච) එසේ සිතා කරන සියළුම ක්‍රියා සංඛාර ලෙස පෙන්වා දෙමින් එම සියළුම ක්‍රියා තමන් කැමති පරිදි නොපවතින බව (අ+ නිච්ච) බුදුන් වහන්සේද සබ්බේ සංකාරා අනිච්චාති ලෙස දේශනා කොට ඇති බව පෙන්වා දී, තමා කැමති පරිදි කටයුතු සිදු නොවීම තුල තමාට දුකක් උරුම වන අයුරු සබ්බේ සංකාරා දුක්ඛාති ලෙස පෙන්වා දී ඇත. එසේ තමා කැමති පරිදි සිදු වේ යයි සිතා කරන සියළු දේ එසේ නොවන බව හෙවත් සාරවත් බවක් නොමැති බව හෙවත් අසාර බව හෙවත් අනත්ථ බව සබ්බේ ධම්මා අනත්ථාතී ලෙසත් උන්වහන්සේ පැහැදිලි කර දෙන සේක.

මේ අනුව උන්වහන්සේ ත්‍රිලක්ඛණය තුලින් අපට අවබෝධ කර දෙනුයේ තමාගේ හිතේ ඇතිවන සිතුවිල්ලක වැරදි ස්වභාවය පෙන්වා දී ඒ වෙනුවට සත්‍ය අවබෝධ කර දී නිවැරදි සිතිවිල්ලේ පිහිටා හිතේ දුක් සිතිවිල්ලක් බිහිවන එක වලකා හිත දුකෙන් තොරව පවත්වා ගැනීමයි. රාග බවින්, ද්වේශ බවින්, මෝහ බවින් කටයුතු කිරීම අසාර බව, අනාථ බව වැටහෙත්ම සාර බව, නාථ බව අනුව කටයුතු කල ආකාරයක්ද ඇති බව අවබෝධ වේ. මෙහිදී සම්මා සතිය හෙවත් යෝනිසෝමණසිකාරය පැවැත්වීමෙන් සෑම වර්තමාන මොහොතකම පිරිසිදු සිතින් කල හැකි දෙය තීරණය කරගත හැකිවේ. එනම් ආශ්‍රය කලයුතු හා බැහැර කලයුතු සිතිවිලි



තෝරා බේරාගෙන ඒ අනුව කටයුතු කල හැකි වේ.

මෙලෙස සත්‍ය අවබෝධයේම පිහිටා සම්මා සතියෙන් ආශ්‍රය කල යුතු හා බැහැර කලයුතු සිතිවිලි තෝරා බේරාගෙන පිරිසිදු උපේක්ඛා සිතින්ම සෑම වර්තමාන මොහොතක කටයුතු කිරීමට හැකියාවක් ශක්තියක් ලබාදීම උදෙසාම සියළු ධර්ම අවබෝධය උපකාරී වේ. ලබාගත් ධර්ම අවබෝධය තුලින් සම්මා දිට්ඨියට පත්වීමක් සිදුවේ. එනම් රූප, වේදනා, සංඥා, සංකාර,විඤ්ඤාණ වලින් යුත් කිසිම පංචස්කන්ධයක් නිච්චයි, සුඛයි, අත්ථයි ලෙස ගත නොහැකි බවත් අවබෝධ වේ.

එලෙසම තමාගේ ශරීර කූඩුව හෙවත්, රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධයද තමා කැමති සේ නොපවතින, (අනිච්ච) සුඛ නොවූ (දුක්ඛ වූ) සාර නොවූ එනම් මම, මාගේ ලෙස මම කැමති ලෙස උපාදානය කරගත නොහැකි (අනත්ථ) වූ ස්වභාවයක් බවත් ලෙස සත්‍යම අවබෝධයක් ලබා තමාගේ කයේ විපරිනාමය, ජරාව, ව්‍යාධිය ඉදිරියේදී පවා එය යථා ස්වරූපය බව වැටහී ඒ වෙනුවෙන් හිතේ දුකක් සකස් නොවීමට සිත පවත්වා ගත හැකි වෙයි. මෙලෙස සම්මා දිට්ඨියට පත් වූ පසු තමාගේ සිතේ “සං” හෙවත් රාග, ද්වේශ, මෝහ සිතිවිලි පහල වනවාත් සමගම එය දැකගත හැකිවෙයි. එය ධම්මෝ සංදිට්ඨිකෝ වීමයි. එසේ එම රාග, ද්වේශ, මෝහ සිතිවිලි උපදින අවස්ථාවේම බැහැර කලයුතු බව පෙන්වා දෙන උන්වහන්සේ ඒ වෙනුවට වීත රාගී, වීත ද්වේශී, වීත මෝහී හෙවත් පිරිසිදු සිතින් ආශ්‍රය කලයුතු සිතිවිලි ඒ මොහොතේම දැක ආශ්‍රය කල යුතු බව පෙන්වා දෙන සේක.

බුදුන් වහන්සේද එය විග්‍රහ කර ඇති අයුරු උන්වහන්සේ අපට පෙන්වා දෙන්නේ

චිත්තේ සං උප්පජ්ජමානා උප්පජ්ජති
චිත්තේ සං පහීය මානා පහියති
චිත්තේ සං නිරුජ්ජමානා නිරුජ්ජති

යන විග්‍රහයෙන්ය. එතැන එතැනම උපදින “සං” එතැන එතැනදීම දැක ඒ මොහොතේම ප්‍රහාණය කොට ඒ මොහොතේම වීත රාගී, වීත දෝශී,

වීත මෝහී සිතිවිලි ආශ්‍රය කොට හිත නිවීමකට පත් කරගත යුතු බවයි.

මෙලෙස සෑම වර්තමාන මොහොතකම සං උපද්දවා ගැනීම හෙවත් රාග බවින්, ද්වේශ බවින්, මෝහ බවින් කටයුතු කිරීම අනුසය බිහි කිරීමක් ලෙස උන්වහන්සේ පෙන්වා දෙන සේක. මේ අනුව මුළු උතුම් බුද්ධ භාවනාවම සැකසී ඇත්තේ වර්තමාන මොහොතේ බිහිවෙන කෙලෙස් බව හෙවත් අනුසය බිහිකිරීම නවතා දැමීමයි. න + අනුසේති යන තත්වයට පත් වීමටයි.

සතර සතිපට්ඨාන භාවනාව දේශනා කරමින් "න අනුසේති" යන තත්වයට පත්විය හැකි සරලම ක්‍රමය පෙන්වා දී මෙතෙක් කලක් මනුෂ්‍යන් වැරදි ලෙස අවබෝධ කරගෙන ඇති සතර සතිපට්ඨාන භාවනාවේ මුලාවද උන්වහන්සේ පෙන්වා දෙන සේක. උන්වහන්සේ බුද්ධ දේශනාවේ "අනු" යන වචනයෙන් පෙන්වා දෙන්නේ වර්තමාන මොහොතේ අලුතින් පැවැත්ම පවත්වා ගැනීමටද සිතේ බිහිවන දෙයයි.

අනුසය යනු වර්තමාන මොහොතේ හිතේ බිහිවන කෙලෙස් බවයි. අනුපස්සනා (අනු + පස්සනා) යනු වර්තමාන මොහොතේ හිතේ බිහිවන කෙලෙස් බව දැක, එය ආශ්‍රය නොකල යුතු බව අවබෝධ කරගෙන එම සිතිවිල්ල සිතෙන් බැහැර කිරීමයි. එම සිතිවිල්ල දිගේ සිතේ දිගටම සිතිවිලි පවත්වා රෝද කිරීමට අවස්ථාවක් නොදී එම සිතිවිල්ල ඉවත් කිරීමයි. විපස්සනා යනු වි + පස්සනා වේ. එනම් වර්තමාන මොහොතේ සිතේ පහල වන සිතිවිලි වලින් ආශ්‍රය කිරීමට සුදුසු සිතිවිලි හා බැහැර කලයුතු සිතිවිලි තෝරා වෙන් කර ගනිමින් ආශ්‍රය කිරීමට සුදුසු සිතිවිල්ල ආශ්‍රය කිරීමටත් බැහැර කලයුතු සිතිවිල්ල බැහැර කිරීමටත් කටයුතු කිරීමයි.

සෑම වර්තමාන මොහොතකම ආශ්‍රය කිරීමට සුදුසු සිතිවිලි ආන ලෙසත් බැහැර කලයුතු සිතිවිලි පාන ලෙසත් බුදුන් වහන්සේ පෙන්වා දුන් සත්‍ය ආන පාන භාවනාව කුමක්ද ලෙස උන්වහන්සේ අපට සත්‍ය පහදා දී හුස්ම ගැනීම පිටකිරීම හෝ පිම්බීම හැකිලීම ලෙස වූ ප්‍රානයාම භාවනා ක්‍රම හෙවත් අනාර්ය භාවනා ක්‍රම වල හිර වී සිටි මනුෂ්‍යයන් සංසාරයේ අසංඥ තලයේ අති දීර්ඝ කාලයකින් අතරමං වීමට නොදී අපට සරණ වන සේක.



සත්‍ය ආන පාන බුද්ධ භාවනාව, සේවිතබ්බා අසේවිතබ්බා ලෙසද, අස්ස පස්ස ලෙසද විපස්සනා, අනුපස්සනා ලෙසින්ද පෙන්වන්නේ එකම භාවනාවකි. එනම් තමන් සත්‍ය අවබෝධයේ පිහිටමින් යථාභූත ඥාණ දර්ශනයෙන් යුතු වෙමින්, මුළු දවස පුරා පිරිසිදු උපේක්ඛා සිතක්ම පවත්වා ගැනීමට කටයුතු කරන්නට පුහුණු වීමක් ලැබීමයි. එනම් සෑම වර්තමාන මොහොතකම වීතරාගී, වීත ද්වේශී, වීත මෝහී සිතිවිලි ආශ්‍රය කිරීමටත්, රාග, ද්වේශ, මෝහ සිතිවිලි බැහැර කිරීමටත් යෝනිසෝ මනසිකාරයෙන් හෙවත් සම්මා සතියෙන් ඇප කැප වී කටයුතු කිරීමයි. මේ අනුව චිත්ත සංතානය පිරිසිදු වී ප්‍රඥාව පහදා ගත හැකි වේ.

භාවනා පසු භාවිතාවයි. එනම් භාවිතා කර පුහුණුවක් ලැබ ශක්තියක් ලැබ ගනුයේ සිත මිස කය නොවේ. කය පවතින සියළුම ඉරියව් තුල මේ බුද්ධ භාවනාව අනුගමනය කිරීම නිවන් මග වන්නේය. නිවන අත්විද ගන්නේ සිත මිස කය නොවන බැවිනි.

හිඳගෙන හෝ හිටගෙන හෝ ඇවිදිමින් හෝ සැතපෙමින් කයේ පවත්වන සියළුම ඉරියව් තුල සිත පවත්වා ගෙන පුහුණු කල යුතු සත්‍ය බුද්ධ භාවනාව සතර සතිපට්ඨාන සූත්‍ර දේශනාවෙන් උන්වහන්සේ පෙන්වා දෙන සේක.

"ආරණ්‍යගතෝවා, රුක්ඛමූල ගතෝවා, සුඤ්ඤාගාර ගතෝවා, නිසීදති පල්ලංකං ආභූජිත්වා, උජුං කායං, පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, ලෙස සතර සතිපට්ඨාන භාවනාව විග්‍රහ වනුයේ, බුද්ධ භාවනාවට පෙර කෙනෙකුගේ සිත සකස් කරගත යුතු ස්වභාවයන් පිළිබඳ විග්‍රහයක් බව උන්වහන්සේ පෙන්වා දෙන සේක.

ආරණ්‍ය ගතෝවා යනු හිත රණබිමක ස්වභාවයෙන් තොර බවයිත රුක්ඛ මූල ගතෝවා යනු ගසක මුලක් ලෙස නොසැලෙන ස්වරූපයෙන් යථාභූත ඥාණයෙන් යුතු වීමයි. සුඤ්ඤාගාර ගතෝවා යනු සිත පිරිසිදු තත්වයෙන් පවත්වා ගැනීමයි. එනම් හිත මත්නොවී රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් තොරව පවත්වා ගැනීමයි. නිසීදති පල්ලංකං ආභූජිත්වා යනු

හිතේ ඇති මානය පහලම අංකයට දමා කටයුතු කිරීමයි. උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා යනු ඉන්ද්‍රියන් හයෙන් එන අරමුණු වලට යෝනිසෝ මණසිකාරයෙන් කටයුතු කිරීමයි.

සතර සතිපට්ඨාන සූත්‍රයේ කායේ කායානුපස්සනා භාවනාව නිවැරදිව වැඩීම අනුව ඉතිරි පියවර තුනම වැඩීම සිදුවන බව උන්වහන්සේ පෙන්වා දෙන සේක.

කායේ කායානුපස්සනා භාවනාව තුලින් උන්වහන්සේ පෙන්වා දෙන්නේ ඇස, කන, නාසය, දිව, කය, මන යන ඉන්ද්‍රියයන් හයේ ක්‍රියාවේ වේගය පාලනය කිරීමයි. එනම් ධර්ම අවබෝධයේ පිහිටමින්, කෙලෙස් ප්‍රහාණය කිරීමට අධිෂ්ඨාන ශීලීව ඇප කැප වී කටයුතු කලයුතු ආකාරයයි. මෙහිදී ධර්ම අවබෝධයේ පිහිටා සං ප්‍රහාණය කිරීමට තමන්ගේ ඉන්ද්‍රියයන් හය සංවරව පවත්වාගත යුතු වේ. පජානති, සික්ඛති ලෙෂ මෙය විග්‍රහ කොට පෙන්වා දේ.

දීඝං වා අස්ස සන්තෝ දීඝං අස්සසාමි ති පජානාති
දීඝං වා පස්ස සන්තො දීඝං පස්සසාමි ති පජානාතී

ලෙස විස්තර කොට දෙන්නේ දීර්ඝ සංසාරයේ පටන් ආශ්‍රය කිරීමට සුදුසු වීත රාගී, වීත ද්වේශී, වීත මෝහි, අලෝභ, අද්වේශ, අමෝහ සිතිවිලි ද තම තමා පුරුදු පුහුණු කරගෙන ඇත. එවැනි සිතිවිල්ලක් වර්තමාන මොහොතේ තමාගේ සිතට අරමුණු වන්නේ නම් එම සිතිවිල්ල ආශ්‍රය කිරීමට සුදුසු බව අවබෝධ කරගෙන එම සිතිවිල්ල වැඩි වැඩියෙන් පරිහරණය කිරීමත්, ආශ්‍රය කිරීමත් කලයුතුය.

එමෙන්ම දීර්ඝ සංසාරයේ පටන් ආශ්‍රය කිරීමට නුසුදුසු රාග, ද්වේශ, මෝහ, සිතිවිලිද තම තමා පුරුදු පුහුණු කරගෙන ඇත. එවැනි සිතිවිල්ලක් තම තමාගේ සිතට වර්තමාන මොහොතේ අරමුණු වන්නේ නම් එම සිතිවිල්ල තවදුරටත් ආශ්‍රය කිරීමට නුසුදුසු බව අවබෝධ කොටගෙන එම සිතිවිල්ල බැහැර කල යුතුය.



රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමි ති පජානාති
රස්සං වා පස්සසන්තෝ රස්සං පස්සසාමීති පජානාති

ලෙස විග්‍රහ කොට දෙන්නේ (රස්සං) වර්තමාන මොහොතේ අළුතෙන් තමාගේ සිතේ අරමුණු වන ආශ්‍රය කිරීමට සුදුසු අරමුණු තෝරාගෙන ආශ්‍රය කිරීමත් තමාගේ සිතේ වර්තමාන මොහොතේ අළුතෙන්ම අරමුණු වන ආශ්‍රය කිරීමට නුසුදුසු අරමුණු අවබෝධ කරගෙන බැහැර කිරීමත්ය.

දීර්ඝ සංසාරයේ පටන් පුරුදු කර පුහුණු කර ගෙන ඇති, චිත්ත සන්තානයේ තැන්පත් ව ඇති කෙලෙස් ගති ආසව ලෙස උන්වහන්සේ පෙන්වා දෙන සේක. මෙසේ තම තමන්ගේ සිතේ තැන්පත්ව ඇති කෙලෙස් ගති නිසා එම කෙලෙස් ගති ස්වභාවයන් වර්තමානයේ උපදින්නට අවස්ථාව සැලසුන විට එම කෙලෙස් ගතිය අලුතෙන් නුපදවා (අනුසය නොඋපදවා) ගැනීමට කලයුතු හා කල හැකි ආකාරය සබ්බාසව සූත්‍රය ආශ්‍රයෙන් පියවර 7 කින් උන්වහන්සේ පෙන්වා දෙන සේක.

තවද වර්තමාන මොහොතේ තම සිතට අරමුණු වන සිතිවිලි වලින් කෙලෙස් ගති අළුතෙන් බිහි කර නොගෙන එම කෙලෙස් ගති තම සිතේ නැවත නුපදින ලෙස ඉවත් කර සිත පිරිසිදුව පවත්වා ගැනීමට උන්වහන්සේ නිවැරදි චතුරාරක්ඛා භාවනාව විස්තර කර දෙන සේක. එනම් මෙත්තානුස්සතිය, අසුභානුස්සතිය, මරණානුස්සතිය හා බුද්ධානුස්සති යන භාවනා හතරයි.

මේ සතර කමටහන් භාවනාව භාවිතයෙන්ම සිදුවනුයේ තමාගේ සිතේ කෙලෙස් ගතියක් බිහි වීමට නොදී සිත පිරිසිදුව පවත්වා ගැනීමයි. උන්වහන්සේ විග්‍රහ කරදෙන සතර කමටහන් භාවනාව අසා දැන උගෙන ගත යුතු වේ.

මේ අනුව උන්වහන්සේ පෙන්වා දෙන්නේ බුදුපියාණන් වහන්සේ නිවන් මග අනුගමනය කිරීමට ලෙස අපට පෙන්වා දී ඇත්තේ ඒක ධම්මයක් අනුගමනය කිරීමයි. එනම් නිවැරදි සත්‍ය උතුම් බුද්ධ ආනාපාන සති

භාවනාවේ පිහිටා මුළු දවසේ සියළු වර්තමාන මොහොතකම කටයුතු කිරීමයි. නිවැරදි සත්‍ය බුද්ධ ආනපාන සති භාවනාවේ යෙදීමෙන් සතර සතිපට්ඨානයම පූර්ණය වන බවත්, ඉන්ද්‍රි ධර්ම මතු වන බවත්, බල ධර්ම ඉස්මතු වන බවත් සප්ත බොජ්ජංග වැඩෙන බවත්, මේ අනුව බෝධි පාක්ෂික ධර්ම සම්පූර්ණ වී නිවනම අත්විඳ ගත හැකි බවත්, උන්වහන්සේ පෙන්වා දෙන සේක.

මේ ලෙස සත්‍ය උතුම් බුද්ධ ආනාපාන භාවනාව පහදා දීමට හුරු කිරීමට උන්වහන්සේ දවස් 7 ක් එක දිගටම උදේ හවස ධර්ම දේශනා පවත්වමින් පළමු වරට හෙළ බිමේ සත්‍ය බුද්ධ භාවනාව වැඩසටහනක් සෑම මාසයකම පවත්වන සේක. එංගලන්තයේ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති දැනට අන්තර්ජාලයට ඇතුලත් කර ඇති සත්‍ය ත්‍රිපිටකය අතීතයේ කෑගල්ලේ මා තුල අළුලෙනේ තැන්පත් කර තිබූ සත්‍යම බුදු බණ ලියවී ඇති ත්‍රිපිටකය බව උන්වහන්සේ විස්තර කර දෙන සේක. මේ අනුව සත්‍යම ත්‍රිපිටකයේ සඳහන් සූත්‍ර දේශනාවල මාගධී බසින් ලියවී ඇති අර්ථය පැහැදිලි කර දී සත්‍ය උතුම් බුද්ධ භාවනාව මෙලෙස උන්වහන්සේ අපට පෙන්වා දෙන සේක. මෙලෙස සතර මග අනුගමනය කොට සතර ඵලයට පත්විය හැකි ලෙස අපට අනුගමනය කිරීමට ඇත්තේ සරල වැඩපිළිවෙලකි.

මේ අනුව පළමුවෙන්ම සෝවාන් මාර්ගය අනුගමනය කොට සෝවාන් ඵලයට පත්වීම සිදු වනුයේ  උතුම් ධර්මය අසා දැනගැනීමෙන් අවබෝධ කොට ගැනීමෙන්, පිරිසිදු සිත පහදා ගැනීමෙන් තමන් කළයුතු නොකළ යුතු දෑ සම්බන්ධව හා අනුගමනය කළ යුතු මග පිළිබඳ පිරිසිදු පැහැදිලි දැනුමක් ලබා ගැනීමෙන් හා සෝතාපත්ති අංග සම්පූර්ණ කර ගැනීමෙනුයි. සෝත  ආපන්න ලෙසින් පෙන්වා දෙනුයේ ප්‍රධාන වශයෙන් ධර්ම ශ්‍රවණය තුළින් අයත්වන තත්වයක් ලෙස සෝවාන් ඵලය අත්වන බවයි.

ඇත්ත වශයෙන් කෙනෙක් ගිහි ජීවිතය තුළදී සෝවාන් ඵලයට පත් වුවහොත් ඔවුන්ගේ ගිහි ජීවිතය ඉතාමත් සාර්ථක වනු ඇත. මේ උතුම් බුද්ධ ධර්මය අසා දැනගත් කෙනෙකුට සෝවාන් ඵලයට පත්වීමෙන් ගිහි



ජීවිතයට උරුම වන වාසි බොහෝය.

ගිහි ජීවිතයේ බොහෝ ආරවුල්, ගැටුම්, දුක් කරදර, අසමගිකම් අඩුවීම, ඉවසීම කරුණාව, නුවනින් විමසා කටයුතු කිරීම. වැරැද්දට සමාව දීම හා තමා අතින් සිදුවූ වැරැද්දට සමාව ගැනීම, අන්‍යෝන්‍ය පරිත්‍යාගය, කැපවීම, කිසිදා සෑහිමකට පත් නොවනා තන්හාව අඩුවීම, ශිලාචාර ගති ඇති වීම, වංක ගති අඩුවීම, සංසාරයේ අතරමං වන මායාකාරී වැඩපිළිවෙලට හසු නොවීම, පුහු මාන්නය නැති වීම, සියළු දෙනාට ආශ්‍රයට ප්‍රියවීම, අන් අයට අවැඩක්, අසාධාරණයක් කිරීමට සිත් පහල නොවීම, අන් අයගේත් තමන්ගේත් යහපත උදෙසාම කටයුතු කිරීම. යුතුකම් වගකීම් නිවැරදිව ඉටු කිරීමට සිත් පහල වීම. සැප හඹා යෑමට ඇති වුවමනාව අඩුවීම, ලද දෙයින් සතුටු වීම, මෛත්‍රී සිතෙන්ම ජීවත් වීමට සිත් පහල වීම, දුක් කරදර නැති බැරි කම් හමුවේත් බොහෝ සේ සාමකාමී ශාන්ත සිතින් ජීවත් වීම, ජීවත් වන්නේ සැප විඳින්න නොව සිත පිරිසිදු කරගන්නට බව වැටහීම, කිසිදා සිරිසද්ධර්මයෙන් බැහැර නොවීම, කෙනෙකුගේ වැරැද්දක් දුටු විට වැරදි කළ පුද්ගලයා කෙරෙහිද අනුකම්පා කරුණා සිතක් පහල වී වැරැද්ද කාරුණිකව පහදා දිය හැකි නම් එසේ පහදා දීම සහ කලයුතු යමක් ඇත්නම් එයද කාරුණිකව පහදා දීම. තමාගේ ලාභයට වාසියට කටයුතු කිරීම අඩුවීම ආදී බොහෝ දේ තුළින් ලෞකික ජීවිතය සාමකාමී සැනසිලිදායක තත්වයකට පත්වනු ඇත.

මේ අනුව සමාජයට යහපත් වනු ඇත. එවන් මනුෂ්‍යයෙකුගෙන් උතුම් පාලකයෙකු බිහිවී රටක්ම සුවපත් වනු ඇත. මනුෂ්‍යයාගේ දුක් දුරු වනු ඇත. මේ අනුව උතුම් බුද්ධ ධර්මයේ අගය සියළු දෙනාටම වැටහේවා !

පූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර හිමියන් විසින් රචිත ධර්ම ග්‍රන්ථ

- නිවන් අවබෝධ කර ගැනීමට උපකාර වන පරම පවිත්‍ර සිරි සද්ධර්මය
- බුද්ධ බල - බුද්ධ ශක්ති බුද්ධ ඥාණ විග්‍රහය
- විමුක්ති මාර්ගය පෙන්වා වදාල උතුම් බුද්ධ ධර්මය භක්තියෙන් අදහන

බුද්ධාගමක් කරා පරිවර්ථනය වුයේ කෙසේද?

- සම්මත සත්‍ය හා පරමාර්ථ සත්‍ය හෙවත් දැනුම හා දැක්ම
- ගෝතම බුදුන් වැඩ සිටි දඹදිව හෙළයා හදුනාගත යුත්තේ ඇයි ?
- සමණ අරණ විහරණ බුද්ධ භාවනා සත්දින විහරණපටිපදා
- බුද්ධ දේශණාවෙහි පෙන්වා වදාල භාවනාව යනු කුමක්ද ?
- ආනන්තරික පාප කර්මයන් හා සංඝභේද සූත්‍රය

පරම පවිත්‍ර සිරි සද්ධර්ම දේශනා ඇතුලත් වෙබ් අඩවි

මේ උතුම් හෙළබිමෙහි සත්‍යය හෙළි දරව්ව

අමඟ

බුදුන් වහන්සේ නිවන් අවබෝධ කර ගැනීමට පෙන්වා දී ඇත්තේ සතර මග හෙවත් සෝවාන් මාර්ගය, සකෘදාගාමී මාර්ගය, අනාගාමී මාර්ගය, අරහත් මාර්ගය සම්පූර්ණ කරගැනීමයි. එම සත්‍ය නිවන් මග



අනුගමනය සඳහා පෙන්වා දුන් වැඩ පිළිවෙලින් බැහැර වූ නිවන් අවබෝධ කර ගැනීමට ලෙස සිතා කරන සියළුම වැඩ පිළිවෙලවල් අමඟ ලෙස පෙන්වා දිය හැක. නැතහොත් රාග බවින්, ද්වේශ බවින්, මෝහ බවින් කටයුතු කරමින් ලෝක පැවැත්ම නිච්චයි, සුඛයි, අත්ථයි ලෙස සිතා

ලෞකික පැවැත්ම තණ්හා, උපාදානයෙන් අල්ලා ගැනීමට කරන සියළුම වැඩපිළිවෙලවල් අමග ලෙස පෙන්වා දිය හැක.

වර්තමානයේ අප රට තුල නිවන් අවබෝධ කර ගැනීමට සැකසී ඇති සියළුම වැඩපිළිවෙලවල් තුළ ඇත්තේ අමගම බව උතුම් බුද්ධ ධර්මයෙන් පෙන්වා දිය හැක.

වර්තමානයේ අප රට තුළ ක්‍රියාත්මක වන බුද්ධාගම යනු දිනෙන් දින (සං වර්ධනය) හෙවත් රාගය, ද්වේශය, මෝහය වර්ධනය වන වැඩපිළිවෙලින් වර්ධනය වෙමින් පවතින බව අප කාහටත් අවබෝධ කර ගත හැක.

වන්දනා, පූජා, දාන, සීල, භාවනා වැඩ සටහන් සීල ව්‍යාපාර, කඨින පිංකම් හා පෙරහැර බුද්ධ රාජ මන්දිර, කවි ගායනා, සෙත් පිරිත් අනේක විධ කන්නලව් වලින් සමන්විත බෝධි පූජා රෝග සුව කරන යාඥා වැනි වැඩපිළිවෙලවල් සංදර්ශන වලින් සමන්විත පෙරහැර, සංදර්ශන, අනේක විධි සැරසිලි වලින් සමන්විත උත්සව, බණ කථා, සාහිත්‍ය රස කථා, බුද්ධ රූප වර්ණනා, බුදු ගුණ ගායනා, බුදුන් වහන්සේගේ බුද්ධ ශරීරය ගැන අස්වාභාවික අද්භූත කථා, බුදුන් වහන්සේ ගැන මැජික් සංදර්ශන කථා, ජාතක කථා වර්ණනා, බුදුන් වහන්සේගේයැයි සිතා කරන ධාතු වන්දනා, බුදුන් වහන්සේගේ ධාතූන් වහන්සේලා ගැන විග්‍රහ කරන සාවද්‍ය කථා, අනේක විද වෘත සමාදන් වීම්, විවිධ තරඟ වැඩපිළිවෙලවල් ආදී අනේක විධි වැඩපිළිවෙලින් සැදී ඇති බුද්ධාගමක් අපරට පුරා ක්‍රියාත්මක වේ. මෛත්‍රී බුදුන් බුදුවනතුරු නිවන් අවබෝධ කර ගැනීමක් සිතියවත් නොහැකි යැයි සිතා කවදා හෝ නිවන් අත්පත්කර ගැනීමට විවිධ මනුෂ්‍යයින්ට සිතෙන ආකාරයට කටයුතු කරමින් ඒ අනුව අනෙක් මනුෂ්‍ය පිරිසක්

මෙහෙයවමින් වර්තමාන මනුෂ්‍යයන් නිවන් සොයමින් නිවනින් සම්පූර්ණයෙන් බැහැර වූ අමගම අනුගමනය කරති.

කිසිවෙක් නොදන්නා, නොතේරෙන පාලි සංස්කෘත භාෂා වලින් ලියවී ඇති බුදුබණ කිසිවෙකුට කිසිම ලෙසකින් අර්ථයක් වටහා ගැනීමට නොහැකි සේ සංස්කෘත වචන යොදා ලියා ඇති ත්‍රිපිටක පරිවර්තන, අභිධර්ම විග්‍රහ ආදී සියළු දේ කොතෙක් අසා සිටියත් සාමාන්‍ය මනුෂ්‍ය මොලයක් විකෘතිවනු හෝ නොතේරෙන කමින් අසරණ වීමක් සිදු වනු විනා කිසිම නිවනක් කිසිවෙකුට අත්පත් නොවන්නේය. නොතේරෙන බුදු බණ ආධිපත්‍යයට ගෙන කැමති කැමති පිරිස ගුරුවරු වෙති. ඒ අනුව ලාභ සත්කාර ආදී නොයෙක් බුහුමන් ලබති. තම තමන්ට හිතුමතේම නිවන් අත්පත්කර ගැනීමට වැඩපිළිවෙලවල් දියත් කරති. ගරු බුහුමන් ලාභ සත්කාර ලැබීමට කැමති පිරිසට මෙය ඉතා පහසු වැඩපිළිවෙලකි. එවැනි පිරිස සිතනුයේ සත්‍ය කිසිවෙක් නොදන්නා නිසා තම තමාගේ අසත්‍ය අන් අයට ඔප්පු කළ නොහැකි ලෙයසි. අසත්‍යයෙන් හැකිතාක් කලක් කැමති ලෙස ජය ලැබිය හැකි ලෙසසි. තමන් කැමති තරම් මනුෂ්‍යයන්ගෙන් වැඳුම් පිදුම්, ගරු බුහුමන්, ලාභ සත්කාර ලැබිය හැකි බවයි.

මේ ආදී ලෙස අපරට තුළ ක්‍රියාත්මක වන අනේක විධ අමග වැඩපිලිවෙලවල් වල අසාරත්වය ලියා අවසන් කළ නොහැකි තරම්ය.

මා මෙලෙස සියලු අමඟ වැඩ පිළිවෙලවල් පෙන්වා දුන්නේ කිසිවෙකුට හෝ අපහාස කරන චේතනාවෙන් නොවන බවත් වැරැද්ද නිවැරැද්ද තේරුම් කොට දීමේ මහත් කාරුණික සිතෙන්ම බවත් ලියා දක්වමි.

මේ සියළු අමග වැඩපිළිවෙලවල් මනුෂ්‍යයා විසින් සිදුකරනුයේ ඔවුන් ඔවුන්ගේ නොදන්නා කම නොදන්නා නිසාය. නැතහොත්, රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් තම චිත්ත සංතානය සහමුලින්ම වාගේ වැසී ඇති



බැවින්ය.

එහෙත් උතුම් ස්වාමින් වහන්සේ මේ සියළු දෙනාටම සම මෙත් සිතින් සරණ වන සේක.

උන්වහන්සේ පෙන්වා දෙන උතුම් බුද්ධ ධර්මය නොදන්නා කමින්ම සියළු විපත්දායක අමග වැඩපිලිවෙලවල් සැකසී ඇත.

සත්‍ය තිලක්ඛණය නොදන්නා කමින්ම ඒ වෙනුවට අසත්‍ය අනිත්‍යයි, දුකයි, අනාත්මයි ලෙස ත්‍රිලක්ෂණයක් පුරුදු වීමෙන්ම සියලු දෙනාටම හේතු ඵල ධර්මය ක්‍රියාත්මක වන අයුරු වටහා ගැනීමට නොහැකි වී ඇත. සත්‍ය අවබෝධයේ පිහිටීමට නොහැකි වී ඇත.

තවද සංඛාර යන වචනයට සංස්කාර ලෙස අර්ථ ගැන්වීමෙන්ද මජ්ජිමා පටිපදාව මැදුම් පිළිවෙත ලෙස අර්ථ ගැන්වීමෙන්ද සම්මා යන්න නොදන්නා කමින්ද, සංදේශනාව නොදන්නා කමින්ද, තවත් බොහෝ සත්‍ය බුද්ධ දේශනාව විකෘති ලෙස පරිවර්තනය වීමෙන්ද සියලු විපත් සිදුවී ඇත.

තවද අපරට බෞද්ධයින් මනුෂ්‍යත්වයේ වටිනාකම නොදන්නා නිසා තමාගේම පිරිසිදු බලගතු සිතේ ශක්තිය නොපෙනෙන බලවේගයට පවරා පිහිට ශාන්තිය අනුන්ගෙන් යැද යැද කටයුතු කරන ආකාරයත් වර්තමාන මනුෂ්‍යයන් අපගේ බුද්ධ දේශය ප්‍රතික්ෂේප කර, උතුම් සිරි සද්ධර්මය ප්‍රතික්ෂේප කර නිවන සොයා ඇදහිලි වල යෙදීමත් එකම ස්වරූපයේ අඥාණ ක්‍රියා දෙකකි.

උතුම් ස්වාමීන් වහන්සේ මෙලෙස අමග ගොස් මුලා වී සිටින සියළුම දෙනාට සත්‍ය අවබෝධ කර ගැනීමට සත්‍ය මඟ පහදා ගැනීමට දැනගත යුතු සියළු කාරණා බුද්ධ පරිනිර්වාණයේ සිටම විග්‍රහ කර පෙන්වා දෙන සේක.

තමා තමා දැන හෝ නොදැන කරන සියළු අමග වැඩ පිලිවෙලවල් නිසා නියත වශයෙන් තම තමාට විපාක විඳීමට සිදුවන ආකාරය උන්වහන්සේ සංඝභේද සූත්‍ර ආශ්‍රයෙන් පෙන්වා දෙන සේක. උන්වහන්සේ දේශනා කරන උතුම් බුදු බණ අසා දැන මින් මතු තමා කටයුතු කළ යුතු

ආකාරය අසා දැන ගත හැකිවේ.

මේ අනුව රාග, ද්වේශ, මෝහ වල අසාරත්වය ආදීනව කෙනෙකු අවබෝධ කරගන්නේ නම්

හේතු ඵල සම්බන්ධ අනුව තම තමා කරන සියළු හේතු වලට උරුම වන ඵල තම තමාට අවබෝධ කරගත හැකිනම්

තම තමාගේ මනුෂ්‍යත්වයේ අගය වැටහේ නම්,

තම තමාගේ පිරිසිදු සිතේ බලය අවබෝධ වන්නේ නම් සත්‍ය තිලක්ඛණය අවබෝධ වී ලෝක ස්වභාවය වැටහේ නම්

පරම පවිත්‍ර සිරි සද්ධර්මයේ පෙන්වා දෙන නිවන අවබෝධ කර ගත හැකි යැයි වැටහේ නම්

උතුම් බුද්ධ ධර්මය යටපත් වී උන්වහන්සේ පෙන්වා දෙන පරිදි බුද්ධාගම බිහි වු අයුරු වැටහේ නම්,

අතීතයේ හෙලබිමේ ඉතිහාසය ගැන පෙන්වා දෙන විස්තරය ගැන නිවැරදිව සිතීමට හැකි නම්

අමග වැඩ පිලිවෙලක් තුළ කටයුතු කරන සියළුම ගිහි පැවිදි පිරිසට තම තමන්ටත් අන් සියළුම මනුෂ්‍යයන් ඇතුළු සියළුම සත්වයන්ටත් මෙතෙක් තමා සිදු කළේ කෙතරම් අපරාධයක්ද ලෙස වැටහී යනු ඇත. ඒ අනුව තමා අතින් සිදුවු වැරදි වලට සමාව ගන්නත් සියලු වැරදි වැඩ නවත්වන්නත්, නිවැරදි වැඩ ක්‍රියාත්මක කරන්නත්, උතුම් බුද්ධ ධර්මයට අනුගමනය කරන්නත් සිතුවිලි පහල විය හැක.

එසේ තම තමාගේ වැරුද්ද නොවැටහෙන සියළු දෙනාට සංඝ භේද සුත්‍ර වලින් පෙන්වා දෙන ලෙස ආනන්තරීය පාප කර්ම මගින් දුක් විපාක ගෙවන්නට සිදුවනු ඇත.

බුදුන් වහන්සේ සුත්‍ර ධර්ම පහකම සංඝභේදය විග්‍රහ කර දී ඇති බව පෙන්වා දෙන උන්වහන්සේ අංගුත්තර නිකායේ ඇති පඨම ආනන්ද සූත්‍රය



පෙන්වා දෙමින් බුදුන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට සංඝ භේදය යනු කුමක්දැයි පෙන්වා දුන් අයුරු ලියා දක්වා ද ඇත. උන්වහන්සේගේ දේශනාවක් ඇසුරින් ලියා දක්වා ඇති සංඝභේද සූත්‍රයේ ඇති විස්තරයක් පහතින් උපුටා දක්වමි. (පිටු 4 - 13)

අද කාලයට අනුව දැනගත යුතු, තේරුම් ගත යුතු, මෙතෙක් කල් යටපත්ව තිබූ වැදගත්ම ධර්මතාවයක් පිළිබඳව, පැහැදිලි කරගත යුතුව තිබෙනවා. බුදුහාමුදුරුවෝ දේශනා කරපු බුද්ධ ධර්මය බොහොම විකෘති කරල දේශනා කරමින් තමන්ටම අහිතකර ඵල විපාක උරුම වන බව එහෙම නැත්නම් ආනන්තරීය පාප කර්මයක් තමන්ම කරගන්නා බව නොදන්නා අය අද සමාජයේ බොහෝ ඉන්නවා.

විශේෂයෙන්ම වර්තමාන යුගයේදී නොයෙකුත් සන්නිවේදන මාර්ග වලින් සහ විවිධ ආකාරයෙන්, විවිධ තැන්වල ධර්මය දේශනා කරනව, බුද්ධ ධර්මය දේශනා කරනව කියල. තමන් කරණ කියන දේ හේතු ඵල දහමට ගලපා බලන්නේ නැතිව ක්‍රියා කිරීම වැරදියි. ඒ අය කෙරෙහි අනුකම්පාවෙන් ඒ අය තේරුම් නොගත්ත, ඒ අයට අවබෝධ නොවුනු, ඉතාම වැදගත් දෙයක් බුද්ධ දේශනාවෙ දේශනා කරල තියෙනව. බුදුහාමුදුරුවෝ දේශනා කරපු සුත්‍ර ධර්ම කිහිපයක් ඇසුරෙන් මේ කරුණු ලෝකයාට දේශනා කර පැහැදිලි කරල දීම සඳහා ත්‍රිපිටකයෙ අංගුත්තර නිකායෙත් විභංගප්පකරණයෙත් මහාවග්ග පාලියෙත් තියෙන ධර්ම කාරණා කිහිපයක් පිලිබඳව දේශනා කරන්න බලාපොරොත්තු වෙනවා.

මෙහි බුදුහාමුදුරුවෝ පංච ආනන්තරීය පාප කම්මයන් ගැන මෙසේ දේශනා කරලා තියෙනවා.

1. මාතා විරෝපිතා, තමන් බිහි කල මවගේ ජීවිතේ තොර කිරීම,
2. තමන්ගෙ පියාගෙ ජීවිතේ තොර කිරීම,
3. අරහතුන් වහන්සේ නමකගේ ජීවිතය තොර කිරීම.
4. කිලිටු චේතනාවක් ඇතිව වැරදි චේතනාවක් ඇතිව බුදු කෙනෙක්ගෙ ඇඟේ ලේ සෙලවීම. (නමුත් ජීවක තුමා

බුදුහාමුදුරුවන්ගෙ කකුල තුවාල වුනාම බෙහෙත් දැමීම සිදුකලා. එතනදි ලේ සෙලවුනා. නමුත් ඒක වැරදි චේතනාවක් නෙවෙයි. යහපත් චේතනාවක්. එහෙත් බුදුහාමුදුරුවන්ගෙ ලේ සෙලවීම වැරදි චේතනාවක් ඇතිව කලොත් ඒකත් පංච ආනන්තරිය පාප කම්ම වලට අහුවෙනවා.)

5. ඊට පස්සෙ අවසාන එක තමා සංඝෝ භේදෝ භින්නො" සංඝභේදය කිරීම,

මේ පහ තමා ආනන්තරිය පාප කම්ම. යමෙක් ආනන්තරිය පාප කම්මයක් කල මොහොතේ පටන්, අන් අන්තරික, අතරක් නැතිවම ඒ පාප කම්මයේ ඵල විපාක ඒ පුද්ගලයාට උරුම වෙනවා, ඵල විපාක ලැබෙනවා, විඳවන්න වෙනවා. ඒ නිසා පංචානන්තරිය පාප කම්මයක් කල පුද්ගලයාට ඒ පාප කම්මයේ බලය වැඩි නිසා ඔලුව උස්සන්න බැහැ, ධර්මය අහන්න බැහැ, ධර්මය තේරුම් ගන්න බැහැ. ඒ නිසා පාප කර්මය ගෙවා අවසන් කරන තුරු ධර්ම මාර්ගයේ යන්න බැහැ. මග ඵල ලබන්න බැහැ. මැරුනට පස්සෙත් සතර අපායට ගිහිල්ල, ඒ පාපය, තමන් කර ගත්ත විනාශය ගෙවල අවසාන වන තුරුත් සතර අපායෙ ගත කරනවා.

ඒ නිසා බුදුහාමුදුරුවො දේශනා කරල තියෙනව, මිනිහෙක් හැටියට උපදින යමෙක් තමා විසින් කරගන්න තියෙන ලොකුම හා බලවත්ම පාප කම්මය මේ පංචානන්තරිය පාප කම්ම හැටියට. හැබැයි පංචානන්තරිය පාපකම්මයක් කලා කියල නිවන් දකින්න බැරි වෙන්නෙත් නැහැ. දැන් අග්‍රශ්‍රාවකයන් වහන්සේ කෙනෙක් වන මුගලන් මහ රහතන් වහන්සේ පංචානන්තරිය පාප කම්මයක් කලා. නමුත් අරහත් වුනා. හැබැයි ඵල විපාක අරහත් වුනාට පස්සෙත් කොටසක් වැය කරන්න වුනා.

ඒ නිසා මේ පංචානන්තරිය පාප කම්ම වල අන් අන්තරික කියන එකේ තේරුම අතරක් නැතිවම පාපයේ ඵල විපාක ගෙවන්න සිද්ධවෙනව කියන අදහසයි. ඒ වගේම ආනන්තරික සමාධියත් තියෙනව. යම් මග ඵලලාභි අරහතුන් වහන්සේ කෙනෙක් අතරක් නැතිවම එක දිගටම දවස් හතක් (7) සංඥා වේදයිත නිරෝධ සමාපත්තියට සමවැදිල ආනන්තරික



සමාධියෙන් ජීවත් වෙන්න පුළුවන්. ජීවත් වෙනව, ඉන්නව හුස්ම ගන්නව, සියළුම දේ කරනව, හැබැයි අතරක් නැතිවම සමාධිය පවතිනව. ඒකට කියනව ආනන්තරික ඵල සමාධිය කියල. ඒ වගේම ආනන්තරික කුසල ධම්මත් තියෙනව. එතෙනදි යම්කිසි පුද්ගලයෙක් සෝතාපන්න ඵලයට පත්වුනොත් අරහත් මග ඵලය සම්පූර්ණ වෙල, මේ පැවැත්ම අවසන් කරන තුරුම අතරක් නැතිවම නිවන කරා ගමන් කරනව. ඒක ආනන්තරික කුසල ධම්ම කියල බුදුහාමුදුරුවො දේශනා කරල තියෙනව. ඒ නිසා ආනන්තරික කියන වචනෙ කොතනටත් ගැලපෙනවා. කුසල ධම්මයටත් ගැලපෙනවා. ඒක තේරුම් ගන්න ඕන.

බුදුහාමුදුරුවන්ගෙ දම් සභා මණ්ඩපවලදි ලොකු ප්‍රශ්නයක් ආවා, හැම කෙනෙක්ම කථා කරන්නට පටන් ගත්තා මේ සංඝ භේදය, සංඝභේදය කියනව, මේකෙ තේරුම මොකක්ද කියල. ඒ නිසා බුදුහාමුදුරුවො මේ සංඝභේදය කියන එක සූත්‍ර ධර්ම කිහිපයකදිම පැහැදිලිව පිරිසිදුව විග්‍රහ කරලා තියෙනවා.

මේ විග්‍රහය තියෙන්නෙ ත්‍රිපිටකයේ අංගුත්තර නිකායෙ හයවන පොතේ දශක නිපාතයෙ. ඒ කියන්නෙ කරුණු දහයකින් විස්තර කරල තියෙන සූත්‍රයක්. සූත්‍ර ධර්ම පහකම මේ සංඝ භේදය විග්‍රහ කරල තියෙනව. ආනන්ද හැමුදුරුවන්ට දේශනා කරපු සූත්‍රය තමා පඨම ආනන්ද සූත්‍රය. අංගුත්තර නිකායෙ 10.1.4.9 යටතේ තියෙන සූත්‍රයක්.

> අථ ඛො ආයසමා ආනන්‍දො යෙන භගවා තෙනුපසංකමි
> උපසඞකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමනතං නිසීදි
> එකමනතං නිසිනෙනා ඛො ආයසමා ආනන්‍දො භගවනතං එතදවොච

**උපසඞකමිත්වා භගවන්තං අභිවාදෙත්වා** බුදුහාමුදුරුවන්ට වැඳල එකත්පස්ව ඉඳලා මෙන්න මේ වගේ ප්‍රශ්නයක් ඇහැව්වා.

**නිසිනෙනා ඛො ආයසමා ආනන්‍දො භගවනතං එතදවොච, එතදවොච** කියන්නෙ ප්‍රශ්නයක් විමසුව, ඇහැව්වා කියන එකයි.

මේකයි ප්‍රශ්නය

සඞ්ඝ භෙදෙ සඞ්ඝ භෙදෙති භනෙත වුච්චති

කිනතාවතානු බො භනෙත සඞෙඝා භිනෙනා හොතී ති

මේ හේද, භින්න යන්න එකට යන වචන දෙකක්

භාග්‍යවතුන් වහන්ස, මේ හැම කෙනෙක්ම සඞ්ඝ හේදය, සඞ්ඝ හේදය කියනව, මේකෙ තේරුම මොකක්ද?මේක කොහොමද සිදුවෙන්නෙ, කා අතින්ද මේක සිදුවෙන්නෙ, මොන ආකාරයෙන්ද මේක සිදුවෙන්නෙ, යමෙක් මේ පාපය සිද්ධ කරනව නම් සිද්ධ වෙන්නෙ කොහොමද? කියල ආනන්ද හාමුදුරුවො ඇහැව්වා.

ඒක බුදුහාමුදුරුවො බොහොම කෙටියෙන් පේලි ගණනකින් ආනන්ද හාමුදුරුවන්ට විග්‍රහ කලා.

ඉධානන්ද භික්ඛු

භික්ඛු කියන්නෙ මහණ මෙහෙණ උපාසක උපාසිකා සිව්වනක් පිරිස

අධම්මං ධමෙමාති දීපෙනති

ධම්මං අධමෙමාති දීපෙනති

අවිනයං විනයෝති දීපෙනති

විනයං  අවිනයෝති දීපෙනති

අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති

භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති

අනාචිණ්ණං තථාගතෙන  ආචිණ්ණං තථාගතෙනාති දීපෙනති

ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙනති

අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති  දීපෙනති

පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති  දීපෙනති

මෙතන වචනයක් තියෙනව දීපෙන්ති කියල. දීපෙන්ති කියන්නෙ යමෙක් අනුමානයෙන් වැරදි ලෙස පන පිහිටුවා ප්‍රකාශ කිරීම. තමන් හරියට



අත්විඳගන්නෙ නැතිව අත්විඳගත්තා කියල තවත් කෙනෙකුට ඒත්තු ගන්වන පරිදි දේශනා කිරීම හෝ ප්‍රකාශ කිරීම.

අධම්මං ධමෙමාති දීපෙනති   - ධම්මං අධමෙමාති දීපෙනති

ධර්මය යැයි අධර්මය  දේශනා කිරීමත්, අධර්මය යැයි ධර්මය දේශනා කිරීමත්  ඒක වැරදියි කියල මෙහෙම එකක් නැහැ කියල ධර්මය යැයි අධර්මය කිරීමත් අධර්මය ධර්මය කිරීමත් ඒ දෙකෙම දීපෙන්ති කියන වචනයෙන් කියවෙන්නෙ තව කෙනෙකුට පැහැදිලි කරල තමන් අනුමාන ඥාණයෙන්  දැන ගත් දේ එහෙම නැත්නම් වැරදියට කාගෙන් හරි අහගත්ත දේ තවත් කෙනෙකුට ප්‍රකාශ කරල ඒ පුද්ගලයාව අතරමං කරනව මං මුලා කරන අර්ථයක් කියල වැරදි පාරකට යොමු කරනව කියන එකයි  මෙතන දීපෙන්ති කියල කියන්නෙ, ඒ නිසා මේක සංඝ හේදයට අහුවෙනව.

බුදුහාමුදුරුවො දේශනා කරන ලද ධර්මය, පටිච්ච සමුප්පාද ධර්මය, සංදේශනාව, ද්වතානුස්සතිය, තිපරිවට්ටය, චතුඅරිය සච්ච, අනිච්ච, දුක්ඛ, අනත්ථ ආදි වශයෙන්ද සතර ඍද්ධි පාද, සතර සතිපට්ඨාන, ආදී සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වශයෙන් නිවනට උපකාරවන සේ දේශනා කරන ලද ධර්මය වෙනස් කර ධර්මය අධර්මය සේ දේශනා කිරීමත් අධර්මය ධර්මය සේ දේශනා කිරීමත් යන දෙකම සංඝ හේදයයි.

අවිනයං විනයෝති දීපෙනති  - විනයං  අවිනයෝති දීපෙනති

බුදුහාමුදුරුවො ණය විග්‍රහයක් කරල,  විනය විග්‍රහ කලා. ඒ කියන්නෙ ණයෙන් වෙන්වෙන ආකාරයයි විග්‍රහ කලේ.  මේ ණය, විනය කියන කරුණු දෙක හොඳට තේරුම් ගත යුතුයි.  මේ ණය කියන්නෙ මුදලින් ණය වෙන කථාවක් නෙවෙයි.  දස අකුසල් වලින් සහ ව්‍යාපාදය, අභිජ්ජා, දොමනස්ස යන මේ සියළුම දේ වලින් ණය වෙනවා.  ඒ කියන්නෙ තමන් කරන, කියන, හිතන වචනයෙන්, ක්‍රියාවෙන්, සිතුවිල්ලෙන් කරන්නාවූ

සියළුම වැරදි වලින් යම් කෙනෙකුට මේ සංසාරයට ණය ගනුදෙනුවකට බැඳෙනවා. රාගයෙන්, ද්වේශයෙන් මෝහයෙන් පංචස්කන්ධය උපාදානය කර ගත්තොත් ණය වෙනවා. අපේ ඉන්ද්‍රිය හය ආයතන වශයෙන් පාවිච්චි කරල මේවා නිච්චයි, සුඛයි, අත්ථයි කියල උපාදානය කරගත්තොත් අපි ණය වෙනවා. අත්ථයි කියන්නෙ මමත්වයෙන්, මමායනයෙන්, මඤ්ඤනාවයෙන්, අස්මිමානයෙන් මම යැයි මගේ යැයි අල්ලා ගැනිමයි.
මේ ණය සහ විනය බුදුහාමුදුරුවෝ විනය පිටකයේ සහ විභංගප්‍රකරණයේ බොහෝ තැන්වල දේශනා කරල තියෙනවා. මේක වැරදියට විග්‍රහ කලොත් ශ්‍රාවකයන්ට තේරුම් ගන්න බැරි විදියට ලියල දැක්වුවොත් මෙන්න මේ ණය, විනය වැරදි ලෙස ලෝකයාට දේශනා කිරීමෙන්, ලෝකයා වැරදි ලෙස තේරුම් ගත්තොත් මේ සංඝ භේදය වෙනව කියල බුදුහාමුදුරුවෝ පැහැදිලිව දේශනා කරල තියෙනවා.

එදා බුදුහාමුදුරුවන්ගෙ කාලයට වඩා පසු කාලීනව නොයෙකුත් ආකාරයට අටුවා, ටීකා, ටිප්පනි විශුද්ධි මාර්ගය ආදි පොත් පත් ලිවීමෙන් මේ සංඝ භේදය කර ගත්තා

අභාසිතං අලපිතං තථාගතෙන - භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති
භාසිතං ලපිතං තථාගතෙන - අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති

මෙහි ලපිතං කියන්නෙ අනුදැන වදාල, භාෂිතං කියන්නෙ දේශනා කර වදාල

බුදුහාමුදුරුවෝ දේශනා නොකල දේ සහ අනුදැන වදාල නැති දේවල් මෙන්න මේ ආකාරයයි කියල දේශනා කරනව නම් ඒක අභාසිතං අලපිතං තථාගතේන - භාසිතං ලපිතං කිරීම.

තථාගතයන් වහන්සේ දේශනා කරපු දේ විග්‍රහ කරපු දේ අනු දැන වදාල දේ තථාගතයන් වහන්සේ දේශනා කලේ නෑ කියල කියනව, ඒ වගේම බුදුහාමුදුරුවෝ දේශනා කරපු අනුදැන වදාල, යම් යම් දේවල් මේ ආකාරයෙන් නොවේ මෙන්න මෙහෙම වැරදියට කියල වැරදි දේ දේශනා කිරීම භාසිතං ලපිතං තථාගතෙන - අභාසිතං අලපිතං කිරීම හතරවෙනි



එක.

බුද්ධ භාෂිතය කියන්නෙ පරියාප්ති ධර්මය. ඒ පරියාප්ති ධර්මයට යම් යම් දේවල් එකතු කරල වෙන වෙන භාෂාවලට පරිවර්ථනය කරල වෙනත් අර්ථයක් දැක්වීම අභාසිතං අලපිතං කිරීමයි.
තථාගතයන් වහන්සේ දේශනා නොකරපු දේ විග්‍රහ නොකරපු දේ තථාගතයන් වහන්සේ දේශනා කලා කියල පරිවර්ථනය කිරීම හෝ දේශනා කිරීම සංඝ භේදයයි.

උදාහරණයක් විදියට අනිච්ච, දුක්ඛ, අනත්ථ" කියන තිලක්ඛණය බුද්ධ භාෂිතය ලපිතය සිංහල භාෂාවට පරිවර්ථනය කරල අනිත්‍යයි, දුකයි, අනාත්මයි, කියල යම් කිසි කෙනෙක් දේශනා කලොත් පොත පතක ලියල දැක්වුවොත් එය සංඝ භේදයක් වෙනව. බුදුහාමුදුරුවන්ගෙ දේශනාව මාගධී භාෂාවෙ තියෙන්නෙ අනිච්ච, දුක්ඛ, අනත්ත. අනික් පැත්තෙ තියෙන්නෙ නිච්ච, සුඛ, අත්ථ".

අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙනති
ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙනති

තථාගතයන් වහන්සේ දේශනා කරපු අරිය පර්යේෂණ සූත්‍රයේ පැහැදිලි කර දෙන පරිදි ආචික්ඛනා දේශනාව පඤ්ඤපනා, පට්ඨපනා විභජනා විවරනා උට්ඨාන කම්මන්තී වශයෙනුයි දේශනා කලේ ඒ කියන්නෙ නිවන් අවබෝධ කර ගැනිමට උපකාරවන ආකාරයටමයි දේශනා කලේ

නමුත් මේ ආචිණ්ණ දේශනාව අනාචිණ්ණ දේශනාවක් කරමින් දිව්‍ය ලෝකෙ යවන්න අපායෙන් බේරෙන්න මතු බුදුවන බුදුන් දැක නිවන් දකින්න එහෙම නැත්නම් ධ්‍යාන ලබල බ්‍රහ්ම ලෝකයට ගිහිල්ල බ්‍රහ්ම ජාල සූත්‍රයේ කියල තියෙන බ්‍රහ්ම දැලට අහුවෙන්න හා තවත් බෙහෝ අභිඤ්ඤා ලබන්න යම් කිසි කෙනෙක් මේ උතුම් ධර්මය දේශනා කරනව නම් එතනදි අර ආචිණ්ණ දේශනාව අනාචිණ්ණ දේශනාවක් වෙනව ඒ වගේම තථාගතයන් වහන්සේ දේශනා නොකරපු මේ අනාචිණ්ණ දේශනාවන් ආචිණ්ණ දේශනාවන් හැටියට දේශනා කිරීමත් සංඝභේදයට අහුවෙන වරදක්

හැටියට බුදුහාමුදුරුවෝ දේශනා කලා මේ ආචික්ඛනා දේශනාව බුදුහාමුදුරුවන්ගෙ වචන ඒ ආකාරයෙන්ම දේශනා නොකලොත් මේ මාගධී වචන වලට වැරදි ලෙසින් පද පරම සිංහල වචනයක් කිව්වොත් ඒක සංඝ භේදයට අහු වෙනව.

අපඤ්ඤතතං තථාගතෙන පඤ්ඤතතං තථාගතෙනාති දීපෙනති
පඤ්ඤතතං තථාගතෙන අපඤ්ඤතතං තථාගතෙනාති දීපෙනති

ඒ වගේම පඤ්ඤත්ති අපඤ්ඤත්ති හැටියට අපඤ්ඤත්ති පඤ්ඤත්ති හැටියට දේශනා කරනව නම් ඒ පුද්ගලයා සඞෙඝා භිනෙනා.
මේ ආකාරයට 10ක් විග්‍රහ කලා

තෙ ඉමෙහි දසහි වත්‍ථුහි අවකසසනති වවකසසනති ආවෙනිකමමානි කරොනති ආවෙනිකමමානි කරොනති කියන්නෙ වැරදි ආකාරයට මේ ධර්මය වැරදි පරිවර්ථනයකින් හෝ විග්‍රහයකින් හෝ විස්තරයෙකින් හෝ වැරදි ආකාරයට කියා මිනිසුන් නොමග යැවීමයි. මෙන්න මේකයි බුදුහාමුදුරුවෝ දේශනා කරල තියෙන්නෙ මෙහෙම එකක් දේශනා කරල නෑ.

මේ ආකාරයට අවකසසනති වවකසසනති, තව පුද්ගලයෙක්ව අපහසුවට, වැරදි පාරකට යොමු කරල සංසාරෙ අතරමං කරනව නම් ඒක සංඝෝ භින්නෝ.

අවකසසනති වවකසසනති ආවෙනිකමමානි කරොනති
ආවෙනි පාතිමොකඛං උද්දිසන්ති
එත්තාවතා ඛො ආනන්ද සඞෙඝා භිනෙනා හොතී ති

මෙන්න මේ කරුණු දහය හරි හැටි තේරුම් නොගෙන යම් කිසි කෙනෙක් මේ ආකාරයට වැරදි සේ ධර්මය අධර්මය කිරීම, විනය අවිනය කිරීම, බුදුහාමුදුරුවන්ගෙ බුද්ධ භාෂිතය ලපිතය අලපිතය අභාෂිතය අලපිතය කිරීම, බුදුහාමුදුරුවන්ගෙ ආචිණ්ණ දේශනාව ආනාචිණ්ණ දේශනාව සේ දේශනා කිරීම සංඝ භේද කර්මය කර ගැනීමයි. මේ පාප කර්මය බොහෝ කොටම පරිවර්ථකයන් අතින්ද සිදුවී ඇත.



බුදුහාමුදුරුවෝ පිරිනිවන් පාලා අවුරුදු 900කට විතර පස්සෙ ඔය විශුද්ධි මාර්ගය ඇතුළු පොත් 17ක් ලියල මේ ධර්මය භින්න කිරීම භේද කිරීම විනාශ කිරීම කරල පරාමාර්ථ ධර්මය වෙනස් කලා සම්මතයෙන් මේ වචන අරගෙන ක්‍රියාපද නාම පදයක් කර ගත්තා මේ මාගධී භාෂාවෙ යම් යම් වචන නාම පද හැටියටත් ක්‍රියා පද හැටියටත් දෙකටම පාවිච්චි කරල තියෙනව සංඝ කියන්නෙ නාම පදයක් වුනත් සංඝෝ සංඝං කියන්නෙ ක්‍රියා පද.

උදාහරණ හැටියට

බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි,
සංඝං සරණං ගච්ඡාමි

යන්න මාගධී භාෂාවෙන් තියෙන්නෙ
ගච්ඡාමි සරණං බුද්ධං,ගච්ඡාමි සරණං ධම්මං,
ගච්ඡාමි සරණං සංඝං.

මෙතන බුද්ධං, ධම්මං, සංඝං කියන්නෙ කිසිසේත්ම නාම පද තුනක් නෙවෙයි. ඒක ක්‍රියාවක්. ක්‍රියා පද තුනක්. අපි මේ තිසරණය කියල කියන්නෙ තමන්ගෙ හිතේ ඇති කර ගත යුතු පිරිසිදු බවට පත් කර ගත යුතු මගඵල ලබන්නට උපකාර වන ක්‍රියා කාරකම් තුනක්.

මේ රාග බව, ද්වේශ බව, මෝහ බව උදුරා දමන්න කරන කියන ක්‍රියාකාර කම් වලටයි බුද්ධං කිව්වෙ, එනම් බව උදුරා දමන්නට කරන ක්‍රියාකාරකම් වලටයි.

ඊළඟට ධම්මං කිව්වෙ සූත්‍රයට ධර්මයට බහා ගලපා බලා විනයට සසඳා බලා තමන්ගෙ සිතට එන අරමුණු වලින් අයහපත් දේ ඉවත් කිරීමත් යහපත් දේ භාවිතා කිරීමත් ගච්ඡාමි සරණං ධම්මං කියන්නෙ.

සංඝං කිව්වෙ මේ සංසාර සම්බන්ධතාවය මේ සමුදය ගසා බිඳල සිතෙන් අස්කරල දමන්නට උපකාරවන මාර්ග චරියාව පිළිබඳ විග්‍රහ කරපු

දෙයක්. ඒ නිසා මේ ගච්ඡාමි සරණං බුද්ධං, ගච්ඡාමි සරණං ධම්මං, ගච්ඡාමි සරණං සංඝං, කියන පේලි තුන අනික් පැත්ත ගැහැව්වම මේක නාම පද තුනක් වුනා. බුද්ධං කියන්නෙ අර පන්සලේ තියෙන බුදු පිලිමෙ. ධම්මං කියන්නෙ පුස්තකාලෙ හෝ බණ මඩුවෙ තියෙන ත්‍රිපිටක පොත් ටිකටයි. සංඝං කියන්නෙ පන්සලේ ඉන්න හාමුදුරුවන්ටයි. මේක වැරදියි.

මේ බුද්ධ, ධම්ම, සංඝ කියන වචන තුන නාම පද තුනක් හැටියට නෙවෙයි ත්‍රිපිටකයෙ විග්‍රහ කරල තියෙන්නෙ. ක්‍රියාපද තුනක් හැටියටයි. මේවා නාම පද තුනක් කර ගැනිම තමයි අපිට මේ සියළු වැරදීම් වලට හේතු වුනේ.

සංඝෝ භින්නෝ කියන්නෙ, මෙතන පුද්ගලයෙක් නෙවෙයි. හාමුදුරු නමක් නෙවෙයි සංඝෝ කියන්නෙ. මේ සංබන්ධතාවයක්, මේ සංසාර බන්ධනයක්, මේ බැඳුම් තුන ගහල බිඳල යම් කිසි පුද්ගලයෙක් සංඝෝ කියන තත්වයට පත් වෙනව. සංඝං කියන තත්වයට පත් වෙනව. ඒ නිසා පුද්ගලයෙකුට නෙවෙයි, බුදුහාමුදුරුවො මේ ධර්මය දේශනා කලේ. නිවන් දකින්නට උපකාරවන ධර්මයයි, භින්න කරන්නෙ භේද කරන්නෙ. ඒ කියන්නෙ ධර්මය වහල, ආවරණය කරල තව කෙනෙකුගේ නිවන් මග ආවරණය කරනව නම් ඒක අර කියන ආනන්තරික පාප කර්මයයි. සංඝ භේදය කිරීමක්.

ඊළඟට බුදුහාමුදුරුවන්ගෙ දේශනාව මාගධී භාෂාවෙ තියෙන්නෙ අනිච්ච, දුක්ඛ, අනත්ථ. අනික් පැත්තෙ තියෙන්නෙ නිච්ච, සුඛ, අත්ථ". මේ අනිච්ච, දුක්ඛ, අනත්ථ කියන වචන තුන දැන් පරිවර්තනය කරල තියෙනව අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියල. මේ **තිලක්ඛණය** කියන බුද්ධ භාෂිතය **ත්‍රිලක්ෂණය** යයි පරිවර්ථනය කරල තියෙනවා මේක ලකුණු තුනක් නොවෙයි. කපා දැමිය හැකි, ඛය කල හැකි ගති තුනක්. ඒ වගේම **ඛණ සම්පත්තිය, ක්ෂණ සම්පත්තිය** කියල පරිවර්ථනය කරල තියෙනවා. ඛණ කියන්නෙ කෙලෙස් කපා දැමිය හැකි යන්නයි.

ඒවගේම **භව, භවෝ, භවං** කියන එක භවය කියල පරිවර්ථනය කරල තියෙනව. **අස්ස, පස්ස** කියන එක ආශ්වාස ප්‍රශ්වාස යැයි වැරදි ලෙස



පරිවර්තනය කරල තියෙනවා. අස්පස් කරනව කියල අපි අද භාවිතා කරන වචනයක් තියෙනවා. එනම් අස්ස පස්ස කියන්නෙ, අවශ්‍ය දේ ඇතුලට ගැනීමත්, අනවශ්‍ය දේ ඉවත් කිරීම, ප්‍රහාණය කිරීම යන අදහසයි. එය මේ දොරවල් හයෙන්ම කල යුතු දෙයක්. සේවිතබ්බ අසේවිතබ්බ සුත්‍රයේ පැහැදිලිව මෙය විග්‍රහ කරල තියෙනව.

බුද්ධ භාෂිතයේ එන ද්වතානුස්සතිය, පසු කාලීනව දේවතානුස්සතිය, ලෙස වෙනස් කරල පරිවර්ථනය කරල තියෙනව. මේ ද්වතානුස්සතිය, ද්වතාවය, දෙපැත්ත බුද්ධ භාෂිතයේ සෑම තැනකම දේශනා කරල තියෙනව

**සුව, අසුව** ධර්මස්කන්ධය අසුභාරදහසක් ධර්මය ලෙස වැරදියට පරිවර්ථනය කරල තියෙනව.

නිබ්බිදා යන්න කල කිරීම ලෙස වැරදියට පරිවර්ථනය කරල තියෙනව. නිබ්බිදා යනු යමකට නොබැඳීමයි.

ඒ වගේම ධම්ම චක්ක පවත්තන සුත්‍රයේ දේශනා කරපු කාම සුඛල්ලිකානු යෝගෝ අත්තකිලමථානු යෝගෝ උභෝ අන්තෝ අනුපගම්ම මඣ්ඣිමා පටිපදා භගවතේන අභිසම්බුද්ධා" කියන බුද්ධ භාෂිතයේ **මඣ්ඣිමා පටිපදා** කියන එක මධ්‍යම ප්‍රතිපදාව, මැද මාවත හෝ මැදුම් පිලිවෙත කියල දේශනා කලොත් අර ආචින්න දේශනාව ආනාචින්න දේශනාවක් වුනා. එය සංඝ භේදයකට අහුවෙනව.

අර්ථ, ධර්ම, නිරුක්ති, පටිසංභිදා වශයෙන් විග්‍රහ කල යුතු මේ බුද්ධ භාෂිතය පද පරම ලෙස අර්ථ දක්වා පරිවර්ථනය කර විග්‍රහ කිරීම බහුලව සිදු වෙනවා. නමුත් මේ අය මේක ආනන්තරික පාප කර්මයක් වන බව දන්නෙ නැහැ. දැන කලත් නොදැන කලත් මේ වැරදි පරිවර්ථනයන් නිසා සංඝ භේදයක් වෙනව. ඒ නිසා ඒ අය කෙරෙහි අනුකම්පාවෙන් මේවා පෙන්වා දිය යුතුයි.

මේ බුදුහාමුදුරුවන්ගෙ ධර්මය සාතතං සවයඤ්ජනං කේවල පරිපුණ්ණං පරිශුදධං. අඩුගානෙ වචනයක් අකුරක් ඇලපිල්ලක්

කිසිකෙනෙකුට වෙනස් කරන්න පුළුවන් කමක් නෑ. වෙනස් කරන්න ඉඩක් තියල නෑ. නමුත් බොහෝ අය පස්සෙ කාලෙකදි මේ බුද්ධ භාෂිතයට අටුවා ටීකා ලියල, විශුද්ධි මාර්ගය ලියල, නොයෙකුත් ආකාරයෙන් මේ බුදු දහම වෙනස් කරල තියෙනව භාවනාවටත්, ශීලයටත්, ආර්ය අෂ්ඨාංගික මාර්ගයටත් සියළු දේටම මේක අදාලයි. මේක හොඳට තේරුම් ගන්න ඕන. මේ බුද්ධ භාෂිතය ලපිතය බුද්ධ දේශනාව, ආචික්ඛනා දේශනාව, තේරුමක් නැතිව, කාගෙන් හරි අහල දැන ගෙන පොතකින් බලාගෙන, අටුවා කාරයන්ගෙ පොත් පත් වලින් අරගෙන, මේ ධර්මය අධර්මය ලෙස දේශනා කිරීමෙන් සංඝභේදය කරගන්නව. සමහර අටුවා කාරයන්ගෙ හරි දේවල් තියෙනව. වැරදි අය වැඩියි.

විශේෂයෙන්ම බුද්ධශෛෂ්‍ය හාමුදුරුවන් බුදුහාමුදුරුවො දේශනා කරපු දස අනුස්සති, සම සතලිස් භාවනාවක් හැටියට විග්‍රහ කරල, අර බුද්ධ භාෂිතය ලපිතය, බුදුහාමුදුරුවො පනවා ගත් දේ, බුද්ධ ප්‍රඥප්තිය වෙනස් කලා.

මේ සංඝ භේද සූත්‍ර ත්‍රිපිටකයෙ ලියල තියෙනව, බොහෝ අය කියවනව, නමුත් මේකෙ අර්ථ, ධර්ම තේරුම් අරගෙන නැහැ. තව තවත් ඔය වැරදි වැඩේ කරල, ධර්මය අධර්මය කරල, ඔය ආචින්න දේශනාව අනාචින්න කරල, බුදුහාමුදුරුවන්ගෙ බුද්ධ භාෂිතය ලපිතය, අලපිතය අභාෂිතය කරල, මේ අනික් අයගෙ නිවන් මග වහන එක දැන්වත් නවත්වන්න ඕන. අපි සෑම කෙනෙක්ම, ධර්මය තේරුම් ගත් අය නියම නිවැරදි නිවන් මග පැහැදිලි කරල දෙන්න ඕන. විශේෂයෙන්ම ශිලය, සමාධිය, භාවනාව, ආර්ය අෂ්ඨාංගික මාර්ගය ආදී සියළු දේට අදාල වෙනව. සියළු දේටම කෙලින්ම සෘජුවම මේ ධර්මය, නිවැරදි දේ නිවැරදි ලෙසත් වැරදි දේ වැරදි ලෙසත් දැන ධර්ම මාර්ගය අනුගමනය කල යුතුයි. අත් හැරීමත් කල යුතුයි. ඒ නිසා මේ සූත්‍රය මතු කරල පෙන්නුවෙ බොහෝ දෙනෙක් මේ වැරදි තව තවත් කර ගෙන ආනන්තරීය පාප කර්මයක් කර ගන්න නිසා. ඊටත් වඩා විශාල පිරිසකගේ නිවන වැහීම බොහෝම බලවත් පාපයක් වන නිසයි.



බුදුහාමුදුරුවො අවුරුදු 45ක්ම පණවා වදාල ප්‍රඥප්ති තියෙනව. ඒවා උද්දේශ, නිද්දේශ, පටිනිද්දේශ කියල තිපරිවට්ටයකින් විග්‍රහ කරල තියෙනව. ඒවා සංදේශනාව, ද්වතාවය, තිපරිවට්ටය, චතුඅරිය සච්චය, පටිච්ච සමුප්පාද ධර්මයට අදාලව දේශනා කරල, කල යුතු දේ සහ නොකල යුතු දේ පැහැදිලිව පෙන්වා දි පණවා වදාල. නමුත් පසුකලකදි මේ ප්‍රඥප්ති, මහායානිකයො සහ තව නොයෙක් අය දේව ආගම් වලට, උපනිශද් ධර්මයට, ජෛන ආගම්වලට ගැලපෙන ආකාරයට වෙනස් කරලා තියෙනවා. මේවා සංඝභේදයට අහුවෙන බවක් නොදන්නා නිසා.

විශේෂයෙන්ම මේ ධර්මය දේශනා කරන අපේ පින්වත් ස්වාමීන් වහන්සේලාට, මේ කරගන්න පාපකර්ම වලින් මිදී නිදහස් වෙන්න, අපි මේක පැහැදිලි කරල, කියල දීල අනුකම්පාවෙන් ඒ අයත් මේ පාපයෙන් මුදවා ගන්න ඕන. ඒ සඳහා මිසක් මානයකින් තරහකින් වෛරයකින් කියන දෙයක් නෙවෙයි.

අංගුත්තර නිකායෙ දශක නිපාතයෙ සතතකකතතු පරම සූත්‍රවල කියල තියෙනව, සතතකකතතු පරම කියන පුද්ගලයෙක් අතින් මේ ආනන්තරික පාප කර්ම සිදුවෙන්නෙ නෑ, සිදුවෙන්න බෑ කියල. ඒ කියන්නෙ **ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී.** සතතකකතතුපරම කියන්නෙ, කෙත් හතක් පමණක් පසුකල යා යුතු පුද්ගලයා යන්නයි. එනම් සෝතාපත්ති ඵලයට පත්වූ පුද්ගලයෙක් තමා සතතකකතතු පරම තත්වයට පත් වෙන්නෙ.

තවද අප සියළුම දෙනාට සංසාර ණය ගනුදෙනුවෙන් මිදී නිදහස් වෙන්නට උපකාර වන්නා වූ කරුණු හතරක් උන්වහන්සේ පෙන්වා දෙන සේක. එම විග්‍රහය මෙසේ උපුටා දක්වමි.

ධම්මානු ධම්ම පටිපදාවේ හැසිරෙන ශීලයේ පිහිටා භාවනායෝගීව සිටින මග ඵල ලැබූ මග ඵල නොලැබූ සෑම කෙනෙකුටම මේ සංසාර ණය ගනුදෙනුවෙන් මිදී නිදහස් වෙන්නට උපකාර වන්නා වූ මූලික කරුණු 4 ක් සම්පූර්ණ කරගත යුතුව තිබෙනවා.

මේ කරුණු හතර සැම කෙනෙක්ම ජීවත් වන කාලය තුල මරණ මොහොත දක්වාම හැකි සැම අවස්ථාවකම, පුළුවන් නම් දෛනිකව කලයුතු දේවල් බව බොහොම අවධාරණයෙන් කියන්න ඕන. මේක සෑම කෙනෙකුටම නිවන් අවබෝධ කර ගැනීමට උපකාර වෙනවා.

## පලවෙනි පියවර

මේ සංසාර ගමනේ අනන්ත අප්‍රමාණ කාලයක් අපි මේ තල තිස් එකේ නොයෙකුත් තැන්වල ඉපදිල තියෙනව. ඒ ඉපදිලා තියෙන තැන්වලදි, අපි විසින් හිතෙන්, කයෙන්, වචනයෙන් නොයෙකුත් අයට දැන හෝ නොදැන හිංගි, හිංසා, අවැඩ, අසාධාරණ, අපවාද, උපවාද, අවලාද, අපහාස, ආදී වැරදි වැඩ කරල තියෙනව. දැන් ඒවට පසුතැවිල වික්ෂෝප වෙලා වැඩක් තියෙනවද නෑ. හැබැයි ඒවට කල හැකි ප්‍රති කර්ම තියෙනවා, උපකර්ම, උපක්‍රම තියෙනවා, සම්මප්ප්‍රයෝග තියෙනවා ඒවා කරන්නම ඕන. එතකොට ණයෙන් මිදී නිදහස් වෙනවා. මොකක්ද ප්‍රති කර්ම. මොකක්ද උප කර්ම. මොකක්ද සම්මප්ප්‍රයෝග. අපි දැන හෝ නොදැන කරල තියෙන වැරදි වලින් පීඩිත් වෙලා ඉන්න අයගෙන් සමාව ගන්න ඕන. අභිමුඛවත්, අනභිමුඛවත්. අභිමුඛව කරන්න බැරි දැනට ජීවත් වෙලා නැති අයත් ඉන්නවනේ. ඒවාට අපි කවදා හෝ ණය ගෙවන්න වෙනවා. මේ සියලු දේවල් වලට අපිට බුදුහාමුදුරුවො ක්‍රමයක් කියල දීලා තියෙනව. මේක කියන්න තමා අර කායේන වාචා චිත්තේන පමාදේන මයාකතං කියන ගාථාව කියන්නෙ. අනන්ත සසර පටන් මේ මොහොත දක්වා මගේ අතින් වූ යම් ප්‍රමාදයක් නිසා සිතින්, කයෙන්, වචනයෙන් (කායේන වාචා චිත්තේන) තුනෙන්ම අරිය මාර්ගයේ යන කෙනෙකුට, ආර්‍යයන් වහන්සේ කෙනෙකුට, විශේෂයෙන්ම බුදුහාමුදුරුවො දේශනා කරපු ශ්‍රී සද්ධර්මයට, දැන හෝ නොදැන ආර්යෝපවාදයක් කර ගෙන තියෙන්න පුළුවන්. ඒ වගේම මව් දෙමව්පියන්, වැඩිහිටියන්, ගුරුවරුන්, බාහිර ලෝකයාට ස්වභාව ධර්මයට, ගහ කොල වලට මේ හැම පින්වතෙක්ම දැන හෝ නොදැන තමන් අතින් යම් වරදක්, පාපයක්, හිංගියක්, හිංසාවක්, අවැඩක්, අසාධාරණයක්, සිදුවුවානම්, ඒ හැම දේටම මට කමාව ලැබේවා!! කමාව ලැබේවා!! කමාව



ලැබේවා!! මට කමා කරත්වා!! කමා කරත්වා!! කමා කරත්වා!! කියල තුන් සැරයක් මේ ආකාරයට කමා කරවා ගන්න. තවද අපි අද කරපු ආර්යෝපවාද වලින්, අද කරපු අවැඩ අසාධාරණ වලින් අපි අද අදම මිදී නිදහස් වෙන්න ඕන. එසේම මැවැනි වැරදි මින් මතුවට නොකරන බවටත් සපත වෙන්න ඕන. අද හවස නින්දට යාමට පෙර මේ සමාව ගන්න ඕන. එතකොට අපි කරපු වැරදි වලින් අපේ හිතේ තියෙන ද්වේශයෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් කොටසක් ප්‍රහාණය වෙලා කැඩිලා ඉවත් වෙලා යනවා. ඒ අනුව තමන් සංසාරෙ, දැන හෝ නොදැන කල බොහෝ වැරදි වලින් තමන්ට මිදී නිදහස් වෙන්න පුළුවන්. මේ සංසාරෙ තියෙන වැරදි ආකාර වු සම්බන්ධ වලින්, වැරදි ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වෙන්න මේක උපකාර වෙනවා. ඒක පලවෙනි පියවර.

## දෙවැනි පියවර

අපි මේ විශ්වය තුල අපිට උදව්, උපකාර කල මග පෙන්වූ පිහිටවූ බොහෝ අය ඉන්න පුළුවන්. මව් දෙමව්පියන්, වැඩිහිටියන්, ගුරුවරුන්, ඥාති මිත්‍රාදීන්, ශ්‍රමණ බ්‍රාහ්මණයන්, ඒ වගේම බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය මේ වගේ බොහෝ අය අපිට උදව් කරන්නට, උපකාර කරන්නට ඇති. ඒ අනුව අපි ණයයි. මේ ණයෙන් මිදී නිදහස් වෙන්න ක්‍රම දෙකක් තියෙනවා. එකක් තමා, අපි පරම මෛත්‍රියත්, අරිය මෛත්‍රියත් පතුරුවලා ඒ සියලු දෙනාට සම මෙත සමසේ පතුරුවලා අපේ හිතේ යම් ද්වේශයක්, වෛරයක්, ක්‍රෝධයක්, හිංගියක්, හිංසාවක්, අවැඩක්, අසාධාරණයක් තිබුණානම්, තවදුරටත් පවතිනවානම්, ඒ තමන්ගේ හිත පිරිසිදු කර ගැනීම. තමන්ගේ හිතේ වෛරය නැති කර ගන්න, නිච්ච වු වෛරය අනිච්ච බවට පත් කර ගන්න, සුඛ වු වෛරය දුක්ඛ අනුපස්සනා කරල, අත්ථවු වෛරය අනත්ථ කර ගන්න, අනිච්ච, දුක්ඛ, අනත්ථ මෙනෙහි කරල, මේ මෛත්‍රී භාවනාව කරල, මේ වෛරයෙන් තමන් මිදී නිදහස් වෙන්න ඕන. මේ සඳහා සුදුසු මෛත්‍රී කර්මස්ථානයක් වඩල තමන්ගෙ හිතේ මෙත් සිත හදා ගන්න ඕන. මම මගේ කියන එක අතහරින්න ඕන. මම නිදුක් වෙම්වා! මගේ අම්මා තාත්තා නිදුක් වෙත්වා! එහෙම ඒවා පරම මෛත්‍රියට

අයිති නැහැ. ඒවා බොහොම වැරදි ආත්ම වාදය මතු කරන වැරදි මෛත්‍රී භාවනා.

දෙවනුව මෛත්‍රී භාවනාවක් කරල, මෙත්තානුස්සතිය වඩල, පරම මෛත්‍රිය ආර්ය මෛත්‍රිය අප්‍රමාණ මෛත්‍රියක් පතුරුවල සුදු කිරණ ශක්තියක්, විශ්වයට පැතිරවිය යුතුයි. ඒකට සීමා මායිමක් නෑ. විශේෂයක් නෑ.

තුන් වෙනි පියවර

අපි අද මිනිහෙක් හැටියට ඉපදිලා තියෙනවා. මිනිහෙක් හැටියට ඉපදෙන්න බෑ පුබ්බේත කථ පුඤ්ඤතා ශක්තියක් නැත්නම්. මේ හැම කෙනෙකුටම ශ්‍රීපාද කන්දටත් වඩා විශාල පිං කන්දක් මේ ජීවිත කාලය තුල හෝ පෙර ජීවිත කාල තුල පුබ්බේත කථ පුඤ්ඤතා ශක්තියක් උරුම වෙලා තියෙනවා. මේ පින් අපි උපාදානය කර ගෙන පුඤ්ඤාභි සංඛාර හැටියට පවත්වගෙන ගියොත් අපේ නිවන ප්‍රමාද වෙනව. ඒ නිසා මේ පිං කන්ද අපි හැම දවසකම, පිං අවශ්‍ය අයට, පින් ගන්න පුළුවන් අයට, අනන්ත සංසාරයේ අපිට උදව් උපකාර කරල ණය තියෙන, දෙමව්පියන්, වැඩිහිටියන්, ගුරුවරුන්, ආදී කොට ඇත්තාවු බොහෝ, ඥාති මිත්‍රාදීන්ට, සබ්බේ දේවා, සබ්බේ භූතා, සබ්බේ සත්තා, සබ්බේ පේතා භවන්තු සුඛිතත්ථා කියලා පිං අනුමෝදන් කල යුතුයි. පින් කර ගන්නට බැරිව ඥාති ප්‍රේතයන් හැටියට පිං ලබා ගන්න පේවෙලා ඉන්න අයට අපි පින් දෙන්න ඕන. ඒ වගේම සෑම කෙනෙකුටම සමසේ පිං අනුමෝදන් කරන්න ඕන. පිං පවරන්න ඕන. පිං දෙන්න ඕන. පිං පතුරුවා පිහිටවන්න ඕන. ඒ අනුව අපිට පුළුවන් කම තියෙනව මේ ශ්‍රීපාද කන්ද තරම් උස පිං කන්ද අපේ සංසාර ණය ගෙවන්නට උපකාර කර ගන්නට. උදව් කර ගන්නට. ඒ අනුව අපේ හිත මුදිතා වෙනව. එහෙම නැත්නම් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා කියන තත්වයට පත් වෙනවා. ඒ අනුව හිතේ පැහැදීමක්, ප්‍රසාදයක්, පිරිසිදු වීමක්, අර කෙලෙස් උදුරා දමන්නට පහසු වෙන විදියට, අර කෙලෙස් මුල් ශුද්ධ පවිත්‍ර කර ගන්නට උදුරන්න පුළුවන්, කපන්න පුළුවන් තැනට පත් කරන්න, මේ පුණ්‍ය පාප පහීනස්ස කියන එක උපකාර වෙනව. මේ පුණ්‍ය ශක්තිය නිසා ඒ අයට යහපතක් වෙනවා. අපේ පිරිසිදු කිරණ ශක්තිය මතු වෙනවා.



කුසලස්ස උපසම්පදා වෙනවා. විනෙය්‍ය ලෝකේ අභිජ්ජා දෝමනස්සං වෙනවා.

හතර වෙනි පියවර

අපි දැන් මිනිසුන් හැටියට යම් හැකියාවක් තියෙන අය හැටියට, යම් කාය ශක්තියක්, වචනයේ ශක්තියක්, ක්‍රියාවේ ශක්තියක් ඒ වගේම යම් යම් භෞතික දේවල්, වස්තු සම්පත්, අපි සතුව තියෙනව. හැම කෙනෙක්ම ඒ සියලු දේවල්, වස්තු සම්පත් වලින් අපි කල යුතු, දිය යුතු, යම් යම් දේවල් තියෙනවා. විශේෂයෙන්ම ධම්ම දානං, ඒ වගේම ආහාර දානං, වස්තු දානං, පාන දානං, වස්ත්‍ර දාන, මෙහෙම නොයෙකුත් ආකාරයේ උදව් උපකාර කරන්න ඕන. කාටද? තවත් මිනිස්සුන්ට, දෙවියන්ට. කොහොමද? මේ ධර්ම මාර්ගයේ යන්න මේ යුතුකම් වගකීම් ඉෂ්ඨ කරන්න, මනුස්ස ගුණ ධර්ම කියාදෙන්න. ඒ සඳහා උපකාර වන යම් යම් ක්‍රියා මාර්ගයන් තියෙනවා. දාන දෙනවා, ආරණ්‍ය හදනවා, ඒ වගේ තවත් බොහෝ දේවල් වලින් දුක් විඳින මිනිස්සුන්ට බුදුහාමුදුරුවො දේශනා කරපු ධර්මය තේරුම් ගන්න පුළුවන් විදියට, මාර්ග චරියාව සම්පූර්ණ කර ගන්න පුළුවන් විදියට, භෞතික වශයෙන්, කායික වශයෙන්, ලෞකික වශයෙන්, කරන්න, කියන්න, හිතන්න පුළුවන් යහපත් දේවල්. ඒ සියලු යහපත් දේ තවත් කෙනෙකුට තවත් දෙව් මිනිස් කියන කොට්ඨාස දෙකට අපි විසින් ඉටු කල යුතු යුතුකම් වගකීම්. හේතුඵල ධර්මය කියා දීම වැනි දේ අපිට මිනිස්සු හැටියට කරන්න පුළුවන්. ඒ නිසා මේ අංගයන් හතර, විශේෂයෙන්ම අර කමාව ගැනීම, මෛත්‍රී කිරීම, පින් දීම, පින් පැවරීම, පින් අනුමෝදන් කිරීම, ඒ වගේම කායික හා භෞතික වශයෙන්, ලෞකික වශයෙන් අපිට අද ලැබිල තියෙන මේ ශක්තීන් අනුව වචනය, ක්‍රියාව, කථාව, දේපල සම්පත් උපයෝගී කරගෙන අපි කල යුතු සෑම දෙයක්ම යහපත් චේතනාවක් ඇතිව අනික් මිනිසුන් වෙනුවෙන් කල යුතුයි. කල හැකියි. ඒ නිසා මේ කරුනු හතර අද පටන් හැම පිංවතෙක් විසින්ම කරන්න ඕන. මේ කරුනු හතර නිවැරදිව දෛනිකව දවස් හතක්, අටක්, දහයක් කරන කොට තමන්ටම තේරෙයි මේ සංසාර ගමනේ තමන් බැඳුනු බැම් වලින් 50% කටත් වඩා මේ ආකාරයෙන් මිදී නිදහස් වෙන්න

පුළුවන් කියන එක. ඒ නිසා වික්ෂෝප වෙන්නෙ නෑ. කම්පනයට පත් වෙන්නෙ නෑ. ඒ අනුව හිතේ තැන්පත් වීමක්, සහනයක්, ශක්තියක් තමන්ටම ලැබෙනවා. ඒ අනුව මේ මාර්ග චරියාව මේ ප්‍රතිපදාව නිවැරදිව කර ගෙන යන්න අවශ්‍ය බුද්ධ ශක්තියත්, ධර්ම ශක්තියත් ලැබෙනව. ඒ අනුවයි මේ මාර්ග චරියාව පූර්ණ වෙන්නෙ.

මෙලෙසින් වර්ථමානයේ අප සතු නිවන් මගේ තතු ඔබ සැමට හෙළි කර දීමට මා ගත් උත්සාහය සාර්ථක වේවා! ඔබ සැම දෙනාටම යහපතක් සෙතක් ශාන්තියක්ම වේවා!